# එක්සත් ජාතීන්ගේ පවුල

(එක්සත් ජාතීන් පිළිබඳ මූලික තතු)

**THE UNITED NATIONS FAMILY (SINHALA)**



එක්සත් ජාතීන්ගේ ප්‍රවෘත්ති කේන්ද්‍රය
කොළඹ

"එක්සත් ජාතීන්ගේ පවුල" නිව්යෝක් නුවර එක්සත් ජාතීන්ගේ
පොදු තොරතුරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශිත
**Basic Facts About the United Nations**
(ISBN : 92-1-100850-6) ග්‍රන්ථයේ
පළමුවැනි පරිච්ඡේදයේ
පරිවර්තනයකි.

කොළඹ, එක්සත් ජාතීන්ගේ ප්‍රවෘත්ති කේන්ද්‍රය
විසින් ප්‍රකාශයට පත් කෙරිණ.

එක්සත් ජාතීන්ගේ පරිස්‍රය
202-204 බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.



2-CM 4360

පළමුවැනි මුද්‍රණය – 2002 දෙසැම්බර්
දෙවැනි මුද්‍රණය – 2004 ඔක්තෝබර්

(නොමිලයේ බෙදා හැරීම සඳහා පමණි)

සීඑම් 4360–5,000(2004/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

# පටුන

*පිටු අංකය*


එක්සත් ජාතීන්ගේ සංවිධානය ........ 01

එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය ........ 02

පරමාර්ථ සහ මූලධර්ම ........ 03

සාමාජිකත්වය ........ 04

නිල භාෂා ........ 04

සංවිධාන ව්‍යුහය ........ 04

මහා මණ්ඩලය (මහා මන්ත්‍රණ සභාව) ........ 05

ආරක්ෂක මණ්ඩලය ........ 07

ආර්ථික හා සාමාජයීය මණ්ඩලය ........ 10

භාරකාරත්ව මණ්ඩලය ........ 12

අන්තර්ජාතික අධිකරණය ........ 13

ලේකම් කාර්යාලය ........ 14

මහ ලේකම් ........ 15

එක්සත් ජාතීන්ගේ අයවැය ........ 19

එක්සත් ජාතීන්ගේ සංවිධාන පවුල ........ 21

එක්සත් ජාතීන්ගේ ලේකම් කාර්යාලය ........ 22

එක්සත් ජාතීන්ගේ විනිශ්චය සභා ........ 34

එක්සත් ජාතීන්ගේ වැඩසටහන් සහ වෙනත් මණ්ඩල ........ 35

විශේෂිත ආයතන හා සෙසු සංවිධාන ........ 59

# එක්සත් ජාතීන්ගේ සංවිධානය

එක්සත් ජනපද ජනාධිපති ෆ්‍රෑන්ක්ලින් ඩී රූසවෙල්ට් යෝජනා කළ ''එක්සත් ජාතීන්'' යන නාමය, අක්ෂ පක්ෂ බලවතුනට එරෙහිව අඛණ්ඩව සටන් කරන බවට ප්‍රතිඥා දෙමින් ජාතීන් 26ක නියෝජිතයන් දෙවැනි ලෝක යුද්ධ සමයේ, 1942 ජනවාරි 01 වැනිදා කළ ''එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනයෙහි'' මුල්වරට භාවිත කරනු ලැබී ය.

ලොව ප්‍රථමයෙන් බිහි වූ අන්තර්ජාතික සංවිධානවල අරමුණ වූයේ විශේෂිත ක්ෂේත්‍රවල සහයෝගිතාව ගොඩනැගීමය. වත්මන් අන්තර්ජාතික විදුලි සංදේශ සේවා සංගමය, අන්තර්ජාතික ටෙලිග්‍රාෆ් සංගමය නමින් 1865 දී ස්ථාපනය කෙරුණු අතර විශ්ව තැපැල් සංගමය 1874 දී ස්ථාපනය කරනු ලැබීය. මේ දෙකම දැන් එක්සත් ජාතීන්ගේ විශේෂිත ආයතන වෙති.

අර්බුද සාමකාමී ලෙස සමථයකට පත් කිරීම, යුද්ධ වළක්වාලීම සහ සංග්‍රාම නීති සංග්‍රහකරණය සඳහාවන විධික්‍රම විස්තරකොට දැක්වීම පිණිස ප්‍රථම අන්තර්ජාතික සාම සමුළුව 1899 දී හේග් නගරයේ පවත්වන ලදී. අන්තර්ජාතික ආරවුල් සාමකාමී ලෙස සමථයකට පත් කිරීම පිළිබඳ සම්මුතිය සම්මත කොටගත් එය 1902 දී ක්‍රියාත්මක වූ ස්ථාවර බේරුම් කිරීමේ උසාවිය ස්ථාපනය කෙළේ ය.

එක්සත් ජාතීන්ගේ පෙර ගමන්කරු වූයේ ජාතීන්ගේ සංගමය යි. ප්‍රථම ලෝක සංග්‍රාම අවධියේ සමාන තත්ත්වයන් යටතේ පිළිසිඳ ගන්නා ලදුව ''අන්තර්ජාතික සහයෝගිතාව ප්‍රවර්ධනය සහ සාමය හා ආරක්ෂාව සාක්ෂාත් කර ගැනීම පිණිස'' වර්සේල්ස් ගිවිසුම යටතේ 1919 දී එය පිහිටුවනු ලැබීය. සංගමයට අනුබද්ධව අන්තර්ජාතික කම්කරු සංවිධානය ස්ථාපනය කෙරිණ. දෙවැනි ලෝක යුද්ධය වළක්වාලීමට අසමත්වීමෙන් පසු ජාතීන්ගේ සංගමය සිය ක්‍රියාකාරිත්වය අවසන් කෙළේ ය.

එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය සම්පාදනය කරනු වස් රටවල් 50ක නියෝජිතයෝ 1945 සැන් ෆ්‍රැන්සිස්කෝ හි පැවැති ''අන්තර්ජාතික සංවිධානය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුවේ'' දී හමුවූහ. 1944 අගෝස්තු-ඔක්තෝබර් කාලයේ එක්සත් ජනපදයේ ඩම්බාටන් ඕක්ස් හි දී චීනය, සෝවියට් දේශය, එක්සත් රාජධානිය, එක්සත් ජනපදය යන රටවල නියෝජිතයන් විසින් සකසන ලද යෝජනා පදනම් කොටගෙන ඔව්හු සාකච්ඡා කළහ. රටවල් 50ක නියෝජිතයෝ 1945 ජූනි 26 වැනි දා ප්‍රඥප්තියට අත්සන් තැබූහ. සමුළුවට සහභාගි නොවූ පෝලන්තය පසුව ඊට අත්සන් තැබීමෙන් ආරම්භක සාමාජික රාජ්‍යයන් 51 අතරට එක් විය.

චීනය, සෝවියට් දේශය, එක්සත් රාජධානිය, එක්සත් ජනපදය සහ සෙසු අත්සන්කරුවන් ගෙන් බහුතරය 1945 ඔක්තෝබර් 24 වැනි දා ප්‍රඥප්තිය සනාථ කළ විට එක්සත් ජාතීන් නිල වශයෙන් උපත ලැබී ය. සෑම වසරකම ඔක්තෝබර් මස 24 වැනි දින එක්සත් ජාතීන්ගේ දිනය සමරනු ලැබේ.

# එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය

සාමාජික රාජ්‍යයන්ගේ අයිතිවාසිකම් හා වගකීම් නිශ්චය කරන්නාවූත් එක්සත් ජාතීන්ගේ අවයව හා ක්‍රියාපටිපාටීන් ස්ථාපනය කරන්නාවූත් ප්‍රඥප්තිය සංවිධානයේ ව්‍යවස්ථාමය ලේඛනය යි. අන්තර්ජාතික ගිවිසුමක් වන ප්‍රඥප්තිය රාජ්‍යයන්ගේ ස්වෛරී සමානාත්මතාවෙන් පටන් ගෙන අන්තර්ජාතික සබඳතාවලදී බලය යෙදවීම තහනම් කිරීම දක්වා විහිදෙන අන්තර්ජාතික සබඳතා පිළිබඳ ප්‍රධාන මූලධර්ම සංග්‍රහ කරයි.

### *ප්‍රඥප්තියේ පූර්විකාව*

එක්සත් ජාතීන් බිහි කිරීම උදෙසා සිය ආණ්ඩු මගින් එකට එක් වූ සියලු ජනතාවන්ගේ අභිලාෂයන් සහ පොදු අරමුණු ප්‍රඥප්තියේ පූර්විකාවෙන් ප්‍රකාශිත ය.

**"එක්සත් ජාතීන්ගේ ජනතාවන් වන අපි -**

අපගේ ජීවිත කාල පරිච්ඡේදය තුළ දෙවරක් මුළු මහත් මනුෂ්‍ය සංහතියටම අප්‍රමාණ දුක් වේදනා ළඟා කළ යුද්ධෝපද්‍රවයෙන් අනාගත පරම්පරාවන් මුදවාලීමට ද,

මූලික මිනිස් අයිතිවාසිකම් කෙරෙහිත්, මනුෂ්‍යාත්මභාවයේ ගරුත්වය හා වටිනාකම කෙරෙහිත්, ස්ත්‍රී පුරුෂ සියලු දෙනා ගේ හා ලොකු කුඩා සියලු ජාතීන්ගේ සමාන අයිතිවාසිකම් කෙරෙහිත්, විශ්වාසය නැවත තහවුරු කිරීමට ද,

යථෝක්ත පරමාර්ථ සාධනය අරභයා, ඉවසීමෙන් යුක්තව හොඳ අසල්වැසියන් ලෙස අන්‍යෝන්‍ය සමඟියෙන් එකට ජීවත්වීමටත්,

ජාත්‍යන්තර සාමයත් ආරක්ෂාවත් සලසා ගැනීමට අපේ ශක්තිය ඒකයෝගී කිරීමටත්,

ප්‍රතිපත්ති පිළිගැනීමෙන් හා සම්ප්‍රදායයන් පිහිටුවීමෙන් පොදු ශුභසිද්ධිය උදෙසා කටයුතු කිරීමට මිස අන් කිසිම කරුණක් සඳහා යුද්ධ බලය පාවිච්චි නොකිරීමටත්,

සියලුම ජනතාවන්ගේ ආර්ථික හා සාමාජයීය ප්‍රගතිය උච්චස්ථානයට පමුණුවාලීම සඳහා ජාත්‍යන්තර කාර්‍ය්‍ය පටිපාටියක් ඇති කිරීමටත්,

ඒ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අපේ ප්‍රයත්නයන් සම්බන්ධ කරලීමට අධිෂ්ඨාන කර ගනිමු. මේ තීරණ අනුව සැන් ප්‍රැන්සිස්කෝ නගරයට එක් රැස් වූ නියෝජිතයන්ගේ මාර්ගයෙන් ස්වකීය සම්පූර්ණ බලතල යථා ස්වරූපයෙන් විදහා දැක් වූ අපේ ඒ ඒ ආණ්ඩු එක්සත් ජාතීන්ගේ මේ ප්‍රඥප්තියට එකඟවූයෙන් එක්සත් ජාතීන් නමින් හැඳින්වෙන ජාත්‍යන්තර සංවිධානයක් මෙසේ පිහිටුවා ගනිමු.''

## පරමාර්ථ සහ මූලධර්ම

ප්‍රඥප්තියේ සඳහන්කොට ඇති පරිදි එක්සත් ජාතීන්ගේ පරමාර්ථ මෙසේ ය.

* අන්තර්ජාතික සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීම.

* ජනතාවන්ගේ ස්වයං තීරණය සහ සමාන අයිතිවාසිකම් පිළිබඳ මූලධර්මයට ගරු කිරීම මත පදනම්ව ජාතීන් අතර මිත්‍ර සම්බන්ධතා සංවර්ධනය ;

---

### එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට කළ සංශෝධන

මහා මණ්ඩල සාමාජිකයන් තුනෙන් දෙකක ඡන්දයෙන් සහ ආරක්ෂක මණ්ඩලයේ නිත්‍ය සාමාජිකයන් පස් දෙනා ඇතුළු එක්සත් ජාතීන්ගේ සාමාජිකයන්ගේ තුනෙන් දෙකක අනුමැතිය ඇතිව ප්‍රඥප්තිය සංශෝධනය කළ හැකි ය. මේ දක්වා වගන්ති 4ක් (එකක් දෙවරක්) සංශෝධනය කර ඇත.

* 1965 දී ආරක්ෂක මණ්ඩල සාමාජිකත්වය 11 සිට 15 දක්වාත් (23 වැනි වගන්තිය) තීරණයක් ගැනීම සඳහා අවශ්‍ය ඡන්ද සංඛ්‍යාව 7 සිට 9 දක්වාත් ක්‍රියා පටිපාටිය හැර අන් සියලු කරුණු සඳහා අවශ්‍ය ඡන්ද සංඛ්‍යාව නිත්‍ය සාමාජිකයන් 5 දෙනාගේ පක්ෂ ඡන්දය ඇතුළුව 7 සිට 9 දක්වාත් වැඩි කරනු ලැබී ය. (27 වැනි වගන්තිය).

* ආර්ථික හා සාමාජයීය මණ්ඩල සාමාජිකත්වය 1965 දී 18 සිට 27 දක්වාත්, 1973 දී, 54 දක්වාත් වැඩි කෙරිණ. (61 වැනි වගන්තිය)

* ප්‍රඥප්ති සමාලෝචනය පිණිස මහ සමුළුවක් කැඳවීමට අවශ්‍ය ආරක්ෂක මණ්ඩල ඡන්ද සංඛ්‍යාව 1968 දී 7 සිට 9 දක්වා ඉහළ දමන ලදී. (109 වැනි වගන්තිය)

---

* අන්තර්ජාතික ආර්ථික, සාමාජයීය සංස්කෘතික සහ මානුෂවාදී ගැටලු නිරාකරණය සහ මානව අයිතිවාසිකම් හා නන් වැදෑරුම් මූලික නිදහස ප්‍රවර්ධනය පිණිස සහයෝගයෙන් ක්‍රියා කිරීම ;

* මෙකී පොදු අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා ජාතීන් ගන්නා ක්‍රියාමාර්ග ඒකරාශී කරන කේන්ද්‍රස්ථානයක් ලෙස ක්‍රියා කිරීම.

එක්සත් ජාතීන් පහත සඳහන් මූලධර්මවලට අනුකූලව ක්‍රියා කරන්නේ ය :

* තම සියලු සාමාජිකයන්ගේ ස්වෛරී සමානාත්මතාව මත පදනම් වීම ;

* සියලු සාමාජිකයන් මනා කැපවීමෙන් යුතුව සිය ප්‍රඥප්ති වගකීම් ඉටුකළ යුත්තේ ය ;

* ඔව්හු තමන් අතර අන්තර්ජාතික ආරවුල්, අන්තර්ජාතික සාමය සහ ආරක්‍ෂාව සහ යුක්ති ධර්මය අන්තරායට හෙලන්නේ නැතිව සාමකාමී මාර්ගවලින් සමථයට පත්කොට ගත යුත්තාහ ;

* අන් කවර රාජ්‍යයකට හෝ එරෙහිව බලය යෙදවීමෙන් හෝ බලය යොදන බවට තර්ජනය කිරීමෙන් ඔව්හු වැළකිය යුත්තෝ ය ;

* එක්සත් ජාතීන් ප්‍රඥප්තිය ප්‍රකාර සිදු කරන්නා වූ ඕනෑම ක්‍රියාවකට ඔවුහු සෑම සහයෝගයක්ම දිය යුත්තෝ ය ;

* කවර හෝ රාජ්‍යයක නෛතික බලවපසරියට අවශ්‍යයෙන්ම ඇතුළත්වන්නා වූ කරුණුවලට මැදිහත්වීමට ප්‍රඥප්තියෙහි ඇතුළත් කිසිවකින් එක්සත් ජාතීනට අවසරයක් නොලැබේ.

## සාමාජිකත්වය

එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියෙන් පැවරෙන වගකීම් පිළිගන්නා වූ ද එකී වගකීම් අනුව ක්‍රියා කිරීමට කැමැති හා සමත්වන්නා වූ ද සියලු සාමකාමී ජාතීනට එක්සත් ජාතීන්ගේ සාමාජිකත්වය විවෘතව පවතී. (සාමාජික රටවල නාමලේඛනය සඳහා 69 පිටුව බලන්න.)

මහා මණ්ඩලය ආරක්‍ෂක මණ්ඩලයේ නිර්දේශය මත නව සාමාජික රාජ්‍යයන් ඇතුළත් කර ගනී. ප්‍රඥප්තියේ එන මූලධර්ම උල්ලංඝනය කිරීම නිසා සාමාජිකත්වය අත්හිටුවීමට හෝ අදාළ රට නෙරපා දැමීමට හෝ ප්‍රඥප්තියෙන් බලය ලැබී ඇත ද මෙතෙක් කිසිවිටෙක එවැනි පියවරක් ගෙන නැත.

## නිලභාෂා

ප්‍රඥප්තියෙන් පිළිගෙන ඇති පරිදි චීන, ඉංග්‍රීසි, ප්‍රංශ, රුසියානු සහ ස්පාඤ්ඤ භාෂා එක්සත් ජාතීන්ගේ නිල භාෂාවෝ වෙති. මහා මණ්ඩලයේ, ආරක්ෂක මණ්ඩලයේ සහ ආර්ථික සහ සමාජයීය මණ්ඩලයේ නිල භාෂාවක් ලෙස අරාබි බස ද එක් කරනු ලැබී ය.

## සංවිධාන ව්‍යුහය

එක්සත් ජාතීන්ගේ ප්‍රධාන ආයතන 6ක් ප්‍රඥප්තියෙන් ස්ථාපනය කෙරිණ. මහා මණ්ඩලය (මහා මන්ත්‍රණ සභාව), ආරක්ෂක මණ්ඩලය, ආර්ථික හා සාමාජයීය මණ්ඩලය, භාරකාරත්ව මණ්ඩලය, අන්තර්ජාතික අධිකරණය සහ ලේකම් කාර්යාලය වශයෙනි. නියෝජිත ආයතන 15කින් සහ වැඩසටහන් සහ මණ්ඩල ගණනාවකින් සැදුම්ලත් එක්සත් ජාතීන්ගේ පවුල මීට බොහෝ සෙයින් විශාල වූවකි.

# මහා මණ්ඩලය (මහා මන්ත්‍රණ සභාව)

මහා මණ්ඩලය ප්‍රධාන සාකච්ඡා මණ්ඩපයයි. සියලු සාමාජික රටවල නියෝජිතයන් එක් වීමෙන් එය නිර්මාණය වී තිබේ. සාමය හා ආරක්ෂාව, නව සාමාජිකයන් ඇතුළත් කර ගැනීම සහ අයවැය වැනි වැදගත් විෂයයනට අදාළ තීරණ තුනෙන් දෙකේ වැඩි ඡන්දයෙන් සම්මත කළ යුතු වෙයි. සෙසු කරුණු තීරණය සාමාන්‍ය වැඩි ඡන්දයෙනි.

**කාර්යයන් සහ බලතල**

ප්‍රඥප්තිය ප්‍රකාර මහා මණ්ඩලය සතු කාර්යයන් සහ බලතල මෙසේ ය :

* නිරායුධකරණය සහ අවි පාලනය පිළිබඳ ප්‍රතිපත්ති ඇතුලුව අන්තර්ජාතික සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීම අරමුණු කොටගත් සහයෝගිතාව පිළිබඳ මූලධර්ම විමර්ශනය කොට නිර්දේශ කිරීම ;

* අන්තර්ජාතික සාමයට හා ආරක්‍ෂාවට අදාළ ඕනෑම ප්‍රශ්නයක් සාකච්ඡා කිරීම සහ යම් ආරවුලක් හෝ තත්ත්වයක් ආරක්‍ෂක මණ්ඩලයේ සාකච්ඡාවට ලක්වන අවස්ථාවල දී හැර ඒ පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම ;

* ප්‍රඥප්තියේ විෂය සීමාවට ගැනෙන හෝ එක්සත් ජාතීන්ගේ කවර හෝ ආයතනයක බලතලවලට සහ කාර්යයන්ට බලපාන්නා වූ ඕනෑම ප්‍රශ්නයක් ගැන, ඉහත කොන්දේසි යටතේ, සාකච්ඡා කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම;

* අන්තර්ජාතික දේශපාලන සහයෝගිතාව, අන්තර්ජාතික නීතිය සංවර්ධනය සහ සංග්‍රහකරණය, සියලු දෙනා සඳහා මානව අයිතිවාසිකම් සහ මූලික නන් වැදෑරුම් නිදහස සාක්ෂාත් කර ගැනීම සහ ආර්ථික, සාමාජයීය, සංස්කෘතික, අධ්‍යාපනික හා සෞඛ්‍ය ක්ෂේත්‍රවල අන්තර්ජාතික සහභාගි ක්‍රියාකාරිත්වය ප්‍රවර්ධනය උදෙසා අධ්‍යයන ආරම්භ කිරීම සහ නිර්දේශ කිරීම ;

* ජාතීන් අතර මිත්‍රශීලී සම්බන්ධතා අඩාල කිරීමට හේතුවිය හැකි ඕනෑම තත්ත්වයක්, එහි සම්භවය නොසලකා සාමකාමී ලෙස නිරාකරණය පිණිස නිර්දේශ ඉදිරිපත් කිරීම ;

* ආරක්‍ෂක මණ්ඩලයෙන් සහ එක්සත් ජාතීන්ගේ සෙසු ආයතන වෙතින් වාර්තා ලබා ගැනීම සහ සලකා බැලීම ;

* එක්සත් ජාතීන්ගේ අයවැය සලකා බලා අනුමත කිරීම සහ ගෙවිය යුතු දායක මුදල් ප්‍රමාණය සාමාජිකයන් අතර බෙදා වෙන් කිරීම.

* ආරක්ෂක මණ්ඩලයේ ස්ථාවර නොවන සාමාජිකයන් සහ ආර්ථික හා සාමාජයීය මණ්ඩලයේ සාමාජිකයන් තෝරා ගැනීම හා භාරකාරත්ව මණ්ඩලයට තෝරාගත් සාමාජිකයන් පත් කිරීම, ආරක්ෂක මණ්ඩලය සමඟ එක්ව අන්තර්ජාතික අධිකරණයට විනිශ්චයකරුවන් තෝරා පත් කිරීම සහ ආරක්ෂක මණ්ඩලයේ නිර්දේශය මත මහ ලේකම්වරයා පත් කිරීම.

ආක්‍රමණකාරී ක්‍රියාවක් නිසා සාමය බිඳ වැටීමක් හෝ සාමයට තර්ජනයක් හෝ උද්ගත වූ අවස්ථාවක ස්ථාවර සාමාජිකයන් අතර ඒකමතික බවක් නොවීම නිසා නිසි පියවරක් ගැනීමට ආරක්ෂක මණ්ඩලයට නොහැකි වුවහොත් මහා මණ්ඩලය 1950 නොවැම්බරයේ දී සම්මත කළ "සාමය උදෙසා එක්සත්වීම" යන යෝජනාව යටතේ අවශ්‍ය පියවර ගැනීමට මහා මණ්ඩලයට පිළිවන. සාමය බිඳ වැටීමක දී හෝ ආක්‍රමණයක දී හෝ අන්තර්ජාතික සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීම හෝ තහවුරු කිරීම සඳහා අවශ්‍ය වූ විටෙක සන්නද්ධ බලය යෙදවීම ඇතුළු සාමූහික ක්‍රියා මාර්ග සඳහා සාමාජිකයන්ට නිර්දේශ කිරීමේ අරමුණ ඇතිව ප්‍රශ්නය වහාම සලකා බැලීමට මහා මණ්ඩලයට බලතල තිබේ.

**සැසිවාර**

මහා මණ්ඩලයේ නිත්‍ය සැසිවාරය සාමාන්‍යයෙන් සෑම වසරකම සැප්තැම්බර් මාසයේ දී ඇරඹේ. නිදසුනක් ලෙස 2004-2005 සැසිවාරය මහා මණ්ඩලයේ 519 වැනි නිත්‍ය සැසිවාරය යි. සෑම නිත්‍ය සැසියක් ආරම්භයේ දී මහා මණ්ඩලය නව සභාපතිවරයකු, උප සභාපතිවරුන් 21 දෙනකු සහ මණ්ඩලයේ ප්‍රධාන කමිටු 6 සඳහා සභාපතිවරුන් තෝරාගනී. සාධාරණ භූගෝලීය නියෝජනයක් සහතික කරනුවස් මහා මණ්ඩල සභාපති ධුරය අප්‍රිකානු, ආසියානු, නැගෙනහිර යුරෝපීය, ලතින් ඇමෙරිකානු, බටහිර යුරෝපීය යන ප්‍රධාන කණ්ඩායම් 5 අතර එක් එක් වර්ෂයේ දී මාරු වී යයි.

නිත්‍ය සැසිවාරයට අමතරව ආරක්ෂක මණ්ඩලයේ සාමාජික රාජ්‍යයන් බහුතරයකගේ හෝ බහුතරයේ කැමැත්ත ඇතිව තනි සාමාජිකයකුගේ ඉල්ලීම අනුව විශේෂ සැසිවාර සඳහා රැස්වීමට මහා මණ්ඩලයට පිළිවන. ආරක්ෂක මණ්ඩලයේ කුමන හෝ සාමාජිකයන් 9 දෙනකුගේ හෝ සාමාජිකයන් බහුතරයේ හෝ බහුතරයේ කැමැත්ත ඇතිව තනි සාමාජිකයකුගේ හෝ ඉල්ලීමකින් පැය 24ක් ඇතුළත හදිසි සැසිවාරයක් කැඳවිය හැකි ය.

මහා මණ්ඩලයේ සෑම නිත්‍ය සැසිවාරයකම ආරම්භයේ දී බොහෝවිට රාජ්‍ය හෝ ආණ්ඩු නායකයන් සහභාගිවන, අතිශය වැදගත් අන්තර්ජාතික ගැටලු අරභයා සාමාජික රටවල් සිය අදහස් දක්වන විවාදයක් පැවැත්වෙයි. අනතුරුව බොහෝ ගැටලු ප්‍රධාන කමිටු 6ක දී සාකච්ඡාවට ලක් කෙරෙයි.

* පළමුවැනි කමිටුව (නිරායුධකරණය සහ අන්තර්ජාතික ආරක්ෂාව)
* දෙවැනි කමිටුව (ආර්ථික හා මූල්‍ය)

* තුන්වැනි කමිටුව (සාමාජයීය මානුෂවාදී සහ සංස්කෘතික)
* හතරවැනි කමිටුව (විශේෂ දේශපාලන සහ නිර් යටත්විජිතකරණය)
* පස්වැනි කමිටුව (පරිපාලන සහ අයවැය)
* හයවැනි කමිටුව (නෛතික)

ඇතැම් ගැටලු ප්‍රධාන කමිටුවලින් එකක දී නොව පූර්ණ සභා රැස්වීම්වල දී පමණක් සලකා බැලෙයි. සියලුම ප්‍රශ්න කමිටු විසින් සමාලෝචනය කොට යෝජනා කෙටුම්පත් මහා මණ්ඩල පූර්ණ සැසිවාරයට ඉදිරිපත් කරනු ලැබීමෙන් පසුව සාමාන්‍යයෙන් නිත්‍ය සැසිවාරය අවසන් භාගයේ දී පැවැත්වෙන පූර්ණ සභා රැස්වීම්වල දී ඒ පිළිබඳව ඡන්දය විමසනු ලැබේ.

කමිටුවල දී යෝජනා සම්මත කෙරෙන්නේ සාමාන්‍ය වැඩි ඡන්දයෙනි. පූර්ණ සභා රැස්වීම්වල දී විරෝධයක් නැත්නම් ඡන්ද විමසීමෙන් තොරව පොදු එකඟත්වයෙන් සම්මත කර ගැනීමට පිළිවන. නැතහොත් නම් අඬගැසීමෙන් ඡන්දය සටහන් කළ හැකි ය.

මහා මණ්ඩලයේ තීරණ පිළිගැනීමට ආණ්ඩුවලට නීතිමය බලකිරීමක් නැත. එහෙත් මේ යෝජනා ලෝක ජනමතය හුවා දක්වන අතර ලෝක ප්‍රජාවගේ සදාචාරමය අධිකාරිය පිළිඹිබු කරයි.

වසරක් තුළ එක්සත් ජාතීන් ඉටු කරන වැඩ කොටස බොහෝ සෙයින් මහා මණ්ඩල තීරණ මත රඳා පවතී. මහා මණ්ඩලයේ අනුමත යෝජනාවලින් ප්‍රකාශිත සාමාජික රටවල් බහුතරයේ අභිමතය ඉන් නියෝජනය වෙයි.

* නිරායුධකරණය, සාම සාධනය, සංවර්ධනය සහ මානව අයිතිවාසිකම් වැනි විෂයයන් අධ්‍යයනය කොට වාර්තා කිරීම පිණිස මහා මණ්ඩලය ස්ථාපනය කරන කමිටු සහ සෙසු ආයතන විසින්,

* මහා මණ්ඩලය කැඳවන අන්තර්ජාතික සම්මේලනවල දී සහ

* එක්සත් ජාතීන්ගේ ලේකම් කාර්යාලය-මහ ලේකම්වරයා සහ ඔහුගේ අන්තර්ජාතික සිවිල් සේවා කාර්ය මණ්ඩලය විසින්,

මේ වැඩ කොටස ඉටු කරනු ලබයි.

## ආරක්ෂක මණ්ඩලය

අන්තර්ජාතික සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීමේ මූලික වගකීම ප්‍රඥප්තියෙන්ම ආරක්ෂක මණ්ඩලය වෙත පැවරී තිබේ.

ආරක්ෂක මණ්ඩලය චීනය, ප්‍රංශය, රුසියානු ෆෙඩරේෂණය, එක්සත් රාජධානිය, එක්සත් ජනපදය යන නිත්‍ය සාමාජිකයන් 5 දෙනාගෙන් සහ වසර දෙකක කාලයක් සඳහා මහා මණ්ඩලය විසින් තෝරාගනු ලබන දස දෙනකු ඇතුළු සාමාජිකයන් 15 දෙනකුගෙන් සමන්විත වෙයි.

මණ්ඩලයේ සෑම සාමාජිකයකුටම එක් ඡන්දයක් හිමිවෙයි. ක්‍රියාපටිපාටියට අදාළ තීරණ ගනු ලබන්නේ සාමාජිකයන් 15 දෙනාගෙන් අවම වශයෙන් 9 දෙනකුගේ එකඟත්වයෙනි. සුවිශේෂී කරුණුවල දී ස්ථාවර සාමාජිකයන් සියලු දෙනාගේ අනුමතිය ඇතිව පක්ෂව ඡන්ද නවයක් ලැබිය යුතුය. ''මහ බලවතුන්ගේ ඒකමතිකභාවය'' පිළිබඳ නීතිය ලෙස නම්කර ඇති මෙය බොහෝ විට නිශේධ බලය ලෙස හඳුන්වනු ලැබේ. නිත්‍ය සාමාජිකයෙක් යම් තීරණයකට එකඟ නොවන්නේ නම් විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළ හැකි ය. එකී ක්‍රියාවෙහි නිශේධ බලය ගැබ්ව තිබේ. නිත්‍ය සාමාජිකයන් පස් දෙනාම කවර හෝ අවස්ථාවක නිශේධ බලය භාවිත කර ඇත. නිත්‍ය සාමාජිකයකු යම් තීරණයකට එකඟ නොවුනද ඊට බාධා කිරීමට අදහස් නොකරන්නේ නම් ඡන්දය දීමෙන් වැළකී සිටීමට පිළිවන.

ආරක්ෂක මණ්ඩලයේ තීරණ පිළිගෙන ක්‍රියාත්මක කිරීමට එක්සත් ජාතීන්ගේ සියලු සාමාජිකයෝ ප්‍රඥප්තියෙන් බැඳී සිටිති. එක්සත් ජාතීන්ගේ සෙසු ආයතනවලට බලය ඇත්තේ ආණ්ඩු වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමට වුවද සිය තීරණ ක්‍රියාත්මක කරන ලෙස බල කිරීමේ අයිතිය ආරක්ෂක මණ්ඩලයට පමණක් හිමිව තිබේ.

**කාර්යයන් සහ බලතල**

ප්‍රඥප්තිය ප්‍රකාර ආරක්ෂක මණ්ඩලයේ කාර්යයන් සහ බලතල මෙසේ ය :

* එක්සත් ජාතීන්ගේ ප්‍රතිපත්ති හා පරමාර්ථවලට අනුකූලව අන්තර්ජාතික සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීම ;
* අන්තර්ජාතික ඝට්ටනයට තුඩුදිය හැකි ඕනෑම ආරවුලක් හෝ තත්ත්වයක් හෝ පරීක්ෂා කිරීම ;
* එබඳු ආරවුල් සමථයකට පත් කිරීමේ ක්‍රම හෝ විසඳුම් කොන්දේසි නිර්දේශ කිරීම ;
* අවි පාලන ක්‍රමයක් ස්ථාපනය සඳහා සැලසුම් සම්පාදනය ;
* සාමයට තර්ජනයක් එල්ල වී ඇති බව හෝ ආක්‍රමණික ක්‍රියාවක් සිදුව ඇති බව හෝ නිශ්චය කිරීම සහ ගත යුතු පියවර නිර්දේශ කිරීම ;
* ආක්‍රමණයක් වැළැක්වීමට හෝ නතර කිරීම පිණිස අවි බලය යෙදවීමෙන් තොරව ආර්ථික සම්බාධක සහ වෙනත් ක්‍රියා අනුගමනය කරන ලෙස සාමාජිකයන්ගෙන් ඉල්ලා සිටීම ;

* ආක්‍රමණිකයකුට එරෙහිව යුද්ධමය පියවර ගැනීම ;

* නව සාමාජිකයන් බඳවා ගැනීම නිර්දේශ කිරීම ;

* මූලෝපායික ප්‍රදේශවල එක්සත් ජාතීන්ගේ භාරකාර කාර්යයන් ක්‍රියාත්මක කිරීම ;

* මහ ලේකම්වරයා පත් කිරීම සඳහා මහ මණ්ඩලයට නිර්දේශ කිරීම සහ මහ මණ්ඩලය සමඟ එක්ව අන්තර්ජාතික අධිකරණයෙහි විනිශ්චයකාරවරුන් තෝරා ගැනීම.

අඛණ්ඩ ක්‍රියාකාරිත්වයට ඉඩ සැලසෙන අයුරින් ආරක්ෂක මණ්ඩලය සංවිධාන වී ඇති අතර එහි සෑම සාමාජික රටකම ස්ථිර නියෝජිතයකු එක්සත් ජාතීන්ගේ මූලස්ථානයෙහි හැම විටම සිටිය යුතු ය. මණ්ඩලයේ අභිමතය අනුව මූලස්ථානය හැර වෙන ස්ථානයක වුවද රැස්වීමට පිළිවන. 1972 දී ඉතියෝපියාවේ අඩිස්අබාබා හි, 1973 දී පැනමාවේ පැනමා නගරයෙහි, 1991 දී ස්විට්සර්ලන්තයේ ජිනීවා හි රැස්වීම් පැවැත්විණ.

සාමයට එල්ල වී ඇති තර්ජනයක් පිළිබඳ පැමිණිල්ලක් ලැබුණු විට සාමාන්‍යයෙන් මණ්ඩලයේ ප්‍රථම පියවර වන්නේ සාමකාමී ලෙස එකඟත්වයකට එළඹීමට උත්සාහ කරන මෙන් අදාළ පාර්ශවයනට නිර්දේශ කිරීම ය. මණ්ඩලය සාමකාමී විසඳුමක් සඳහා වන මූලධර්ම නියම කිරීමට ඉඩ ඇත. ඇතැම් අවස්ථාවල කරුණු පරීක්ෂා කිරීම සහ මැදිහත්වීම භාර ගනී. සමහර විට විශේෂ නියෝජිතයන් පත් කිරීමටත් නැතහොත් සිය සද්භාවය උපයෝගී කර ගන්නා ලෙස මහ ලේකම්වරයාගෙන් ඉල්ලා සිටීමටත් ඉඩ තිබේ.

ආරවුලක් සටනට තුඩුදෙන විට මණ්ඩලයේ ප්‍රමුඛතාව වන්නේ එය හැකි ඉක්මනින් අවසන් කිරීමයි. එදිරිවාදිකම් පුළුල්ව පැතිර යාම වළක්වාගැනීමට ඉවහල්වන අයුරින් සටන් විරාම විධාන නිකුත් කිරීමට මණ්ඩලයට පිළිවන. නොසන්සුන්තාව සමනය කිරීමට, ප්‍රතිවිරුද්ධ හමුදා වෙන්කොට තැබීමට සහ සාමකාමී විසඳුමකට ඉවහල්වන සන්සුන් තත්ත්වයක් නිර්මාණය කිරීමට උදව්වනු පිණිස හමුදා නිරීක්ෂකයන් හෝ සාම සාධක හමුදාවක් හෝ යැවීමට මණ්ඩලයට හැකි ය. ප්‍රඥප්තියේ 7 වැනි පරිච්ඡේදයේ දැක්වෙන පරිදි ආර්ථික සම්බාධක (වෙළෙඳ තහංචි වැනි), අවි අලෙවි තහනම හෝ සාමූහික යුද්ධමය පියවර ඇතුළු බලාත්මක ක්‍රියා මාර්ග නිශ්චය කිරීමට ද මණ්ඩලයට බලය ඇත.

පැරණි යුගෝස්ලාවියාවේ සහ රුවන්ඩාවේ මනුෂ්‍යත්වයට එරෙහිව සිදු වූ අපරාධ විභාග කිරීම සඳහා මණ්ඩලය විසින් අන්තර්ජාතික අපරාධ යුක්ති විනිශ්චය සභා දෙකක් ස්ථාපනය කර ඇත. මේ විනිශ්චය සභා මණ්ඩලයේ අතුරු ආයතන වෙති.

ගල්ෆ් යුද්ධයෙන් පසුව මණ්ඩලය ඉරාකය සතු සමූහ ඝාතක අවි තුරන් කිරීම විමර්ශනය කරනු පිණිස එක්සත් ජාතීන්ගේ විශේෂ කොමිසම (UNSCOM) ස්ථාපනය කළේය. එහි වගකීම් 1999 දී මණ්ඩලය විසින් ස්ථාපිත එක්සත් ජාතීන්ගේ නිරීක්ෂණ, විමර්ශණ සහ පරීක්ෂණ කොමිසම (UNMOVIC) වෙත පවරන ලදී.

මහා මණ්ඩල ක්‍රියාකාරී කණ්ඩායමක් සාමාජිකත්වය පුළුල් කිරීම සහ සාධාරණ නියෝජනය ඇතුළු මණ්ඩලයේ ප්‍රතිසංස්කරණ පිළිබඳව 1993 සිට සලකා බලමින් සිටී.

## ආර්ථික හා සාමාජයීය මණ්ඩලය

එක්සත් ජාතීන්ගේ සංවිධාන පවුල නමින් ප්‍රකට, එක්සත් ජාතීන්ගේ සහ ඊට අයත් විශේෂිත ආයතනවල සහ සංවිධානවල ආර්ථික හා සාමාජයීය කාර්යයන් සම්බන්ධීකරණය භාර ප්‍රධාන අවයවය ලෙස ආර්ථික හා සාමාජයීය මණ්ඩලය ස්ථාපනය කරනු ලැබී ය. මණ්ඩලය වර්ෂ තුනක සේවා කාලයක් සහිත සාමාජිකයන් 54 දෙනකුගෙන් සමන්විත වෙයි. සාමාජිකයකුට හිමි වන්නේ එක ඡන්දයකි. සාමාන්‍ය වැඩි ඡන්දයෙන් තීරණ ගනු ලැබේ.

**කාර්යයන් සහ බලතල**

* අන්තර්ජාතික ආර්ථික හා සාමාජයීය විෂයයන් සාකච්ඡාවට ලක් කෙරෙන ප්‍රධාන වේදිකාව ලෙස ක්‍රියා කිරීම සහ සාමාජික රාජ්‍යයන් සහ එක්සත් ජාතීන්ගේ පද්ධතිය වෙත ප්‍රතිපත්ති නිර්දේශ සම්පාදනය ;

* අන්තර්ජාතික ආර්ථික, සාමාජයීය, සංස්කෘතික, අධ්‍යාපනික, සෞඛ්‍යය සහ සම්බන්ධිත විෂයයන් පිළිබඳ අධ්‍යයන සහ වාර්තා සැලසුම් කිරීම හෝ පිළියෙළ කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම ;

* මානව අයිතිවාසිකම් හා නන් වැදෑරුම් මූලික නිදහස තහවුරු කිරීම සහ ඒ පිළිබඳ ගෞරවය වර්ධනය කිරීම ;

* ආර්ථික සාමාජයීය සහ සම්බන්ධිත ක්ෂේත්‍රවල අන්තර්ජාතික සමුළු සැලසුම් කිරීමට සහ සංවිධානයට සහායවීම හා එකී සමුළුවල ප්‍රගතිය පිළිබඳ මනා පසු විමර්ශනය ;

* අදහස් විමසීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම තුළින් සහ මහා මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම මගින් විශේෂිත ආයතනවල ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය.

## සැසිවාර

ආර්ථික හා සාමාජයීය මණ්ඩලය සිය කාර්යයන් සංවිධානය පිණිස සාමාන්‍යයෙන් වසරක දී කෙටි සැසි කිහිපයක් ද, ජූලි මාසයේ දී නිව්යෝක් නුවර හෝ ජිනීවාහි හෝ සති හතරක ප්‍රධාන සැසි වාරයක් ද පවත්වයි. ප්‍රධාන පෙළේ ආර්ථික සාමාජයීය හා මානුෂවාදී කරුණු සාකච්ඡාවට බඳුන් වන්නාවූ අමාත්‍යවරුන්ගේ සහ සෙසු ඉහළ නිලධාරින්ගේ සහභාගිත්වය සහිත රැස්වීමක් ද ඊට අයත්ය. මණ්ඩලයේ වසර පුරා වැඩ ඉටු කරනු ලබන්නේ ඊට අයත් අතුරු සහසම්බන්ධිත ආයතන විසිනි.

## අතුරු සහසම්බන්ධිත ආයතන

මණ්ඩලයේ අතුරු ආයතන යන්ත්‍රණය නිර්මාණය වී ඇත්තේ මෙසේය :

* විෂයය භාර කොමිෂන් සභා නවයකි. සාකච්ඡාමය ආයතනවන මේවායේ කාර්යය සිය විෂයය පථයට අයත් ක්ෂේත්‍රවල කරුණු විමර්ශනය කොට නිර්දේශ ඉදිරිපත් කිරීමයි. සංඛ්‍යා ලේඛන කොමිසම, ජනගහනය හා සංවර්ධනය පිළිබඳ කොමිසම, සමාජ සංවර්ධනය සඳහා කොමිසම, මානව අයිතිවාසිකම් කොමිසම, ස්ත්‍රීන්ගේ තත්ත්වය පිළිබඳ කොමිසම, විෂ මත්ද්‍රව්‍ය පිළිබඳ කොමිසම, අපරාධ නිවාරණය සහ අපරාධ යුක්ති විනිශ්චය පිළිබඳ කොමිසම, සංවර්ධනය සඳහා විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ කොමිසම සහ ධරණීය සංවර්ධනය පිළිබඳ කොමිසම.

* කලාපීය කොමිෂන් සභා 5කි. අප්‍රිකාව පිළිබඳ ආර්ථික කොමිසම (ඇඩිස් අබාබා-ඉතියෝපියාව), ආසියා ශාන්තිකර ආර්ථික හා සමාජ කොමිසම (බැංකොක් - තායිලන්තය), යුරෝපා ආර්ථික කොමිසම (ජිනීවා, ස්විට්සර්ලන්තය), ලතින් අමෙරිකානු සහ කැරිබියානු ආර්ථික කොමිසම (සන්තියාගෝ-චිලී) සහ බටහිර ආසියානු ආර්ථික හා සමාජ කොමිසම (බේරූට් - ලෙබනන්) (30 පිටුව බලන්න).

* ස්ථාවර කමිටු සහ විශේෂඥ මණ්ඩල 5කි. වැඩසටහන් සහ සම්බන්ධීකරණ කමිටුව, ජනාවාස කොමිසම, රාජ්‍ය නොවන සංවිධාන කමිටුව, අන්තර් ආණ්ඩු ආයතන සමඟ සාකච්ඡා පිළිබඳ කමිටුව සහ බලශක්ති හා ස්වභාවික සම්පත් කමිටුව.

* සංවර්ධන සැලසුම් සම්පාදනය, ස්වාභාවික සම්පත් සහ ආර්ථික සමාජයීය හා සංස්කෘතික අයිතිවාසිකම් වැනි විෂයයන් පිළිබඳ විශේෂඥ මණ්ඩල ගණනාවක් ඇත.

මණ්ඩලය (UNDP, UNEP, UNICEF සහ UNFPA වැනි) එක්සත් ජාතීන්ගේ වැඩසටහන් සහ (ILO, WHO, FAO සහ UNESCO) වැනි විශේෂිත ආයතන සමඟ

සහයෝගයෙන් ක්‍රියා කරමින් එක්තරා දුරකට ඒවායේ වැඩ සම්බන්ධීකරණය සිදු කරයි. මණ්ඩලය වෙත වාර්තා කරන මේ සියලු ආයතන එහි ප්‍රධාන සැසිවාර වෙත නිර්දේශ ඉදිරිපත් කරයි.

### රාජ්‍ය නොවන සංවිධාන සමග සම්බන්ධතා

ආර්ථික හා සාමාජයීය මණ්ඩලයේ විෂය පථයට අයත් ක්ෂේත්‍ර අරභයා රාජ්‍ය නොවන සංවිධානවල උපදෙස් විමසීමට ප්‍රඥප්තියෙන් ඉඩ සලසා තිබේ. රාජ්‍ය නොවන සංවිධාන 1,600කට වැඩි ගණනක් මණ්ඩලයේ උපදේශක තත්ත්වය හිමිකර ගෙන ඇත. මණ්ඩලයේ කාර්යයන් සඳහා ප්‍රයෝජනවත්වන ශිල්පීය දැනුම හා විශේෂ ඇත්දැකීම් මෙකී සංවිධාන සතුව ඇති බවත් ඒවාට ස්වකීය අදහස් ප්‍රකාශ කිරීමට ඉඩ දියයුතු බවත් මණ්ඩලය පිළිගනී.

මණ්ඩලය රාජ්‍ය නොවන සංවිධාන කණ්ඩායම් තුනකට වර්ග කර ඇත. (i) මණ්ඩලයේ කාර්යයන්ට බොහෝ සෙයින් අදාළ වන සංවිධාන, (ii) සුවිශේෂ ක්ෂේත්‍රවල විශේෂ නිපුණතා හිමි සංවිධාන, සහ (iii) මණ්ඩලයට විටින් විට දායකවීමේ හැකියාව සහිත සංවිධාන.

උපදේශක තත්ත්වය හිමි රාජ්‍ය නොවන සංවිධානවලට මණ්ඩලයේ සහ එහි අතුරු ආයතනවල රැස්වීම්වලට පරීක්ෂකයන් යැවීමටත් මණ්ඩලයේ කාර්යයන්ට අදාළව ලිඛිත සන්දේශ ඉදිරිපත් කිරීමටත් පිළිවන. අන්‍යොන්‍ය වැදගත්කමක් සහිත විෂයයන් අරභයා එක්සත් ජාතීන්ගේ ලේකම් කාර්යාලය සමග අදහස් හුවමාරු කර ගැනීමට ද, ඒවාට අවසරය තිබේ.

එක්සත් ජාතීන් සහ අනුබද්ධ රාජ්‍ය නොවන සංවිධාන අතර සම්බන්ධතාව ගත වූ කාලය තුළ සැලකිය යුතු ලෙස වැඩි දියුණු විය. රාජ්‍ය නොවන සංවිධාන ප්‍රතිපත්ති සහ වැඩසටහන් සම්බන්ධ උපදෙස් දෙන හවුල්කරුවන් ලෙසත් සිවිල් සමාජය සමග සම්බන්ධවන වැදගත් පුරුකක් ලෙසත් වැඩි වැඩියෙන් සලකනු ලැබේ. ප්‍රඥප්තියේ පරමාර්ථ සපුරා ගැනීමට උදව් වෙමින් එක්සත් ජාතීන්ගේ ප්‍රජාව සමඟ දිනපතා වැඩ කරන ලොව පුරා රාජ්‍ය නොවන සංවිධාන සංඛ්‍යාව වැඩි වෙමින් පවතී.

## භාරකාරත්ව මණ්ඩලය

ප්‍රඥප්ති විධිවිධාන යටතේ 1945 දී ස්ථාපිත භාරකාරත්ව මණ්ඩලයට පැවරුණු ප්‍රධාන කාර්යය වූයේ භාරකාර ක්‍රමය යටතට පත් කරන ලද භූමි ප්‍රදේශ පරිපාලනය අධීක්ෂණය කරමින් ඒවා ස්වයං පාලනය හෝ ස්වාධීනත්වය උදෙසා සූදානම් කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් පියවර ගැනීමය. සාමාජික රාජ්‍යය 7කින් සැදුම්ලත් පරිපාලන අධිකාරිය වෙතින් ලැබෙන භාර ප්‍රදේශවල ජනතාවගේ දේශපාලන, ආර්ථික, සමාජයීය සහ අධ්‍යාපනික ප්‍රගමනය පිළිබඳ වාර්තා විභාග කිරීම හා සාකච්ඡා කිරීම, භාර ප්‍රදේශවලින් ලැබෙන පෙත්සම් විභාග කිරීම සහ භාර ප්‍රදේශ වෙත විශේෂ දූත කණ්ඩායම් යැවීම සඳහා ප්‍රඥප්තියෙන් මණ්ඩලයට බලය පවරා තිබිණ.

1994 වනවිට සියලු භාර ප්‍රදේශ වෙනම රාජ්‍ය ලෙස හෝ අසල්වැසි ස්වාධීන රටවල් සමඟ එක්වීමෙන් හෝ ස්වයං පාලනය හෝ ස්වාධීනත්වය හෝ උදාකර ගත්තේය. අවසන්වරට එසේ කළ භාර ප්‍රදේශය වූ පාලවු නමැති ශාන්තිකර දිවයින එක්සත් ජාතීන්ගේ 185 වැනි සාමාජික රාජ්‍යය බවට පත්විය.

චීනය, ප්‍රංශය, රුසියානු ෆෙඩරේෂණය, එක්සත් රාජධානිය, එක්සත් ජනපදය යන ආරක්ෂක මණ්ඩල නිත්‍ය සාමාජිකයන් 5 දෙනාගෙන් සැදුම්ලත් භාරකාරත්ව මණ්ඩලය සිය කාර්යය අවසන් කරන ලදුව අවශ්‍යතාව උද්ගත වන පරිදි රැස්වීම පිණිස කාර්යය පරිපාටි නීති සංශෝධනය කෙරිණ.

## අන්තර් ජාතික අධිකරණය

නෙදර්ලන්තයේ හේග් නුවර පිහිටුවා ඇති අන්තර් ජාතික අධිකරණය, එක්සත් ජාතීන්ගේ ප්‍රධාන අධිකරණ ආයතනයයි. රාජ්‍යයන් අතර නීතිමය ආරවුල් සමතයට පත් කරන එය එක්සත් ජාතීනට සහ එහි විශේෂිත ආයතනවලට උපදේශාත්මක ගුරුහරුකම් දෙයි. එහි ව්‍යවස්ථාව එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ අවියෝජනීය අංගයකි.

අධිකරණය එක්සත් ජාතීන්ගේ සියලු සාමාජිකයන් ඇතුළත්, එහි ව්‍යවස්ථාවේ පාර්ශ්වකරුවනට විවෘතව පවතී. අධිකරණය වෙත ආරවුල් යොමු කළ හැක්කේ සහ එය හමුවේ විභාගයට ගැනෙන නඩුවල පාර්ශ්වකරුවන් විය හැක්කේ රාජ්‍යයනට පමණි. අධිකරණය පුද්ගලයනට සහ පෞද්ගලික ආයතනවලට හෝ අන්තර්ජාතික සංවිධානවලට හෝ විවෘත නැත.

කවර හෝ නීති ප්‍රශ්නයක් පිළිබඳව අධිකරණයේ උපදේශාත්මක මතය විමසීමට මහා මණ්ඩලයට හා ආරක්ෂක මණ්ඩලයට පිළිවන. එක්සත් ජාතීන්ගේ සෙසු සංවිධානවලට සහ විශේෂිත ආයතනවලට සිය විෂය පථයට අයත් කරුණක් පිළිබඳ නීතිමය තත්වය සම්බන්ධයෙන් මහා මණ්ඩලයේ අනුමැතිය ඇතිව අධිකරණයේ උපදේශාත්මක මතය විමසිය හැකිය.

### අධිකරණ බලතල

සාමාජික රාජ්‍යයන් අධිකරණය වෙත යොමු කරන සියලු ප්‍රශ්න සහ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියෙහි හෝ අන්තර්ජාතික ගිවිසුම්වල සහ සම්මුතිවල ඇතුළත් සියලු කරුණු අරභයා ඊට අධිකරණමය බලතල හිමිවී තිබේ. යම් කරුණක් අධිකරණය වෙත යොමු කිරීමට ඉඩ සලසන ගිවිසුමක් හෝ සම්මුතියක් හෝ අත්සන් තැබීමෙන් නැතහොත් ඒ හා සමාන විශේෂ ප්‍රකාශයක් කිරීමෙන් අධිකරණයේ විනිශ්චය පිළිගන්නා බවට කල්තබා අවනතභාවය පළ කිරීමට රාජ්‍යයනට පිළිවන. අනිවාර්ය අධිකරණ බලය පිළිගන්නා බවට කෙරෙන එවැනි ප්‍රකාශවලට ඇතැම් ආරවුල් වර්ග ඇතුළත් නොකර සිටීමට ඉඩ ඇත.

අධිකරණය සිය ව්‍යවස්ථාව ප්‍රකාර ආරවුල් විනිශ්චයේ දී පහත සඳහන් විධිවිධාන උපයෝගී කොට ගනී :-

* නඩුවක පාර්ශ්වකාර රාජ්‍යයන් විසින් විවෘතව පිළිගෙන ඇති නීති ඇතුළත් අන්තර්ජාතික සම්මුතීන් ;

* නීතියක් ලෙස පිළිගැනෙන, සාක්ෂි වශයෙන් ගත හැකි අන්තර්ජාතික චාරිත්‍ර;

* ජාතීන් විසින් පිළිගෙන ඇති පොදු නීති මූලධර්ම; සහ

* අධිකරණ තීන්දු සහ විවිධ ජාතීනට අයත් විශිෂ්ට ගණයේ විද්වතුන්ගේ ඉගැන්වීම්.

**සාමාජිකත්වය**

මහා මණ්ඩලය සහ ආරක්ෂක මණ්ඩලය විසින් ස්වාධීනව ඡන්ද විමසීමෙන් තෝරා ගනු ලබන විනිශ්චයකාරවරු 15 දෙනෙකුගෙන් අධිකරණය සමන්විත වෙයි. සුදුසුකම් අනුවම ඔවුන් තෝරා ගැනෙන අතර ලෝකයේ ප්‍රධාන නීති ක්‍රම නියෝජනයවන අයුරින් අධිකරණය සැකසීමට වගබලා ගැනෙයි. එකම රටකින් විනිශ්චයකාරවරුන් දෙදෙනකු පත් කිරීමට නොහැකිය. විනිශ්චයකාරවරයකුගේ සේවා කාලය වසර 9කි. ඔවුන් නැවත තෝරා ගැනීමට ඉඩ තිබේ. සේවාකාලය තුළ වෙනත් වෘත්තියක නිතර වීමට ඔවුනට නොහැකිය. සියලු සාමාජිකයන් සහිතව රැස්වීම අධිකරණයේ සාමාන්‍ය පිළිවෙළ වුව ද පාර්ශ්වකරුවන්ගේ ඉල්ලීම අනුව මණ්ඩල නමින් හඳුන්වන කුඩා ඒකක ලෙස ද රැස්විය හැකිය. එවැනි ඒකකවල නඩු තීන්දු පූර්ණ අධිකරණයේ තීන්දු ලෙස පිළිගැනේ. පාරිසරික කරුණු පිළිබඳ මණ්ඩලයක් ද අධිකරණය සතුව ඇත.

## ලේකම් කාර්යාලය

ලේකම් කාර්යාලය යනු ලොව පුරා සේවා ස්ථානවල වැඩ කරන අන්තර්ජාතික කාර්ය මණ්ඩලයයි. එය සංවිධානයේ අනේකවිධ දෛනික කාර්යයන් ඉටු කරයි. එක්සත් ජාතීන්ගේ සෙසු ප්‍රධාන ආයතනවලටද සේවය සලසන එය එකී ආයතන නියම කරන ප්‍රතිපත්ති සහ වැඩසටහන් පරිපාලනය සිදු කරයි. ලේකම් කාර්යාලයේ ප්‍රධානියා වන්නේ ආරක්ෂක මණ්ඩලයේ නිර්දේශය මත පස් අවුරුදු කාලයක් සඳහා මහා මණ්ඩලය විසින් පත් කරනු ලබන මහ ලේකම්වරයායි.

ලේකම් කාර්යාලය විසින් ඉටු කරනු ලබන කාර්යයන් එක්සත් ජාතීන්ගේ විෂය පථයට අයත් ගැටලු සේම විවිධාකාර වේ. ඒවා සාම සාධක මෙහෙයුම් පරිපාලනයේ සිට අන්තර්ජාතික ආරවුල් බේරුම් කිරීම දක්වාත්, ආර්ථික හා සාමාජයීය ප්‍රවනතා සමීක්ෂණයේ සිට මානව අයිතිවාසිකම් හා ධරණීය සංවර්ධනය පිළිබඳ අධ්‍යයන

පිළියෙළ කිරීම දක්වාත් වූ පරාසයක විහිදෙයි. ලේකම් කාර්යාලයීය සේවක මඩුල්ල එක්සත් ජාතීන්ගේ වැඩ පිළිබඳව ලෝක සන්නිවේදන මාධ්‍යයනට තොරතුරු සපයයි. ලෝක අවධානයට ලක්ව ඇති විෂයයන් අරභයා අන්තර්ජාතික සමුළු සංවිධානය කරයි. දේශන සහ ලියැවිලි සංවිධානයේ නිල භාෂාවලට පරිවර්තන කරයි.

නිත්‍ය අයවැය යටතට ගැනෙන ලේකම් කාර්යාලයීය සේවක මඩුල්ල රටවල් 160කින් පමණ තෝරාගත් අටදහස් නවසීයක් පමණ දෙනාගෙන් සමන්විතය. අන්තර්ජාතික සිවිල් සේවකයන් වශයෙන් කාර්ය මණ්ඩලය සහ මහ ලේකම්වරයා සිය ක්‍රියාවන් පිළිබඳව එක්සත් ජාතීනට පමණක් වගකියන අතර කිසිදු ආණ්ඩුවකින් හෝ බාහිර අධිකාරයකින් හෝ උපදෙස් නොපතන බවටත්, නොගන්නා බවටත් දිවුරුම් දී සිටිති. මහ ලේකම්වරයාගේ සහ කාර්ය මණ්ඩලයේ වගකීම්වල සුවිශේෂ අන්තර්ජාතික ස්වරූපයට ගරු කිරීමටත් අයථා ලෙස ඔවුන්ට බලපෑම් කිරීමෙන් වැළකී සිටීමටත් සෑම සාමාජික රාජ්‍යයක්ම ප්‍රඥප්තියෙන් බැඳී ඇත.

නිව්යෝක් නුවර මූලස්ථානය කොටගත් එක්සත් ජාතීන් අඩිස් අබාබා, බැංකොක්, බේරූට්, ජිනීවා, නයිරෝබි, සන්තියාගෝ සහ වියානා යන නගරවල ප්‍රධාන කාර්යාල ඇතුළුව ලොව්පුරා කාර්යාල පවත්වාගෙන යයි.

## මහ ලේකම්

තානාපතිවරයකු, ප්‍රාමාණිකයකු, සිවිල් සේවකයකු සහ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස එකවර ක්‍රියා කරන මහ ලේකම්වරයා එක්සත් ජාතීන්ගේ පරමාදර්ශ පිළිබඳ සංකේතයක් ද විශේෂයෙන් දිළිඳු සහ අවදානමට ලක් වූ කණ්ඩායම් ඇතුලු ලෝක ජනතාවගේ යහපත වෙනුවෙන් පෙනී සිටින ප්‍රකාශකයෙක් ද වන්නේය. පදවියට පත් හත්වැන්නා වන වත්මන් මහ ලේකම් ඝානා රාජ්‍යයේ කොෆි අන්නන් මහතා 1997 ජනවාරි 01 දා ධුරයේ වැඩ භාර ගත්තේය.

ප්‍රඥප්තිය මහ ලේකම්වරයා හඳුන්වා ඇත්තේ සංවිධානයේ ''ප්‍රධාන පරිපාලන නිලධාරියා'' ලෙසිනි. ඔහු හෝ ඇය ධුරයේ සිටිමින් ආරක්ෂක මණ්ඩලය, මහා මණ්ඩලය, ආර්ථික හා සාමාජයීය මණ්ඩලය සහ සෙසු ආයතන විසින් ''පවරනු ලබන්නා වූ සෙසු වෙනත් කාර්යයන්'' ඉටු කළ යුතුය. අන්තර්ජාතික ආරක්ෂාවට හා සාමයට තර්ජනයක් විය හැකි යැයි තමා කල්පනා කරන ඕනෑම කරුණක් ආරක්ෂක මණ්ඩලයේ අවධානයට යොමු කිරීමට ප්‍රඥප්තියෙන් මහ ලේකම්වරයාට බලය පවරා තිබේ. මෙකී ගුරු උපදේශ පදවියේ බලතල නිර්වචනය කරනවා සේම ක්‍රියාකාරිත්වය සඳහා සැලකිය යුතු ඉඩ සීමාවක් ප්‍රදානය කරයි. සාමාජික රාජ්‍යයන්ගේ අදහස් උදහස් නිසි සැලකිල්ලට ගැනීමට අසමත් වන්නේ නම් එය මහ ලේකම්වරයාගේ අඩුවකි. එහෙත් එක්සත් ජාතීන්ගේ සාරධර්ම සහ සදාචාර අධිකාරිය ආරක්ෂා කිරීමත් සාමය වෙනුවෙන් කථා කිරීම සහ පියවර ගැනීමත් අවදානමක් ඇතිව වුව ද කලින් කලට අවශ්‍යතාව පරිදි එකී සාමාජික රාජ්‍යයන් අභියෝග කිරීම හෝ ඒවා සමඟ එකඟ නොවීම කළ යුතු වන්නේ ය.

එක්සත් ජාතීන්ගේ ආයතනවල රැස්වීම්වලට සහභාගිවීම ලෝක නායකයන්, ආණ්ඩු නිලධාරීන් සහ සෙසු අය සමඟ අදහස් විමසීම, සාමාජික රටවල ජනතාවන් සමඟ සබඳතා පවත්වාගැනීම සහ සංවිධාන න්‍යාය පත්‍රයේ අන්තර්ගත විවිධ වූ අන්තර්ජාතික කරුණු ගැන මනා අවබෝධයක් ලබා ගැනීම පිණිස ලොවපුරා චාරිකා කිරීම ඇතුලු මහ ලේකම්වරයාගේ එදිනෙදා කාර්යභාරයෙහි මේ නිර්මාණාත්මක කැළඹිලි සහිත බව ගැබ්ව පවතී. මහ ලේකම්වරයා සෑම වසරකම සංවිධානයේ ක්‍රියාකාරකම් තක්සේරු කරමින් සහ අනාගත ප්‍රමුඛතා සටහන් කරමින් වාර්තාවක් ප්‍රකාශයට පත් කරයි.

**ප්‍රඥප්තිය අනුව මහලේකම්වරයා පත්කරනු ලබන්නේ ආරක්ෂක මණ්ඩලයේ නිර්දේශය මත මහා මණ්ඩලය විසිනි. අන්නන් මහතාට පෙර සිටි මහ ලේකම්වරු : බුත්‍රෝස් බුත්‍රෝස් ඝාලි (ඊජිප්තුව) - 1992 ජනවාරි සිට 1996 දෙසැම්බර් දක්වා හාවියර් පෙරේස් ඩි-ක්වෙල්යාර් (පීරු) - 1982 ජනවාරි සිට 1991 දෙසැම්බර් දක්වා, කර්ට් වෝල්ඩ්හයිම් (ඔස්ට්‍රියාව) - 1972 ජනවාරි සිට 1981 දෙසැම්බර් දක්වා, උ තාන්ට් (බුරුමය, දැන් මියැන්මාර්) - 1961 නොවැම්බර් සිට (ප්‍රථමයෙන් වැඩ බලන මහ ලේකම් ධුරයට පත් කරනු ලැබ 1962 දී ස්ථිර කෙරිණ.) 1971 දෙසැම්බර් දක්වා, ඩැග් හැමර්ෂල්ඩ් (ස්වීඩනය) - 1953 අප්‍රේල් සිට 1961 සැප්තැම්බරයේ අප්‍රිකාවේ දී සිදුවූ ගුවන් අනතුරකින් මරණයට පත්වන තෙක්, ට්‍රිග්වේ-ලි (නෝර්වේ) - 1946 පෙබරවාරි සිට 1952 නොවැම්බරයේ දී ඉල්ලා අස්වනතුරු.**

මහ ලේකම්වරයා විසින් ඉටු කැරෙන අතිශය වැදගත් කාර්යයක් වන්නේ අන්තර්ජාතික ආරවුල් උද්ගතවීම, උත්සන්නවීම හා ව්‍යාප්තවීම වළක්වනු පිණිස තම ''සද්භාවය'' උපයෝගිකොට ගැනීමයි. ස්වකීය ස්වාධීනත්වය, අපක්ෂපාතීබව සහ අවංකභාවය පදනම් කොට ගනිමින් ප්‍රසිද්ධියේ හා පෞද්ගලිකව ගන්නා පියවර මින් අදහස් වෙයි. අන්නන් මහතා මහා ලේකම් ධුරයට පැමිණීමෙන් පසු සයිප්‍රස්, නැගෙනහිර තිමෝරය, ඉරාකය, ලිබියාව, මැද පෙරදිග, නයිජීරියාව සහ බටහිර සහරා ඇතුලු අවස්ථා ගණනාවක දී තම සද්භාවය ප්‍රයෝජනයට ගත්තේය.

එක් එක් මහ ලේකම්වරයා තමා ධුරයේ රැඳී සිටින කාලයට අදාල සන්දර්භය ඇතුළත සිය කාර්යභාරය සැලසුම් කරගනී. අන්නන් මහතාගේ ප්‍රයත්නයන් පහත සඳහන් විෂයයන් කේන්ද්‍ර කොට ගෙන ඇත.

**ප්‍රතිසංස්කරණ.-** අන්නන් මහතා පදවි ප්‍රාප්තියෙන් මඳ කලකට පසු, තත්කාලීන වෙනස්කම්වලට සහ නව ලෝක අවදියට අනුරූපව හැඩ ගැසීමට එක්සත් ජාතීන්ට උදව් වනු පිණිස පුළුල් ප්‍රතිසංස්කරණ යෝජනාවලියක් ඉදිරිපත් කෙළේය.

මහ ලේකම්වරයාගේ අධිකාරය යටතට ගැනෙන ප්‍රතිසංස්කරණ සැලසුම් බොහෝ දුරට ක්‍රියාත්මක කොට හෝ ක්‍රියාත්මක මාර්ගයට යොමුකොට හෝ ඇත. ඒවා ශුන්‍ය වර්ධන අයවැය සහ කළමනාකරණ පුරුදු වැඩිදියුණු කිරීමේ ප්‍රබල උත්සාහයන් වැනි පරිපාලනමය සේම විශේෂයෙන් සංවර්ධනය හා සාම සාධනය බඳු ක්ෂේත්‍ර

ඇතුලුව විවිධ අංශවලින් කෙරෙන වර්ධනයවන ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීමට එක්සත් ජාතීනට හැකියාව ලැබෙන සංවිධානමය පාර්ශ්ව නියෝජනය කරයි.

මහ ලේකම්වරයාට පැවරී ඇති වගකීම් සමුදාය ඉටු කිරීමට සහාය වනු පිණිස නියෝජ්‍ය මහ ලේකම් ධුරයක් අලුතින් ඇති කරනු ලැබීය. මේ තනතුරට 1998 දී ප්‍රථමයෙන් පත් වූයේ කැනඩාවේ ජාතික ආරක්ෂාව පිළිබඳ නියෝජ්‍ය අගමැතිනි ලුවී ෆ්‍රෙචට් මහත්මියයි.

මේ අතර මහා මණ්ඩලය, ආරක්ෂක මණ්ඩලයේ මුළු සාමාජිකත්වය හා සංයුතිය සංවිධානයේ මූල්‍ය සම්පාදන ක්‍රම සහ එක්සත් ජාතීන්ගේ විශේෂිත ආයතන පද්ධතිය තුළ පුළුල් ඒකාග්‍රතාවක් ඇති කිරීම ඇතුලු සිය අධිකාරියට අයත් ආයතනික වෙනස්කම් හා අදාල ප්‍රශ්න ගණනාවක් සලකා බලමින් සිටී.

**අප්‍රිකාව**.- අප්‍රිකාව පිළිබඳව අඛණ්ඩ අවධානයෙන් සිටීමට අදහස් කර ඇති මහ ලේකම්වරයා සාමය සහ ඉහළ මට්ටම්වල සංවර්ධනයක් අරමුණු කොටගත් අප්‍රිකානු ප්‍රයත්නයන්ට අන්තර්ජාතික උපකාර ලබා ගැනීමට ක්‍රියා කරයි. 1998 දී ප්‍රකාශිත ''අප්‍රිකාවේ ගැටුම්වලට හේතු, දිගුකාලීන සාමය උදාකිරීම සහ ධරණීය සංවර්ධනය'' නමැති වාර්තාවෙහි ඔහුගේ ප්‍රවේශය අන්තර්ගතව පවතී. අප්‍රිකානු රාජ්‍යයන් ඇතුළත සහ අතර දේශපාලන නොසන්සුන්තාව සහ ප්‍රචණ්ඩත්වය අඩු කිරීම, ණය බර, යහපත් රාජ්‍ය විචාරය, ඒඩ්ස් වැනි රෝග ව්‍යාප්තිය බඳු ප්‍රධාන සංවර්ධන ගැටලු නිරාකරණය අරමුණු කොටගත් ක්‍රියාමාර්ග එහි ඇතුළත්ව තිබේ.

**සාම මෙහෙයුම්**.- 1990 දශකයේදී එක්සත් ජාතීන්ගේ සාමය පවත්වා ගැනීමේ හා සාම සාධන ක්‍රියාකාරකම්වල පුළුල් ප්‍රසාරණයක් සේම ගැටුම්වල ස්වභාවයේ ද කැපී පෙනෙන වෙනසක් දක්නට ලැබිණ. රාජ්‍යයන් අතර ගැටුම් සංඛ්‍යාව අඩු වී රාජ්‍යයන් ඇතුළත ගැටුම් සංඛ්‍යාව සහ කෲරත්වය අතින් වර්ධනය විය. මේ සංකීර්ණ මානව ආපදාවනට ප්‍රතිචාර දැක්වීමේ දී ලැබුණු දුෂ්කර අත්දැකීම්, සාම මෙහෙයුමක් සිදුකරන ලෙස ඉල්ලා සිටි විට එක්සත් ජාතීන් හමුදාමය, මූල්‍යමය සහ දේශපාලන වශයෙන් පූර්ණ සූදානමින් සිටිය යුතුය යන අදහස දැඩිව අවධාරණය කිරීමට මහ ලේකම්වරයා පෙළඹවීය.

ප්‍රතිසංස්කරණ සැලැස්මේ ඇතුළත් ක්‍රියාමාර්ගවලට අමතරව ප්‍රධාන වාර්තා තුනකින් ද මේ ප්‍රයත්නයට දායකත්වය ලැබිණ. මහාමණ්ඩලය විසින් ඉල්ලා සිටින ලදුව 1999 දී මහ ලේකම්වරයා විසින් භාරදෙන ලද පළමුවැන්න එක්සත් ජාතීන් ''ආරක්ෂිත ප්‍රදේශයක්'' ලෙස නම් කර තිබූ ස්‍රෙබ්‍රෙනිකා හි බොස්නියානු මුස්ලිම් ජනගහනයට එරෙහිව 1995 දී සිදු කෙරුණු සැහැසිකම් විභාග කරමින් මහ ලේකම්වරයා සැකසූ වාර්තාවකි. මහ ලේකම්වරයාගේ නියමයෙන් සම්පාදනය කොට 1999 දී නිකුත් කෙරුණු දෙවැන්න 1994 රුවන්ඩාවේ වර්ග සංහාරය සිදු වූ අවධියේ එක්සත් ජාතීන්ගේ චර්යාව පිළිබඳව ස්වීඩනයේ හිටපු අගමැති ඉන්ග්වර් කාල්සන්ගේ ප්‍රධානත්වයෙන් කළ ස්වාධීන විමර්ශනයකි. 2000 දී ප්‍රකාශිත තුන්වැන්න ඇල්ජීරියාවේ

හිටපු විදේශ අමාත්‍ය ලක්ෂ්මන් කදිර්ගාමර් බ්‍රාහිමිගේ සභාපතිත්වයෙන් යුතුව මහ ලේකම්වරයා පත් කළ ඉහළ පෙළේ මණ්ඩලයක් විසින් එක්සත් ජාතීන්ගේ සාම ආරක්ෂක ක්‍රියාකාරකම් පිළිබඳව කරන ලද පරිපූර්ණ විමර්ශනයකි. මුල් වාර්තා දෙකෙන් අනාගතය සඳහා එළඹගත හැකි නිගමන හඳුනාගැනීම අරමුණු කරගත් මේ වාර්තාව ලේකම් කාර්යාලය සහ විශේෂයෙන් ආරක්ෂක මණ්ඩලයේ සාමාජිකයන් ඇතුලු සාමාජික රාජ්‍යයන් වෙත යොමු කෙරුණු පුළුල් පරාසයක් සහිත නිර්දේශ අඩංගු කොට ගනී. මහ ලේකම්වරයා සිය බල වපසරියට ඇතුළත් නිර්දේශ ක්‍රියාත්මක කිරීම ආරම්භකොට ඇති අතර අනෙක් ඒවා සඳහා එක්සත් ජාතීන්ගේ ව්‍යවස්ථාදායක මණ්ඩලවල අනුමැතිය හා උපකාරය අවශ්‍ය වෙයි.

---

## එක්සත් ජාතීන් පරිවර්තනයේ නියමුවෙක් ලෙස

අද ලෝක වේදිකාවේ නළුවන්, රාජ්‍යයන් පමණක් නොවේ යැයි මහ ලේකම් කොෆි අන්නන් ''අපි ජනතාවන් : 21 වැනි සියවසේ එක්සත් ජාතීන්ගේ කාර්යභාරය'' මැයෙන් එළි දැක්වූ සිය ''සහශ්‍රක වාර්තාවෙහි'' සඳහන් කරයි. පෞද්ගලික අංශය, රාජ්‍ය නොවන සංවිධාන සහ බහු පාර්ශ්වික ආයතන ලෝක ප්‍රශ්නවලට පොදු විසඳුම් සෙවීම සඳහා ආණ්ඩු සමඟ එක්ව වැඩි වැඩියෙන් ක්‍රියා කරයි.

බරපතල සම්පත් හිඟයකට මුහුණ දී සිටින එක්සත් ජාතීන් එකී ගෝලීය ක්‍රියාකාරිකයන්ගේ කාර්ය භාරය උදුරාගැනීමට නොව ජගත් මට්ටමෙන් සාමූහික ක්‍රියාකාරිත්වය උත්තේජනය කිරීමෙන් වෙනස්වීම සහ ඔවුන් අතර සම්බන්ධීකරණය සඳහා වඩා ඵලදායි නියමුවකු බවට පත්වීමට උත්සාහ කළ යුතුය. මහ ලේකම්වරයා මේ ක්ෂේත්‍ර සඳහා නිර්දේශ කරන පියවර මෙසේයි.

***එක්සත් ජාතීන්ගේ මූලික උපායමාර්ග හඳුනාගැනීම.**- සංවිධානයේ ශක්තිය, ප්‍රභවය ලබන්නේ බලය තුළින් නොව එය නියෝජනය කරන සාරධර්ම, ලෝක සම්මතයන් සැකසීමට සහ පවත්වා ගැනීමට එය ඉටුකරන කාර්යභාරය, ලෝක අවධානය සහ ක්‍රියාකාරිත්වය උත්තේජනය කිරීමට ඊට ඇති හැකියාව සහ ජනතා ජීවිත වැඩි දියුණු කිරීමට සිදුකරන ප්‍රායෝගික වැඩ නිසා ජනිත විශ්වාසය වෙතිනි. එක්සත් ජාතීන් මේ ශක්තීන් මත පදනම් විය යුතු අතරම ඵලදායි සහ අවිවාදිත නිත්‍යානුකූල භාවයෙන් යුතුව වැඩකිරීමට හැකිවන පරිදි ආරක්ෂක මණ්ඩලය යළි සැකසීම් ඇතුළුව අවශ්‍ය වෙනස්කම් කළ යුතුය. එය සිවිල් සමාජ සංවිධාන සහ පෞද්ගලික අංශය සමඟ තම සබඳතා පුළුල් කළ යුතුය.

***වෙනස්වීම සඳහා ජාලයක් ලෙසින් වැඩ කිරීම.**- පොදු අරමුණු සපුරාගැනීම පිණිස අන්තර්ජාතික ආයතන, සිවිල් සමාජය, පෞද්ගලික අංශය සහ ආණ්ඩු ඒකරාශී කරමින් එක්සත් ජාතීන් නිල නොවන ප්‍රතිපත්ති ජාලයන් සමඟ නිල ආයතන ශක්තිමත් කිරීමට ක්‍රියා කළ යුතුය.

***ඩිජිටල් සම්බන්ධතා ඇති කිරීම.**- වැඩි කාර්යක්ෂමතාව සහ සෙසු ලෝකය සමඟ සිය අන්තර් ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීම උදෙසා එක්සත් ජාතීන් නව සන්නිවේදන තාක්ෂණය උපරිම ලෙස ප්‍රයෝජනයට ගත යුතුය.

**නිහඬ විප්ලවය ඉදිරියට ගෙනයාම.**- එක්සත් ජාතීනට, ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සහ ප්‍රමුඛතා පිළිබඳව සාමාජික රාජ්‍යයන් අතර සුපැහැදිලි පොදු එකඟත්වයක් අවශ්‍ය වී තිබේ.

නිදසුනක් ලෙස නව කාර්යයන් සඳහා කාලසීමා නියම කිරීම සහ ප්‍රතිඵල මත පදනම් වූ අයවැය සම්පාදනය හඳුන්වාදීම වැනි කාර්යයන් සඳහා මහාමණ්ඩලයේ තීරණ ලැබිය යුතුය. රාජ්‍යයන්ට සහ ජනතාවන්ට එකසේ වඩා හොඳින් සේවය කිරීමට එක්සත් ජාතීන් "වඩා ඵලදායී කාර්යක්ෂම සහ ලෝකයේ ජනතාවන්ට සමීප වියහැකි" ආයතනයක් විය යුතුය.

සහශ්‍රක වාර්තාව, රාජ්‍ය සහ ආණ්ඩු නායකයන්ගේ මෙතෙක් පැවැති විශාලතම එකතුව වූ සහශ්‍රක නායක සමුළුව වෙනුවෙන් පිළියෙළකොට නිකුත් කෙරිණි. 2000 සැප්තැම්බර් 06 සිට 08 දක්වා එක්සත් ජාතීන්ගේ මූලස්ථානයෙහි පැවැති නායක හමුවට එක් වූ ලෝක නායකයෝ නව සියවස තුළ සංවිධානය සඳහා පැහැදිලි දිශාවන් නියම කළහ. ඒකමතිකව සම්මත කෙරුණු සහශ්‍රක ප්‍රකාශනය ගෝලීයකරණය සියලු දෙනා සඳහා ධනාත්මක බලවේගයක් බවට පත් කිරීමේ කේන්ද්‍රීය අභියෝගය ජයගනු පිණිස සුපැහැදිලි අරමුණු සහ නිශ්චිත ඉලක්ක අන්තර්ජාතික ප්‍රජාවට නියම කළේය.

---

**ගෝලීය සංගතය.**- 1999 ස්විට්සර්ලන්තයේ දාඕස් හි පැවැති ලෝක ආර්ථික සංසදයේදී මහ ලේකම්වරයා එක්සත් ජාතීන් සහ ලෝක ව්‍යාපාරික ප්‍රජාව අතර ගෝලීය සංගතයක් යෝජනා කළේය. ගෝලීයකරණයේ ප්‍රතිලාභ ලෝකයේ සියලු ජනයාට භුක්ති විඳීමට ඉඩ සැලසීමට සහ සමාජ ආර්ථික අවශ්‍යතා සපුරා ගැනීමට මූලික වන සාරධර්ම සහ පුරුදු ලෝක වෙළෙඳපොළට කාවැද්දීම එහි අරමුණ විය. මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය, අන්තර්ජාතික කම්කරු සංවිධානය, සේවා ස්ථානයෙහි අයිතිවාසිකම් පිළිබඳ මූලික මූලධර්ම සහ පරිසරය හා සංවර්ධනය පිළිබඳ රියෝ මූලධර්ම වෙතින් උකහාගත්, ලෝකයේ ආණ්ඩු අතර විශ්ව පිළිගැනීමට පාත්‍ර වී ඇති ප්‍රධාන මූලධර්ම නවයක් මත සංගතය පදනම් වී ඇත.

මෙකී මූලධර්ම වැළඳගෙන ඒවා ව්‍යාපාරික පුරුදු බවට පත් කරන්නැයි මහ ලේකම්වරයා පෞද්ගලික අංශයේ ව්‍යවසායකයන්ගෙන් ඉල්ලා සිටියේය. සංගතයට හවුල් වන ලෙස කම්කරු සහ සිවිල් සමාජ සංවිධාන නායකයන් දිරිමත් කරන ඔහු ගෝලීයකරණයට හා සංවර්ධනයට සම්බන්ධ විවිධ විවාදාත්මක කරුණු පිළිබඳ සංවාදය සඳහා වේදිකාවක් ලෙස එය භාවිත කරන්නැයි ඉල්ලා සිටී. ප්‍රථම රැස්වීම අංශ තුනේම නායකයන්ගේ සහභාගිත්වයෙන් 2000 දී පැවැත්විණ.

## එක්සත් ජාතීන්ගේ අයවැය

එක්සත් ජාතීන්ගේ නිත්‍ය අයවැය මහාමණ්ඩලය විසින් දෙවසරක කාලයක් සඳහා අනුමත කරනු ලැබේ. ප්‍රථමයෙන් මහ ලේකම්වරයා අයවැය ඉදිරිපත් කරන අතර ස්වකීය ආණ්ඩු විසින් නාමයෝජනා කරන ලදුව මහමණ්ඩලය විසින් තෝරාගනු ලබන එහෙත් සිය පෞද්ගලික මට්ටමින් සේවය කරන විශේෂඥයන් 16 දෙනකුගෙන් සැදුම්ලත් පරිපාලන හා අයවැය ගැටලු පිළිබඳ උපදේශක කමිටුව එය සමාලෝචනය කරයි. වැඩසටහන්වලට අදාළ පාර්ශ්වයන් සමාලෝචනය කරන්නේ මහා මණ්ඩලය විසින් තෝරාගනු ලබන සහ සිය ආණ්ඩුවල අදහස් නියෝජනය කරන විශේෂඥයන් 34 දෙනකුගෙන් සැදුම්ලත් වැඩසටහන් හා සම්බන්ධීකරණ කමිටුවයි.

2002-2001 දෙවසර සඳහා අනුමත අයවැය 1998-1999 අයවැයට ඩොලර් මිලියන දෙකක් වැඩි ඩොලර් මිලියන 2,535කි. දේශපාලන කටයුතු, අන්තර්ජාතික යුක්තිය සහ නීතිය, අන්තර්ජාතික සංවර්ධන සහයෝගිතාව, ප්‍රසිද්ධ තොරතුරු සම්පාදනය, මානව අයිතිවාසිකම් සහ මානුෂවාදී සේවා වැනි ක්ෂේත්‍රවල එක්සත් ජාතීන්ගේ වැඩ සටහන් සඳහා වියදම අයවැයෙන් ආවරණය කෙරේ.

අයවැයට අරමුදල් ලැබෙන ප්‍රධාන මූලාශ්‍රය සාමාජික රාජ්‍යයන්ගේ දායක මුදල්ය. පරිපාලන සහ අයවැය (පස්වැනි) කමිටුවේ නිර්දේශය අනුව මහා මණ්ඩලය විසින් පත් කරනු ලබන, සිය පෞද්ගලික මට්ටමින් සේවය කරන විශේෂඥයන් 18 දෙනෙකුගෙන් සැදුම්ලත් දායක මුදල් කමිටුවේ නිර්දේශය මත මහා මණ්ඩලය අනුමත කළ පරිමාණයක් අනුව එක් එක් රට ගෙවිය යුතු දායක මුදල් තක්සේරු කරනු ලැබේ.

තක්සේරු පරිමාණය පදනම් වී ඇති මූලික නිර්ණායකය ගෙවීමට රටකට ඇති හැකියාවයි. රටේ ප්‍රතිශීර්ෂ ආදායම ඇතුලු සාධක ගණනාවක් සැලකිල්ලට ගනිමින් සකසන ලද මුලු දල ජාතික නිෂ්පාදිතයෙන් රටවලට හිමි සාපේක්ෂ පංගුව මුල්කොටගෙන එය තීරණය කරනු ලැබේ. කමිටුව, තක්සේරු කිරීම් සාධාරණ සහ නිවැරදි බව සහතික කරනුවස් අලුත්ම ජාතික ආදායම් සංඛ්‍යා පදනම් කොටගෙන සෑම වසර තුනකට වරක් තක්සේරු පරිමාණය මුලුමනින් සමාලෝචනය කරයි. 2000 දී මහා මණ්ඩලය කවර හෝ දායකයකු සඳහා අයවැයෙන් සියයට 22ක උපරිමයක් නියම කළේය.

බොහෝ සාමාජික රටවල් තම තක්සේරුගත දායක මුදල් කලට වේලාවට සම්පූර්ණයෙන් ගෙවීමට අඛණ්ඩව අසමත්වීම නිසා වසර ගණනාවක සිට එක්සත් ජාතීන්ගේ සමස්ත මූල්‍ය තත්ත්වය අවදානම් සහගතව පවතී. ඇතැම් රටවලින් ස්වේච්ඡාවෙන් ලැබෙන ප්‍රදානවලට සහ කාරක ප්‍රාග්ධන අරමුදලට (සාමාජික රාජ්‍යයන් සිය දායක මුදලට අනුපාතිකව ගෙවන අත්තිකාරම් මුදල්වලින් එය සෑදී තිබේ.) ස්තුතිවන්නට සහ සාම සාධක මෙහෙයුම්වලින් ණය ගැනීමෙන් නොකඩවා ක්‍රියාත්මකවීමට එක්සත් ජාතීන් සමත් වී ඇත.

2000 දෙසැම්බර් 31 වන විට 2000 වසර සඳහා සාමාජික රාජ්‍යයන් නිත්‍ය අයවැයට හිඟ තැබූ මුලු මුදල ඩොලර් මිලියන 222කි. ඉන් 2000 වසර සඳහා හිඟ මුදල ඩොලර් මිලියන 200ක් ද, කලින් වර්ෂ සඳහා ඩොලර් මිලියන 22ක් ද විය. තක්සේරුවට ලක්වූ සාමාජිකයන් 187 දෙනාගෙන් 142ක් සිය මුලු දායක මුදල ගෙවා තිබූ අතර ඉතිරි 45 දෙනා සංවිධානයට ඇති සිය ව්‍යවස්ථාපිත මූල්‍ය වගකීම් ඉටු කිරීමට අපොහොසත් වූහ.

නිත්‍ය අයවැයට අමතරව සාමාජික රාජ්‍යයන් අන්තර්ජාතික විනිශ්චය සභාවල වියදම් වෙනුවෙන් තක්සේරුගත මුදලක් ද, සාම සාධක මෙහෙයුම් පිරිවැය වෙනුවෙන් මූලික පරිමාණයේ අලුතින් සකස් කළ පදනමකට අනුව තක්සේරු කළ මුදලක් ද ගෙවිය යුතුය.

විශේෂයෙන් සෝමාලියාවේ සහ පැරණි යුගොස්ලාවියාවේ මෙහෙයුම්වල වියදම පිළිබිඹු කරමින් සාම සාධක පිරිවැය 1995 දී ඩොලර් බිලියන තුන දක්වා ඉහළ මට්ටමකට ළඟා විය. එකී වියදම 1999 දී ඩොලර් මිලියන 889ක් පමණ වූයේය. වසර 2000 දී කොසෝවෝ, නැගෙනහිර තිමෝරය, සියරාලියෝන් ප්‍රජාතන්ත්‍රවාදී කොංගෝ ජනරජය, එරිත්‍රියාව සහ ඉතියෝපියාව යන ප්‍රදේශවල ප්‍රධාන පෙළේ නව මෙහෙයුම් ආරම්භ කෙරිණ.

2000 දෙසැම්බර් 31 වන විට තත්කාලීන සහ පැරණි සාම සාධක මෙහෙයුම් වෙනුවෙන් ලැබිය යුතුව තිබූ මුදල ඩොලර් බිලියන දෙකකට ආසන්න විය. තක්සේරුගත දායක මුදල් ලැබීමේ අඩුව පියවා ගන්නා ලද්දේ සාම සාධක මෙහෙයුම් සඳහා සෙබළුන් උපකරණ සහ වෙනත් පහසුකම් සැපයූ රාජ්‍යයනට ගෙවිය යුතු දීමනා පමා කිරීමෙනි.

එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සහ සරණාගතයන් පිළිබඳ මහ කොමසාරිස් (UNHCR) බඳු එක්සත් ජාතීන්ගේ අරමුදල්වලට සහ වැඩසටහන්වලට වෙනම අයවැය ඇත. ඒවායේ සම්පත්වලින් වැඩි කොටස සැපයෙන්නේ ස්වේච්ඡා පදනමින් ආණ්ඩු වෙතින් සහ යුනිසෙෆ් සම්බන්ධයෙන් මෙන් පුද්ගලයන් වෙතිනි.

එක්සත් ජාතීන්ගේ විශේෂිත ආයතනවලට ද වෙනම අයවැය ඇත. 1999 දී විශේෂිත ආයතනවල (ලෝක බැංකුව, අන්තර්ජාතික මූල්‍ය අරමුදල සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා අන්තර්ජාතික අරමුදල හැර) අනුමත නිත්‍ය අයවැය ඩොලර් බිලියන 1.987ක් වූයේ ය. රාජ්‍යයන් ස්වේච්ඡාවෙන් ද අරමුදල් සපයන අතර ඒවායේ වටිනාකම සාමාන්‍යයෙන් ඩොලර් බිලියන 5.5ක් පමණ වෙයි.

## එක්සත් ජාතීන්ගේ සංවිධාන පවුල

එක්සත් ජාතීන්ගේ සංවිධාන පවුල (එක්සත් ජාතීන්ගේ පද්ධතිය -The United Nations System) එක්සත් ජාතීන්ගේ ලේකම් කාර්යාලය, එක්සත් ජාතීන්ගේ වැඩසටහන් සහ අරමුදල් (UNICEF සහ UNDP වැනි) සහ විශේෂිත ආයතන එක්වීමෙන් නිර්මාණය වී තිබේ. වැඩසටහන් සහ අරමුදල් මහාමණ්ඩලයේ අතුරු ආයතන වෙති. විශේෂ ගිවිසුම් මඟින් එක්සත් ජාතීන්ට සම්බන්ධ වී සිටින විශේෂිත ආයතන ආර්ථික හා සාමාජයීය ප්‍රයත්නයේ සෑම ක්ෂේත්‍රයකටම පාහේ තාක්ෂණික සහ වෙනත් ස්වරූපවල ආධාර සපයයි.

### සම්බන්ධීකරණය පිළිබඳ පරිපාලන කමිටුව (ACC)

අරමුදල්, වැඩසටහන් සහ විශේෂිත ආයතන 26 මේ කමිටුවේ සාමාජිකයෝ වෙති. එක්සත් ජාතීන්ගේ පද්ධතියට අයත් විවිධ සංවිධානවල පාලන මණ්ඩල විසින් අනුමත වැඩසටහන් අතර පුළුල් සම්බන්ධීකරණයට පහසුකම් සැලසීම කමිටුවේ

ප්‍රධාන කාර්යය යි. මහ ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුත් කමිටුව පද්ධතිය මුහුණපා ඇති විෂය බද්ධ සහ කළමනාකරණ ගැටලු සලකා බැලීම පිණිස වසරකට දෙවරක් රැස්වෙයි. කමිටුවේ වැඩ සිදුකරනු ලබන්නේ පද්ධතිය ඇතුළත සම්බන්ධීකරණයේ සුවිශේෂ අංශ වෙත සීමා වී ඇති එහි අතුරු මණ්ඩල විසිනි.

## ලොවපුරා එක්සත් ජාතීන්ගේ ප්‍රධාන කාර්යාල




## එක්සත් ජාතීන්ගේ ලේකම් කාර්යාලය

එක්සත් ජාතීන්ගේ ලේකම් කාර්යාලය පහත විස්තර කෙරෙන දෙපාර්තමේන්තු සහ කාර්යාලවලින් සමන්විත වී තිබේ. මහ ලේකම්වරයාගෙන් සහ ඔහුගේ ජ්‍යෙෂ්ඨ උපදේශකයන්ගෙන් සැදුම්ලත් **මහ ලේකම්වරයාගේ විධායක කාර්යාලය** පොදු ප්‍රතිපත්ති නිශ්චය කරමින් සංවිධානයට සමස්ත මඟ පෙන්වා දෙයි. නිව්යෝර්ක්හි මූලස්ථානය සහිත ලේකම් කාර්යාලය ලොවපුරා සියලු කලාපවල කාර්යාල පවත්වා ගනී.

එහි ක්‍රියාකාරිත්වයේ ප්‍රධාන කේන්ද්‍රස්ථාන තුන ජිනීවා, වියානා සහ නයිරෝබි නගරත්‍රයයි. විෂය භාර මහලේකම් (Under-Secretary General) සර්ගේයි ඇලෙක්සැන්ඩ්‍රෝවිච් ඕඩ්සෝනිකිඩ්සේ (රුසියානු ෆෙඩරේෂණය) ප්‍රධානියා වන ජිනීවා හි එක්සත් ජාතීන්ගේ කාර්යාලය, සමුළු රාජ්‍ය තාන්ත්‍රික ක්‍රමවේදය පිළිබඳ කේන්ද්‍රස්ථානයක් සහ නිරායුධකරණය සහ මානව අයිතිවාසිකම් පිළිබඳ සංවාද මණ්ඩපයකි. විෂය භාර මහ ලේකම් අන්තෝනියෝ මාරියාකොස්තා ගේ (ඉතාලිය)

ප්‍රධානත්වයෙන් යුත් වියානාහි එක්සත් ජාතීන්ගේ කාර්යාලය, අන්තර්ජාතික මත්ද්‍රව්‍ය පාලන, අපරාධ නිවාරණය සහ අපරාධ යුක්ති විනිශ්චය, සාමකාමී අරමුණු සඳහා අභ්‍යවකාශය භාවිත කිරීම, අන්තර්ජාතික වෙළෙඳ නීතිය යන ක්ෂේත්‍රවල ක්‍රියාකාරකම් පිළිබඳ මූලස්ථානය වෙයි. විෂය භාර මහ ලේකම් ක්ලෝස් ටොෆර් (ජර්මනිය) ප්‍රධානියා වන එක්සත් ජාතීන්ගේ නයිරෝබි කාර්යාලය පරිසරය සහ ජනාවාස ක්ෂේත්‍රවල ක්‍රියාකාරකම් සඳහා මූලස්ථානයයි.

## අභ්‍යන්තර ප්‍රමාද දෝෂ සේවා කාර්යාලය (OIOS)

*විෂයභාර මහ ලේකම්* — *දිලීප් නායිර් මහතා (සිංගප්පූරුව)*

එක්සත් ජාතීන්ගේ මෙහෙයුම්වල ප්‍රමාද දෝෂ ගැන ක්‍රියාකිරීම පිණිස විශ්වාසදායක, ඵලදායි සහ ස්ථාවර ක්‍රමයක් ස්ථාපනය කරනු වස් අභ්‍යන්තර ප්‍රමාද දෝෂ සේවා කාර්යාලය ආරම්භ කරන ලදී. කාර්යාලය :

* වැඩ සටහන් සහ පවරන ලද කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාව සහ ඵලදායකත්වය නිරීක්ෂණය කරමින් විනිශ්චය කරයි.

* පරිපූර්ණ අභ්‍යන්තර විගණන මෙහෙයුම් සිදු කරයි.

* වැඩ සටහන් සහ සංවිධාන ඒකක විටින් විට පරීක්ෂා කර බලයි.

* අයථා කළමනාකරණය සහ විෂමාචාර පිළිබඳ වාර්තා විමර්ෂණය කරයි.

* විගණන, ඇගයීම්, පරීක්ෂණ සහ විමර්ෂණ ඇසුරින් නියම කෙරෙන නිර්දේශ ක්‍රියාවට නැංවීම නිරීක්ෂණය කරයි.

* සිය වගකීම් ඵලදායි ලෙස ඉටු කරන්නේ කෙසේදැයි වැඩ සටහන් කළමනාකරුවන්ට උපදෙස් දෙයි.

ලේකම් කාර්යාලය, මෙහෙයුම් වැඩ සටහන් සහ අරමුදල්, ප්‍රධාන සාම සාධක මෙහෙයුම් සහ වෙනත් විවිධ වැඩ සටහන් ප්‍රමාද දෝෂ සේවා කාර්යාලයෙන් ආවරණය වෙයි. එහි කාර්ය මණ්ඩලය 120කි. අයවැය ඩොලර් මිලියන 22ක් පමණය. එය අයථා වියදම් හඳුනාගැනීමෙන් සෑම වසරකම කාර්යාලය උපයන ප්‍රමාණයට අඩු මුදලකි.

අභ්‍යන්තර ප්‍රමාද දෝෂ සේවා විෂයභාර මහ ලේකම්වරයා නැවත අලුත් කිරීමේ ඉඩක් නැති පස් අවුරුදු එක් කාලසීමාවක් සඳහා මහ ලේකම් විසින් පත් කරනු ලැබ මහ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබේ.

## නීති කටයුතු කාර්යාලය (OLA)

*විෂයභාර මහ ලේකම්* *නිකලස් මිචෙල් (ස්විට්සර්ලන්තය)*
*නීති උපදේශක*

නීති කටයුතු කාර්යාලය සංවිධානයේ මධ්‍යම නීති සේවාවයි. එය මහ ලේකම්වරයාට, ලේකම් කාර්යාලයීය දෙපාර්තමේන්තුවලට හා කාර්යාලවලට සහ එක්සත් ජාතීන්ගේ ප්‍රධාන සහ අතුරු ආයතනවලට පොදු සහ පෞද්ගලික අන්තර්ජාතික නීති ක්ෂේත්‍රයේ නීති උපදෙස් සපයයි. පොදු අන්තර්ජාතික නීති, සාගර නීතිය හා අන්තර් ජාතික වෙළෙඳ නීතිය සමඟ සම්බන්ධ නීති ආයතන වෙනුවෙන් විෂය බද්ධ හා ලේකම් කාර්යාලයීය කටයුතු ඉටු කරයි; එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියෙහි 102 වැනි වගන්තියෙන් සහ අන්තර්ජාතික අධිකරණයේ ව්‍යවස්ථාවෙන් මහ ලේකම්වරයා වෙත පවරා ඇති කාර්යයන් ඉටු කරයි; නීති කටයුතු කාර්යාලය අන්තර්ජාතික සාමය හා ආරක්ෂාව, එක්සත් ජාතීන්ගේ තත්ත්වය, වරප්‍රසාද සහ මුක්තීන්, සාමාජික රාජ්‍යයන්ගේ අක්ත පත්‍ර සහ නියෝජන ආදියට අදාල නීති ගැටළු සම්බන්ධයෙන් ක්‍රියා කරයි; එය එක්සත් ජාතීන්ගේ ආයතනවල හා සමුළුවල අන්තර්ජාතික සම්මුතීන්, ගිවිසුම්, පරිපාටිමය නීති සහ වෙනත් නෛතික ලේඛන කෙටුම්පත් කරයි; අන්තර්ජාතික පෞද්ගලික සහ පරිපාලන නීතියට හා එක්සත් ජාතීන්ගේ යෝජනා සහ රෙගුලාසිවලට අදාල ගැටළු ගැන නීති සේවා සහ උපදෙස් සපයයි. මහා මණ්ඩලීය 6 වැනි කමිටුව, අන්තර්ජාතික නීති කොමිසම, අන්තර්ජාතික වෙළෙඳ නීති කොමිසම, එක්සත් ජාතීන්ගේ සාගර නීති සම්මුතිය විසින් ස්ථාපිත ආයතන, එක්සත් ජාතීන්ගේ පරිපාලන විනිශ්චය මණ්ඩලය සහ සෙසු නීති මණ්ඩල සඳහා ලේකම් කාර්යාලයීය සේවා සලසයි. සම්මුති ලියාපදිංචිය සහ ප්‍රකාශනය සහ බහු පාර්ශ්වික සම්මුති තැන්පත් කිරීම සම්බන්ධව මහ ලේකම්වරයාට පැවරී ඇති වගකීම් ඉටු කරයි.

කාර්යාලයේ ප්‍රධානියා වන නීති උපදේශකවරයා නෛතික ස්වභාවයෙන් යුත් රැස්වීම් සහ සමුළුවල දී මෙන්ම අධිකරණමය හා බේරුම් කිරීමේ විභාගවල දී මහ ලේකම්වරයා නියෝජනය කරයි. එක්සත් ජාතීන් වෙනුවෙන් නිකුත් කෙරෙන නෛතික ලේඛන සහතික කරයි. එක්සත් ජාතීන්ගේ පද්ධතියට අයත් නීති උපදේශකයන්ගේ රැස්වීම් කැඳවා ඒවායේ දී එක්සත් ජාතීන් නියෝජනය කරයි.

## දේශපාලන කටයුතු දෙපාර්තමේන්තුව (DPA)

*විෂයභාර මහ ලේකම්,* *කීරන් ප්‍රෙන්ඩගාස්ට් මහතා (එක්සත් රාජධානිය)*

දේශපාලන කටයුතු දෙපාර්තමේන්තුව, නීතිය හා ආරක්ෂාව පවත්වා ගැනීමට හා තහවුරු කිරීමට අදාලව ප්‍රඥප්තියෙන් මහ ලේකම්වරයාට පැවරී ඇති ලෝක පරිමාණ වගකීම් ඉටු කිරීමේ දී සියලු දේශපාලන කරුණු පිළිබඳව ඔහුට උපදෙස් හා උදව් සපයයි. ඒ අනුව දෙපාර්තමේන්තුව :

* ලොවපුරා දේශපාලන වර්ධනයන් නිරීක්ෂණය කරයි. විශ්ලේෂණය කරයි. තක්සේරු කරයි.

* පාලනය සහ නිරාකරණය සඳහා එක්සත් ජාතීනට ඵලදායි කාර්යභාරයක් ඉටුකළ හැකි තත්‍ය ලෙස පවතින ගැටුම් සහ ඇතිවිය හැකි ගැටුම් හඳුනාගනී.

* එවැනි අවස්ථාවල යෝග්‍ය පියවර මහ ලේකම්වරයාට නිර්දේශ කොට අනුමත ප්‍රතිපත්තිය ක්‍රියාවට නංවයි.

* නිවාරණීය රාජ්‍ය තාන්ත්‍රික උපාය, සාම සාධනය, සාමය පවත්වා ගැනීම සහ සාමය ගොඩනැගීම යන ක්ෂේත්‍රවල මහ ලේකම්, මහා මණ්ඩලය සහ ආරක්ෂක මණ්ඩලය විසින් තීරණය කෙරෙන දේශපාලන ක්‍රියාකාරකම් ඉටු කිරීම සඳහා මහ ලේකම්වරයාට සහාය වෙයි.

* මැතිවරණ උදව් සඳහා සාමාජික රාජ්‍යයන් වෙතින් ලැබෙන ඉල්ලීම් පිළිබඳව මහ ලේකම්වරයාට උපදෙස් දෙමින් එවැනි ඉල්ලීම්වලට ප්‍රතිචාර ලෙස ස්ථාපිත වැඩසටහන් සම්බන්ධීකරණය සිදු කරයි.

* මහ ලේකම්වරයා සහ සාමාජික රාජ්‍යයන් අතර සම්බන්ධතාවන්හි දේශපාලන පාර්ශවයන් ගැන ඔහුට උපදෙස් දෙමින් සහය වෙයි.

* ආරක්ෂක මණ්ඩලයට සහ ඊට අයත් අතුරු ආයතනවලට මෙන්ම පලස්තීන ජනතාවගේ අහිමි කළ නොහැකි අයිතිවාසිකම් පරිහරණය පිළිබඳ කමිටුවට සහ නිර් යටත්විජිතකරණය පිළිබඳ 24 දෙනාගේ විශේෂ කමිටුවට සේවය සලසයි.

දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා-දේශපාලන කටයුතු පිළිබඳ විෂයභාර මහ ලේකම්-සෙසු කාර්යයන්ට අමතරව ආරවුල් සාමකාමී ලෙස විසඳීම පිණිස උපදෙස් විමසීම හා සාකච්ඡා කිරීමත් භාරගනී. එසේම ඔහු එක්සත් ජාතීන්ගේ සාම සාධනය නිවාරණීය සහ මැතිවරණ සහාය පිළිබඳ ක්‍රියාකාරකම් ගැන වගකියන ප්‍රධාන පුද්ගලයා ද වෙයි.

## නිරායුධකරණ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව (DDA)

*විෂයභාර මහ ලේකම්* — *නොබුයාසු ඇබේ මහතා (ජපානය)*

නිරායුධකරණ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව න්‍යෂ්ටික නිරායුධකරණය සහ ව්‍යාප්තිය පිටු දැකීම පිළිබඳ අරමුණු සාක්ෂාත් කර ගැනීමටත් රසායනික සහ ජෛව විද්‍යාත්මක අවි ඇතුළු සෙසු සමූහ ඝාතක අවි හරණය පිණිස ස්ථාපිත ව්‍යුහයන් ශක්තිමත් කිරීමටත් ක්‍රියා කරයි. සාම්ප්‍රදායික ආයුධ ක්ෂේත්‍රයේ, විශේෂයෙන් තත්කාලීන ගැටුම්වල දී වැඩිපුරම භාවිත වන බිම් බෝම්බ සහ සුළු අවි, නිරායුධකරණය සාක්ෂාත් කර ගැනීමත් එහි කාර්යයකි.

නිරායුධකරණ දෙපාර්තමේන්තුව මහ මණ්ඩලයේ සහ එහි ප්‍රථම කමිටුවේ, නිරායුධකරණ කොමිසමේ, නිරායුධකරණ සමුළුවේ සහ සෙසු ආයතනවල ක්‍රියා මගින් නිරායුධකරණ ක්ෂේත්‍රයේ සම්මතයන් සහ පරිචයන් ස්ථාපනය පිණිස විෂය බද්ධ හා සංවිධානාත්මක ආධාර සපයයි. හමුදාමය විෂයයන්හි සංවාදය විවෘතභාවය හා විශ්වාසය ගොඩනැගීම වැනි නිවාරණීය නිරායුධකරණ ක්‍රියාමාර්ග පෝෂණය කරන එය සාම්ප්‍රදායික අවි පිළිබඳව එක්සත් ජාතීන්ගේ නාම ලේඛනය සහ කලාපීය සාකච්ඡා මණ්ඩප බඳු කලාපීය නිරායුධකරණය ප්‍රයත්න ධෛර්යමත් කරයි. එක්සත් ජාතීන්ගේ නිරායුධකරණ ප්‍රයත්න පිළිබඳ තොරතුරු සම්පාදනයද එහි කාර්යයකි.

ගැටුමකින් අනතුරුව පැරණි සටන්කරුවන් නිරායුධ කිරීම සහ විසුරුවා හැරීම, යළි සමාජගතවීමට ඔවුනට උදව්වීම වැනි ප්‍රායෝගික ක්‍රියාමාර්ග සම්පාදනයට සහ ක්‍රියාත්මක කිරීමට දෙපාර්තමේන්තුව උපකාරී වෙයි.

## සාම සාධක මෙහෙයුම් දෙපාර්තමේන්තුව (DPKO)

*විෂයභාර මහ ලේකම්* — *ෂෝන් මාරි ගුහෙනෝ මහතා (ප්‍රංශය)*

එක්සත් ජාතීන්ගේ සියලු සාම සාධක මෙහෙයුම්වල ක්‍රියාකාරී හස්තය වන මේ දෙපාර්තමේන්තුව එකී මෙහෙයුම් සිදුකිරීම, කළමනාකරණය, හැසිරවීම, සැලසුම් කිරීම සහ පිළියෙල කිරීම පිළිබඳ වගකීම දරයි. එය සාම සාධක මෙහෙයුම් සඳහා සැලසුම් සහ ක්‍රමවේදයන් සංවර්ධනය කරයි. ආණ්ඩු සමඟ සාකච්ඡා කොට මෙහෙයුම් සඳහා අවශ්‍ය පිරිස් බලය හා උපකරණ සපයා ගනී. මෙහෙයුම් සහ දේශපාලන හෝ මානුෂවාදී දූත මෙහෙවර සඳහා ප්‍රායෝගික හා පරිපාලනමය උදව් සලසයි. සම්පත් අවශ්‍යතා නිර්ණය කොට සාම සාධක ක්‍රියාකාරකම් හා සම්බන්ධ අරමුදල් නිරීක්ෂණය හා පාලනය සිදුකරයි. ගැටුමේ පාර්ශවයන් හා ආරක්ෂක මණ්ඩලයේ තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මණ්ඩලයේ සාමාජිකයන් සමඟ සබඳතා පවත්වා ගනී. අලුතින් පටන් ගැනීමට ඉඩ ඇති මෙහෙයුම් සඳහා අනුමාන සැලසුම් සම්පාදනය භාරගනී. හදිසි ප්‍රතිපත්ති ගැටළු විශ්ලේෂණය කොට ඒ සම්බන්ධ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සම්පාදනය කරයි. බිම් බෝම්බ හා සම්බන්ධ එක්සත් ජාතීන්ගේ සියලු ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය භාර දෙපාර්තමේන්තුව සාම සාධන සහ හදිසි අවස්ථාවල බිම් බෝම්බ ඉවත් කිරීමේ වැඩ සටහන් සකස් කොට ක්‍රියාත්මක කිරීමට උදව් වෙයි.

දෙපාර්තමේන්තු ප්‍රධානියා-සාම සාධක මෙහෙයුම් විෂය භාර මහ ලේකම්-මහ ලේකම්වරයා වෙනුවෙන් සාම සාධක මෙහෙයුම් අධ්‍යක්ෂණය කරයි. මෙහෙයුම් සඳහා ප්‍රතිපත්ති සහ උපදෙස් සම්පාදනය කරයි ; සහ අදාල සියලු කරුණු සම්බන්ධයෙන් මහ ලේකම්වරයාට උපදෙස් දෙයි.

## මානුෂවාදී කටයුතු සම්බන්ධීකරණ කාර්යාලය (OCHA)

*මානුෂවාදී කටයුතු පිළිබඳ විෂයභාර මහ ලේකම් ආපදා සහන සම්බන්ධීකාරක* — *යාන් ඉගලන්ඩ් (නෝර්වේ)*

මානුෂවාදී කටයුතු සම්බන්ධීකරණ කාර්යාලයේ මෙහෙවර හදිසි ආපදාවකට ප්‍රතිචාර වශයෙන් සහන සලසන එක්සත් ජාතීන්ගේ ආයතන අතර සම්බන්ධීකරණය ශක්තිමත් කිරීමයි. සම්බන්ධීකරණ යාන්ත්‍රන ස්ථාපනය, අවශ්‍යතා තක්සේරු කිරීමේ දූත මෙහෙවර සංවිධානය, ඒකාබද්ධ ආයාචනා පිළියෙල කිරීම සහ සම්පත් සොයා ගැනීම වැනි වගකීම් බෙදාදීම අරභයා අන්තර් ආයතන ස්ථාවර කමිටුවේ සංවිධාන අතර එකඟත්වයක් ඇති කිරීමට කාර්යාලය ක්‍රියා කරයි. ආපදා සහන සම්බන්ධීකාරකගේ මූලික කාර්යයන් :

* ආයතනවලට නිශ්චිත කාර්යයන් පවරා දෙන අවස්ථා අතරතුර උද්ගතවන ගැටළු ඇතුළු සියලු මානුෂවාදී ප්‍රශ්න ආවරණය වන පරිදි ප්‍රතිපත්ති සම්පාදනය සහ සම්බන්ධීකරණය

* දේශපාලන ආයතන, විශේෂයෙන් ආරක්‍ෂක මණ්ඩලය මානුෂවාදී ප්‍රශ්න පිළිබඳව දැනුවත් කිරීම ; සහ

* යෝග්‍ය ප්‍රතිචාර යන්ත්‍රණයක් පසුබිමෙහි ස්ථාපනය කිරීමෙන් මානුෂවාදී ආපදා පිළිබඳ ප්‍රතිචාර සම්බන්ධීකරණය : මෙය ඉටු කරනු ලබන්නේ ආපදා සහන සම්බන්ධීකාරකගේ ප්‍රධානත්වයෙන් යුත් අන්තර් ආයතන ස්ථාවර කමිටුව මඟිනි.

ලොව පුරා සේවය කරන 439කින් යුත් කාර්ය මණ්ඩලයක් සහිත මානුෂවාදී කටයුතු කාර්යාලයේ 2000-2001 මූලික අයවැය ඩොලර් මිලියන 45කි.

## ආර්ථික හා සාමාජයීය කටයුතු දෙපාර්තමේන්තුව (DESA)

*විෂයභාර මහ ලේකම්* — *හොසේ අන්තෝනියෝ ඔකම්පෝ (කොලොම්බියාව)*

ආර්ථික හා සාමාජයීය කටයුතු දෙපාර්තමේන්තුවේ එකිනෙකට සම්බන්ධ පුළුල් වැඩ ක්‍ෂේත්‍ර තුනක් ඇත. පළමුවනුව ප්‍රස්තුත මාතෘකාවනට හා ප්‍රවනතාවනට අදාල පුළුල් පරාසයක සාමාජයීය ආර්ථික සහ පාරිසරික දත්ත හා තොරතුරු උත්පාදනය කරයි, ගොනු කරයි, විශ්ලේෂණය කරයි. දැනුවත් සාකච්ඡා සිදුකොට ප්‍රතිපත්ති විකල්ප කිරා මැන බැලීමට සාමාජික රාජ්‍යයනට මෙය උපකාරී වෙයි. දෙවනුව දෙපාර්තමේන්තුව තත්කාලීන හෝ අලුතින් මතුවන ගෝලීය අභියෝග ජයගැනීම පිණිස පොදු ක්‍රියාමාර්ග සැකසීමෙහි නිරත සාමාජික රාජ්‍යයනට උදව්වීමෙන් ආර්ථික

සාමාජයීය හා පාරිසරික කරුණු සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ ව්‍යුහය ඇතුළත රැස්වන බොහෝ අන්තර් ආණ්ඩු ආයතනවල සාකච්ඡා පහසු කරයි. අවසාන වශයෙන් මෑත කාලීන ආර්ථික සාමාජයීය හා පාරිසරික ලෝක සම්මන්ත්‍රණවල දී ගිවිසගත් ප්‍රතිපත්තිමය වැඩ රාමුව රටවල් මට්ටමින් වැඩ සටහන් බවට පත් කිරීමේ ක්‍රම සහ විධි පිළිබඳව අදාල ආණ්ඩුවලට ඒවායේ ඉල්ලීම පරිදි උපදෙස් දෙයි. තාක්‍ෂණික ආධාර සැපයීමෙන් එකී ක්‍ෂේත්‍රවල ජාතික විභවතා ගොඩනගා ගැනීමට උදව්දීම ද එහි කාර්යයකි.

ධරණීය සංවර්ධනය දිරි ගැන්වීම, ප්‍රමතිරි භාවයට අදාල කරුණු සහ කාන්තා අභිවෘද්ධිය, අප්‍රිකාව සහ අඩුවෙන්ම සංවර්ධිත රටවල්, සංවර්ධන ප්‍රතිපත්ති විශ්ලේෂණය, ජනගහනය, සංඛ්‍යාලේඛණ, රාජ්‍ය ආර්ථික විද්‍යාව සහ රාජ්‍ය පරිපාලනය සහ සමාජ ප්‍රතිපත්ති සහ සංවර්ධනය ආදියද දෙපාර්තමේන්තුවේ විෂය පථයට අයත්ය. සංවර්ධන ප්‍රතිපත්ති සම්පාදනයට සහ ක්‍රියාත්මක කිරීමට රාජ්‍ය නොවන සංවිධාන සහ සෙසු සිවිල් සංවිධාන නියෝජිතයන්ගෙන් ලැබෙන දායකත්වය පිළිගන්නා දෙපාර්තමේන්තුව ඒවා සමඟ සමීප සහයෝගයෙන් වැඩ කරයි.

### මහා මණ්ඩල සහ සමුළු කළමනාකරණ දෙපාර්තමේන්තුව (DGACM)

*විෂයභාර මහ ලේකම්* — *වෙන් පියෑං මහතා (චීනය)*

මහා මණ්ඩල සහ සමුළු කළමනාකරණ දෙපාර්තමේන්තුව මහා මණ්ඩලයට එහි ප්‍රධාන කමිටු සහ අතුරු ආයතනවලට, ආර්ථික හා සාමාජයීය මණ්ඩලයට සහ එහි අතුරු ආයතනවලින් බොහොමයකට, ආර්ථික හා සාමාජයීය විෂයයන් පිළිබඳ රැස්වීම්වලට සහ සමුළුවලට තාක්‍ෂණික සහ ලේකම් කාර්යාලයීය උපකාරක සේවා සලසයි.

නිව්යෝක්හි දී සහ සෙසු ස්ථානවල දී රැස්වන සියලු අන්තර් ආණ්ඩු ආයතන සහ විශේෂඥ ආයතන සඳහාත් රැස්වීම් සහ ලේඛන සේවා මෙන්ම පරිවර්තන සහ ප්‍රකාශන සේවාද එමඟින් සලසනු ලැබේ. දෙපාර්තමේන්තුවේ කාර්යයන්ට අදාල රැස්වීම්වල දී මහ ලේකම්වරයා නියෝජනය කරන දෙපාර්තමේන්තු ප්‍රධානියා-මහා මණ්ඩල සහ සමුළු කළමනාකරණ විෂයභාර මහ ලේකම්වරයා-ලොවපුරා එක්සත් ජාතීන් උදෙසා සමුළු සේවා ප්‍රතිපත්ති සහ පුරුදු සංවර්ධනය කරයි.

### පොදු තොරතුරු දෙපාර්තමේන්තුව (DPI)

*විෂයභාර මහ ලේකම්* — *ශෂී තරූර් මහතා (ඉන්දියාව)*

පොදු තොරතුරු දෙපාර්තමේන්තුව එක්සත් ජාතීන්ගේ පරමාර්ථ සහ ක්‍රියාකාරකම් පිළිබඳව ලෝක ප්‍රජාව දැනුවත් කරයි. එය එක්සත් ජාතීන්ගේ පද්ධතියේ සංකීර්ණ වැඩ සමුදාය සන්නිවේදනය පිණිස එක්සත් ජාතීන්ගේ වෙබ් අඩවිය, ගුවන් විදුලිය

සහ රූපවාහිනිය, ප්‍රවෘත්ති නිවේදන, ප්‍රකාශන, වීඩියෝ විචිත්‍රාංග විශේෂ වැඩ සටහන්, මහජන චාරිකා සහ පුස්තකාල පහසුකම් ඇතුළු බහුවිධ විශ්‍රාපන ක්‍රම සහ ව්‍යාපාර උපයෝගී කර ගනී. ලොව පුරා පිහිටුවා ඇති ප්‍රවෘත්ති කේන්ද්‍ර සහ සේවා 70ක් සහ තොරතුරු අංශයක් සහිත එක්සත් ජාතීන්ගේ කාර්යාල අටක් එහිලා සහාය කරගනු ලැබේ.

එක්සත් ජාතීන්ගේ වැඩ පිළිබඳ මනා සම්බන්ධීකරණයක් සහිත විවෘත තොරතුරු ප්‍රවාහයක් සහතික කිරීමෙන් සහ සංවිධානය පුරා සුසංගත සන්නිවේදන සංස්කෘතියක් සංවර්ධනය කිරීමෙන් එක්සත් ජාතීන්ගේ සන්නිවේදන ප්‍රතිපත්තිය හැසිරවීමේ වගකීම දෙපාර්තමේන්තු ප්‍රධානියාට පැවරී තිබේ.

ජගත් ප්‍රමුඛතාව ලැබී ඇති මාතෘකා අළලා ප්‍රවර්ධන සන්නිවේදන ව්‍යාපෘති මෙහෙයවීම, විශේෂ වැඩ සටහන් සහ ප්‍රදර්ශන සංවිධානය, නිශ්චිත විෂයයක් අරභයා මාධ්‍ය ක්‍රියාකාරකම් පිළියෙල කිරීම, මාධ්‍යකරුවන්, දැනුවත්කරන්නන් සහ තොරතුරු බෙදා හරින්නන් සඳහා වැඩමුළු සහ විශේෂ වැඩසටහන් මෙහෙවීම, සිවිල් සාමාජයීය, විශේෂයෙන් රාජ්‍ය නොවන සංවිධාන සමඟ හවුල්කාරීත්වය ගොඩනැගීම, පොදු මහජනතාව සඳහා එක්සත් ජාතීන් පිළිබඳ තොරතුරු මූලාශ්‍රයක් ලෙස සේවය කිරීම, එක්සත් ජාතීන්ගේ මූලස්ථානයේ චාරිකා ඇතුළු පොදු දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් සංවිධානය, දෙපාර්තමේන්තුවේ කාර්යයන් අතර මුල් තැන ගනී.

ප්‍රවෘත්ති සහ ජනමාධ්‍ය අංශය එක්සත් ජාතීන් සහ එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ ප්‍රවෘත්ති සහ තොරතුරු ලබාගැනීමට පහසුකම් සලසයි. ගුවන් විදුලිය සහ අන්තර්ජාලය ඔස්සේ දිනපතා ප්‍රවෘත්ති විසුරුවා හරින එය වෙනත් ගුවන් විදුලි සහ වීඩියෝ වැඩ සටහන් නිෂ්පාදනය කරන අතර එක්සත් ජාතීන්ගේ රැස්වීම් සහ විවිධ අවස්ථා වාර්තා කිරීමට මාධ්‍යකරුවනට විශේෂ අවසරය ලබාදෙමින් එවැනි රැස්වීම් රූපවාහිනියෙන් සජීව ලෙස විකාශය කරයි. ඡායාරූප ආවරණය සලසයි.

පුස්තකාල සහ තොරතුරු සම්පත් අංශය ඩැග් හැමර්ෂල්ඩ් පුස්තකාලයේ නිෂ්පාදන සහ සේවා මඟින් කෙලින්මත් එහි අන්තර්ජාල අඩවිය සහ ලොවපුරා පිහිටි තුන්සිය පනහකට අධික තැන්පතු පුස්තකාල මගිනුත් එක්සත් ජාතීන්ගේ ලේඛන හා ප්‍රකාශන පරිහරණයට පහසුකම් සලසයි. සිතියම් සේවාවන්ද සපයන එය ප්‍රකාශන සහ විකුණුම් වැඩ සටහන් කළමනාකරණය කරයි.

දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කෙරෙන මහ ලේකම්වරයාගේ ප්‍රකාශකයාගේ කාර්යාලය මහ ලේකම්ගේ මාධ්‍ය සම්බන්ධ වැඩ සැලසුම් කිරීම භාරව සිටී. කෙලින්ම මහ ලේකම්වරයාට වාර්තා කරන ප්‍රකාශකයා දිනපතා පදනමින් මාධ්‍යවේදීන් හමුවී විස්තර සපයයි.

# කළමනාකරණ දෙපාර්තමේන්තුව (DM)

*විෂයභාර මහ ලේකම්* *කැතරින් බර්ටිනි මිය (එක්සත් ජනපදය)*

කළමනාකරණ දෙපාර්තමේන්තුව ලේකම් කාර්යාලයේ ප්‍රධාන ආයතන සියල්ලට මූල්‍ය, මානව සම්පත් සහ උපකාරක සේවා යන කළමනාකරණ ක්ෂේත්‍ර තුනෙහි උපාය මාර්ගික ප්‍රතිපත්ති උපදේශ සහ කළමනාකරණ උදව් සපයයි. ඒවා වැඩ සටහන් සැලසුම්කරණ අයවැය සහ ගිණුම් : මානව සම්පත් කළමනාකරණ සහ මධ්‍යම උපකාරක සේවා, කාර්යාලවල අධීක්ෂණය යටතේ සිදුවෙයි.

දෙපාර්තමේන්තුව ලේකම් කාර්යාලයේ වඩා උසස් කළමනාකරණ ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම, කාර්ය මණ්ඩල කළමනාකරණය සහ පුහුණුව වැඩ සටහන් සැලසුම්කරණය, අයවැය සම්පාදනය, මූල්‍ය සහ මානව සම්පත් කළමනාකරණය සහ තාක්ෂණික නව විධික්‍රම සොයා ගැනීම පිළිබඳ වගකීම භාරව සිටී. එය මහා මණ්ඩලයේ 5 වැනි කමිටුවට (පරිපාලන සහ අයවැය) මෙන්ම වැඩ සටහන් සහ සම්බන්ධීකරණ කමිටුවට ද තාක්ෂණික සේවා සලසයි.

දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා-කළමනාකරණ විෂය භාර මහ ලේකම් - සංවිධානයේ මධ්‍යකාලීන සැලැස්ම සහ දෙවාර්ෂික අයවැය පිළියෙල කිරීම සඳහා ප්‍රතිපත්ති උපදෙස් සැපයීම, සම්බන්ධීකරණය සහ මඟපෙන්වීම සිදු කරයි. කළමනාකරණයට අදාල කරුණුවල දී මහ ලේකම්වරයා නියෝජනය කරන ඔහු ලේකම් කාර්යාලය පුරා මතුවන කළමනාකරණ ගැටලු නිරීක්ෂණය කරයි. යුක්තිය පසිඳලීමේ අභ්‍යන්තර පද්ධතිය පිළිබඳ සමස්ත අධීක්ෂණය ඔහුට පැවරී තිබේ.

## ඉරාක වැඩ සටහනේ කාර්යාලය

*විෂයභාර මහ ලේකම්* *බෙනොන් සෙවාන් මහතා (සයිප්‍රස්)*
*විධායක අධ්‍යක්ෂ*

ඉරාක වැඩ සටහනේ කාර්යාලය, කුවේටය ආක්‍රමණය කරනු ලැබීමෙන් පසු ආරක්ෂක මණ්ඩලය 1990 දී ඉරාකයට පැන වූ නිරවශේෂ සම්බාධක නිසා පීඩාවට පත් ඉරාක ජනතාවගේ මානුෂවාදී අවශ්‍යතා සපුරාලනු වස් ආරක්ෂක මණ්ඩලය විසින් 1995 දී ස්ථාපිත ''ආහාර සඳහා තෙල්'' (Oil-for-food) වැඩ සටහන කළමනාකරණය භාරව සිටී. වැඩ සටහන යටතේ ප්‍රථම තෙල් තොගය 1996 දී අපනයනය කළ අතර ප්‍රථම ආහාර නැව් ඉන් තුන් මසකට පසුව ලඟා විය. එතැන් සිට ඩොලර් බිලියන 4ක් වටිනා ටොන් මිලියන 10කට වැඩි ආහාර ද්‍රව්‍ය සහ ඩොලර් මිලියන 720ක් වටිනා ඖෂධ සහ වෛද්‍ය සැපයුම් වැඩ සටහන යටතේ ඉරාකයට යවනු ලැබීය. ඒ හැර ජලය, සනීපාරක්ෂාව, කෘෂිකර්මය, අධ්‍යාපනය, යටිතල පහසුකම් සහ බිම් බෝම්බ ඉවත් කිරීම සඳහා ඩොලර් මිලියන 800ක් වටිනා මානුෂවාදී සැපයුම් ඉරාකය වෙත ලැබිණ.

## එක්සත් ජාතීන්ගේ ආරක්‍ෂක සම්බන්ධීකාරක කාර්යාලය (UNSECOORD)

*විෂයභාර මහ ලේකම්*
*එක්සත් ජාතීන්ගේ*
*ආරක්‍ෂක සම්බන්ධීකාරක*

*තුන් මියාත් මහතා*
*(මියැන්මාර්)*

එක්සත් ජාතීන්ගේ ආරක්‍ෂක සම්බන්ධීකාරක කාර්යාලය ඕනෑම හදිසි තත්ත්වයක් හමුවේ එක්සත් ජාතීන්ගේ සුසංගත ප්‍රතිචාරය සහතික කරනු පිණිස මහ ලේකම්වරයා සහ එක්සත් ජාතීන්ගේ ආයතන, වැඩසටහන් සහ අරමුදල් ප්‍රධානීන් වෙනුවෙන් ක්‍රියා කරයි. ආරක්‍ෂාව හා සම්බන්ධ සියලු ප්‍රතිපත්ති හා පටිපාටිමය කරුණු පිළිබඳ වගකීම් භාර එය මහ ලේකම්වරයා වෙනුවෙන්, සේවක පිරිස් ඉවත් කිරීමට අදාළ සියලු තීරණ ගනී.

කාර්යාලය සමස්ත එක්සත් ජාතීන්ගේ පද්ධතියේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ හා සුදුසුකම් ඇති පවුල් සාමාජිකයන්ගේ ආරක්‍ෂාව හා නිරුපද්‍රිත බව සහතික කරනු වස් සවිස්තරාත්මක නිර්දේශ පිළියෙළ කරයි; අන්තර් ආයතන ආරක්‍ෂක සහ නිරුපද්‍රිතතා වැඩසටහන් සැලසුම්කොට ක්‍රියාත්මක කරමින් සම්බන්ධීකරණය සිදු කරයි; අන්තර් ආයතන සහයෝගිතාව පිළිබඳ කේන්ද්‍රීය ආයතනය ලෙස සේවය කරයි.

සම්බන්ධීකරණය පිළිබඳ පරිපාලන කමිටුවේ සියලු සාමාජිකයන් විසින් අන්තර් ආයතන පදනමක් මත කාර්යාලයට අරමුදල් සැපයෙයි.

## කලාපීය කොමිෂන් සභා

මහ ලේකම්වරයාගේ අධිකාරය යටතේ ක්‍රියාත්මක වන එක්සත් ජාතීන්ගේ කලාපීය කොමිෂන් සභා ආර්ථික හා සාමාජයීය මණ්ඩලය වෙත වාර්තා කරයි. ඒ ඒ කලාපයේ ආර්ථික සංවර්ධනය අත්කර ගැනීමට ඉවහල් වන ක්‍රියාමාර්ගවලට මුල පිරීම එකී කලාපයේ රටවල් අතර සහ ලෝකයේ සෙසු රටවල් සමඟ ඔවුන්ගේ ආර්ථික සබඳතා ශක්තිමත් කිරීම ඒවාට පැවරී තිබේ. ඒවාට අරමුදල් සැපයෙන්නේ එක්සත් ජාතීන්ගේ නිත්‍ය අයවැයෙනි.

### අප්‍රිකාව පිළිබඳ ආර්ථික කොමිසම (ECA)

1958 දී ස්ථාපිත අප්‍රිකානු ආර්ථික කොමිසම මහාද්වීපයේ ආර්ථික හා සාමාජයීය අංශවල වර්ධනයට අනුබල දෙන ක්‍රියාකාරකම්වල නිරත වෙයි. සාමාජික රටවල් 53 අතර, විශේෂයෙන් නිෂ්පාදන, වෙළෙඳ, මුදල්. යටිතල පහසුකම් සහ ආයතනික ක්ෂේත්‍රවල, ආර්ථික සහයෝගිතාව සහ ඒකාබද්ධතාව නැංවීමේ ප්‍රතිපත්තිවලට සහ උපාය මාර්ගවලට එය අනුබල දෙයි. ආර්ථික හා සාමාජයීය තොරතුරු සහ විශ්ලේෂණ සම්පාදනය, ආහාර සුරක්ෂිතතාව සහ ධරණීය සංවර්ධනය දිරි ගැන්වීම,

සංවර්ධන කළමනාකරණය ශක්තිමත් කිරීම, සන්නිවේදන විප්ලවය සංවර්ධනය සඳහා උපයෝගි කොට ගැනීම සහ කලාපීය සහයෝගිතාව සහ අනුකලනය දිරිගැන්වීම කෙරෙහි කොමිසම අවධානය යොමු කර ඇත. සංවර්ධන තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහි ස්ත්‍රීන්ගේ සහභාගිත්වය නැංවීමෙන් සහ ස්ත්‍රීන් සහ පුමනිටි සමානාත්මතාව ජාතික සංවර්ධනයේ මූලිකාංග බව සහතික කිරීමෙන් ස්ත්‍රීන්ගේ තත්ත්වය වැඩිදියුණු කිරීමට විශේෂ ප්‍රමුඛත්වය දී තිබේ.

Executive Secretary : Mr. K. Y. Amoako (Ghana)
Address : Africa Hall, P. O. Box 3001, Addis Ababa, Ethiopia
Telephone : (251 1) 51 72 00 ; Fax : (251 1) 51 44 16
E-mail : ecainfo@un.org
Internet : www.un.org/Depts/eca

## යුරෝපා ආර්ථික කොමිසම (ECE)

1947 දී ස්ථාපිත යුරෝපා ආර්ථික කොමිසම උතුරු අමෙරිකානු, යුරෝපීය හා මධ්‍යම ආසියානු රටවල් සිය ආර්ථික සහයෝගිතා මෙවලම් හැඩ ගැස්වීමට එකට එක් වූ වේදිකාවයි. සාමාජික රටවල් 55කින් සමන්විත කොමිසමට ඊශ්‍රායලය ද අයත්ය. පරිසරය, ප්‍රවාහනය, සංඛ්‍යාලේඛන, වෙළෙඳාම පහසු කිරීම, කර්මාන්ත, කෘෂිකර්මය, වන කර්මාන්තය, නිවාස ඉදිකිරීම් සහ ක්‍රම සම්පාදනය ප්‍රමුඛ වැඩ ක්ෂේත්‍ර වේ. ගිවිසුම් සාකච්ඡා කෙරෙන සහ උපකාරී ක්‍රියාකාරකම් පිළියෙළ කරන වේදිකාවද එයයි. සිය සාමාජික රටවල ප්‍රතිපත්ති සහ පුරුදු සුසංයෝගය කොමිසමේ ප්‍රධාන පරමාර්ථය වන්නේය. එවැනි සුසංයෝගයක් ආර්ථික හුවමාරුව, ආයෝජන සහ ප්‍රවාහන ක්‍රම ඒකාබද්ධ කිරීම පහසු කිරීමට මෙන්ම පාරිසරික ක්‍රියාමාර්ග වඩාත් ඵලදායී බවට පත් කිරීමට ද ඉවහල් වෙයි.

Executive Secretary : Ms. Brigita Schmognerova (Slovakia)
Address : Palais des Nations, 121 1 Geneva 10, Switzerland
Telephone : (41 22) 917 44 44 ; Fax : (41 22) 917 05 05
E-mail : info.ece@unece.org
Internet : www.unicc.org/unece

## ලතින් අමෙරිකානු සහ කැරිබියානු ආර්ථික කොමිසම (ECLAC)

1948 දී ස්ථාපිත කොමිසම කලාපයේ ආර්ථික හා සාමාජයීය සංවර්ධනය අරමුණු කොටගත් ප්‍රතිපත්ති සම්බන්ධීකරණය ප්‍රධාන කාර්යය කොටගනී. එය කලාපීය සහ ජාතික සංවර්ධන ක්‍රියාදාමයන් පිළිබඳ පර්යේෂණ සහ විශ්ලේෂණ අරභයා සාමාජික රටවල් 41 සහ ආශ්‍රිත සාමාජිකයන් 7 දෙනා සමඟ සහයෝගයෙන් ක්‍රියා කරයි. රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග යෝජනා කිරීම, ඇගයීම සහ පසු විපරම මෙන්ම විශේෂිත තොරතුරු ක්ෂේත්‍රවල සහයෝගිතාව ද එහි මෙහෙවරට අයත්ය.

කොමිසම, කෘෂිකාර්මික සංවර්ධනය, ආර්ථික හා සාමාජයීය ක්‍රම සම්පාදනය, කාර්මික තාක්‍ෂණ විද්‍යාත්මක සහ ව්‍යාවසායකත්ව සංවර්ධනය, අන්තර්ජාතික වෙළෙඳාම, කලාපීය අනුකලනය සහ සහයෝගිතාව, ආයෝජනය සහ මූල්‍ය සම්පාදනය, සමාජ සංවර්ධනය හා සාධාරණය, සංවර්ධනයෙහි ස්ත්‍රී සහභාගීත්වය, ස්වාභාවික සම්පත් සහ යටිතල පහසුකම්, පරිසරය සහ ජනාවාස, සංඛ්‍යාලේඛන, පරිපාලන කළමනාකරණය, ජනගහන විද්‍යාව හා ජනගහන ප්‍රතිපත්ති වැනි ක්‍ෂේත්‍රවල ජාතික කලාපීය සහ අන්තර්ජාතික සහයෝගිතාව පවත්වා ගනී.

පර්යේෂණ, පුහුණු පහසුකම් සැලසීම සහ කලාපීය සැලසුම් සේවා අතර සහයෝගිතාව ශක්තිමත් කිරීම සිය කාර්යභාරය කොටගත්, ආර්ථික හා සාමාජයීය ක්‍රම සම්පාදනය සඳහා ලතින් අමෙරිකානු සහ කැරිබියානු ආයතනය කොමිසමට අයත් වෙයි. මෙක්සිකෝව සහ මධ්‍යම අමෙරිකාව සහ කැරිබියානු ප්‍රදේශ සඳහා උප කලාපීය මූලස්ථාන දෙකක් සහ ජාතික කාර්යාල 5ක් (ආජන්ටිනාව, බ්‍රසීලය, කොලොම්බියාව, උරුගුවේ සහ එක්සත් ජනපදය යන රටවල) පිහිටුවා ඇත.

Executive Secretary : Mr. Josè Antonio Ocampo (Colombia)
Address : Edificio Naciones Unidas, Avenida Dag Hammarskjöld s/n, Casilla 179-D, Santiago, Chile.
Telephone : (56 2) 210 2000/206 1519; Fax : (56 2) 208 0252/228 1947
E-mail : dpisantiago@eclac.cl
Internet : www.ec;ac/cl, www.eclac.org

**ආසියා ශාන්තිකර ආර්ථික හා සාමාජයීය කොමිසම (ESCAP)**

එස්කැප් යනුවෙන් වඩාත් ප්‍රකට මේ කොමිසම 1947 දී පිහිටුවනු ලැබීය. කලාපීය ආර්ථික හා සාමාජයීය ගැටලුවලට විසඳුම් සෙවීම එහි කාර්යභාරය වෙයි. සියලු ආසියා ශාන්තිකර රටවල් උදෙසා ඇති එකම අන්තර් ආණ්ඩු වේදිකාව ලෙස සුවිශේෂ කාර්යභාරයක් ඉටු කරන එය ලෝක ජනගහනයෙන් සියයට 60ක් පමණ නියෝජනය කරන සාමාජික රාජ්‍යයන් 51කින් සහ ආශ්‍රිත සාමාජික රාජ්‍යයන් 9කින් නිර්මාණය වී තිබේ. කොමිසම ආර්ථික හා සාමාජයීය සංවර්ධනය උදෙසා ආණ්ඩුවලට තාක්‍ෂණික උදවු සපයයි. ආධාර ලැබෙන්නේ ආණ්ඩුවලට සැපයෙන සෘජු උපදේශක සේවා, කලාපීය අත්දැකීම් හුවමාරුව හා පුහුණුව, තොරතුරු සම්පාදනය, ප්‍රකාශන සහ අන්තර් ආණ්ඩු සහයෝගිතා වැඩසටහන් ස්වරූපයෙනි. එස්කැප් ආයතනය ආර්ථික වෘද්ධිය උත්තේජනය කිරීම, ආර්ථික සාමාජයීය තත්ත්වය නැංවීම, නවීන සමාජයකට සුදුසු පදනම ගොඩනැගීම අරමුණු කොටගත් වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාවට නංවයි. කෘෂිකාර්මික සංවර්ධනය, සංඛ්‍යාලේඛන සහ තාක්‍ෂණ පැවරුම් විෂයය කොටගත් කලාපීය පර්යේෂණ හා අභ්‍යාස ආයතන තුනක් ද ඊට අයත්ය. අන්තර් කලාපීය වෙළෙඳාම හා ආයෝජනය, තාක්‍ෂණ විද්‍යා දැනුම් හුවමාරුව, පෞද්ගලිකකරණය සහ ව්‍යවසායකත්වය, පරිසරය, නාගරීකරණය, දිළිඳුකම පිටු

දැකීම, මත්ද්‍රව්‍ය පාලනය, ජනගහනය, සාමාජයීය සංවර්ධනය සහ ශ්‍රම සංක්‍රමණය කොමිසමේ වත්මන් ප්‍රමුඛතා ක්ෂේත්‍ර අතර වෙයි.

Executive Secretary : Mr. Kim Hak-Su (Republic of Korea)
Address : United Nations Building, Rajadamnern Avenue, Bangkok, Thailand
Telephone : (662) 288 1234 ; Fax : (662) 288 1000
E-mail : [surname].unescap@un.org
Internet : www.unescap.org

### බටහිර ආසියානු ආර්ථික හා සාමාජයීය කොමිසම (ESCWA)

1973 දී ස්ථාපිත කොමිසම කලාපීය ආර්ථික සහයෝගිතාව සහ අනුකලනය දිරිගැන්වීමෙන් බටහිර ආසියානු රටවල ආර්ථික හා සාමාජයීය සංවර්ධනය උදෙසා ඒකාබද්ධ ක්‍රියාමාර්ගවලට පහසුකම් සලසයි. සාමාජික රාජ්‍යයන් 13කින් සමන්විත කොමිසම කලාපය තුළ එක්සත් ජාතීන්ගේ පද්ධතියට අයත් ප්‍රධාන ආර්ථික හා සාමාජයීය සංවර්ධන වේදිකාව වන්නේය. ආර්ථික සංවර්ධනය, සාමාජයීය සංවර්ධනය, කෘෂිකර්මය, කර්මාන්ත, ස්වාභාවික සම්පත්, පරිසරය, ප්‍රවාහනය, සන්නිවේදනය සහ සංඛ්‍යාලේඛන වැනි ක්ෂේත්‍ර එහි වැඩසටහන්වලින් ආවරණය කෙරේ.

Executive Secretary : Ms. Merwat M. Tallawy (Egypt.)
Address : P. O. Box 11-8575, Raid el-Soth Square, Beirut, Lebanon
Telephone : (961) 198 1301 ; Fax : (961) 198 1516
E-mail : Unescwa@escwa.org.lb
Internet : www.escwa.org.lb

## එක්සත් ජාතින්ගේ විනිශ්චය සභා

### පැරණි යුගොස්ලාවියාව පිළිබඳ අන්තර්ජාතික අපරාධ යුක්ති විනිශ්චය සභාව (ICTY)

ආරක්ෂක මණ්ඩලය 1993 දී ස්ථාපනය කළ විනිශ්චය සභාවට පැවරී ඇති කාර්යය 1991 සිට පැරණි යුගොස්ලාවියාවේ සිදු කරන ලද අන්තර්ජාතික මානුෂවාදී නීතිය බරපතල ලෙස උල්ලංඝණය කිරීම්වලට වගකිව යුතු පුද්ගලයන්ට විරුද්ධ නඩු විභාග කිරීමයි. විනිශ්චයකාරවරුන් 14 දෙනකුගෙන් සමන්විත එහි කාර්ය මණ්ඩලය 1,011කි. එහි 2000 වසරේ අයවැය ඩොලර් මිලියන 96කි.

විනිශ්චය සභාව ආරම්භ කළ දා සිට 94 දෙනකුට ප්‍රසිද්ධියේ අධි චෝදනා නගන ලදී. 2000 ජූලි වන විට විත්තිකරුවන් 38 දෙනෙක් නඩු විභාග සඳහා යොමු කරනු ලැබ සිටි අතර 26 දෙනෙක් නිදැල්ලේ පසු වූහ. චූදිතයන්ගෙන් දෙදෙනෙක් වරද පිළිගත්හ. 13 දෙනෙක් ප්‍රථම වටයේදීම වැරැදිකරුවන් ලෙස තීන්දු කෙරිණි. අභියාචනා

කිරීමෙන් පසු සිව් දෙනෙක් වැරැදිකරුවෝ වූහ. දෙදෙනකු නිදහස් කෙරිණ. තීන්දු නවයකට එරෙහිව අභියාචනා කර ඇත.

President : Jude Clauda Jorda (France)
Chief Prosecutor : Mrs. Carla Del Ponte (Switzerland)
Registrar : Mr. Henry Hans Holthuis (Netherlands)
Headquarters : Churchillplein 1, 2517 JW, The Hague, the Netherlands
Telephone : (31 70) 416 5233 ; Fax : (31 70) 512 5355
Internet : www.un.org/icty

**රුවන්ඩාව පිළිබඳ අන්තර්ජාතික අපරාධ යුක්ති විනිශ්චය සභාව (ICTR)**

ආරක්‍ෂක මණ්ඩලය විසින් 1994 දී ස්ථාපිත විනිශ්චය සභාවේ කාර්යය 1994 වසරේ රුවන්ඩාවේ සිදු කරන ලද වර්ග සංහාරයට සහ අන්තර්ජාතික මානුෂවාදී නීතිය බරපතල ලෙස උල්ලංඝනය කිරීම්වලට වගකිව යුතු පුද්ගලයනට එරෙහි නඩු විභාග කිරීමයි. එය එකකට විනිශ්චයකරුවන් තිදෙනකු අයත් විනිශ්චය මණ්ඩල තුනකින් සහ විනිශ්චයකාරවරුන් 5 දෙනෙකුගෙන් සමන්විත අභියාචනා මණ්ඩලයකින් නිර්මාණය වී තිබේ. කාර්ය මණ්ඩලය 729කි. 2000 වසරේ අයවැය ඩොලර් මිලියන 79ක් විය. 2000 වනවිට 40කට වැඩි පිරිසක් අත්අඩංගුවට ගැනීමට සමත් වූ අධිකරණය ඔවුන්ගෙන් ගණනාවකට දඬුවම් පැමිණ විය.

President : Jude Ms. Navanethem Pillay (South Africa)
Chief Prosecutor : Mrs. Carla Del Ponte (Switzerland)
Registrar : Adama Dieng (Senegal)
P. O. Box 6016, Arusha, Tanzania
Telephone (212) 963 2850 or (255) 27 50 43 69/72
Fax (212) 963 2848 or (255) 27 50 40 00 or 50 43 73
Internet : www.ictr.un.org

## එක්සත් ජාතීන්ගේ වැඩසටහන් සහ වෙනත් මණ්ඩල

### වෙළෙඳාම හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුව (UNCTAD)

UNCTAD
United Nations
Conference on Trade and
Development

ස්ථිර අන්තර් ආණ්ඩු මණ්ඩලයක් ලෙස 1964 දී ස්ථාපිත වෙළෙඳාම හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුව වෙළෙඳාම හා සංවර්ධනය පිළිබඳ ක්ෂේත්‍රයේ

මහා මණ්ඩලයේ ප්‍රධාන ආයතනය වෙයි. විශේෂයෙන් සංවර්ධනය වන රටවල වෙළෙඳාම හා ආර්ථික සංවර්ධනය වේගවත් කිරීම ඊට පැවරී තිබේ.

වෙළෙඳාම, මූල්‍ය සම්පාදනය, තාක්‍ෂණය, ආයෝජනය සහ ධරණීය සංවර්ධනය යන ක්ෂේත්‍රවල සංවර්ධනය හා ආශ්‍රිත විෂයයන් ඒකාබද්ධව සළකා ක්‍රියා කිරීම භාර වී ඇති එක්සත් ජාතීන්ගේ පද්ධතියට අයත් කේන්ද්‍රීය ආයතනය මෙය වන්නේය. සංවර්ධනය වන රටවල වෙළෙඳ ආයෝජන හා සංවර්ධන ඉඩ ප්‍රස්ථා උපරිම කිරීම, ගෝලීයකරණය තුළින් උද්ගතවන අභියෝග ජය ගැනීමට සහ සමානාත්මතා පදනමක් මත ලෝක ආර්ථිකයට බද්ධවීමට ඔවුනට උදව් කිරීම එහි ප්‍රධාන අරමුණු වෙති. සමුළුව සිය අරමුණු සපුරා ගැනීමට ක්‍රියා කරන්නේ පර්යේෂණ සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ, අන්තර් ආණ්ඩු සාකච්ඡා, තාක්‍ෂණික සහයෝගිතාව සහ සිවිල් සමාජය සහ ව්‍යාපාරික අංශය සමඟ අන්තර් ක්‍රියාකාරිත්වය මගිනි.

අන්ක්ටාඩ් ඉහළම ප්‍රතිපත්ති සම්පාදන මඩුල්ල සාමාජික රාජ්‍ය 190න් සැදුම්ලත් සහ සෑම සිව් වසරකටම වරක් රැස්වෙන සම්මේලනයකි. 10 වැනි සමුළුව 2000 දී බැංකොක් හි පවත්වනු ලැබීය. ගිවිසගත් ප්‍රමුඛතාවලට අනුකූලව සමස්ත අන්ක්ටාඩ් ක්‍රියාකාරකම් මෙහෙයවීමේ වගකීම භාර විධායක ආයතනය වෙළෙඳ හා සංවර්ධන මණ්ඩලයයි.

ඩොලර් මිලියන 50ක් පමණ වන අන්ක්ටාඩ් වාර්ෂික මෙහෙයුම් අයවැය සඳහා මුදල් ලැබෙන්නේ එක්සත් ජාතීන්ගේ නිත්‍ය අයවැයෙනි. අයවැයෙන් බාහිර සම්පත් වලින් අරමුදල් සැපයෙන තාක්‍ෂණික සහයෝගිතා වැඩසටහන් සඳහා වියදම ඩොලර් මිලියන 24ක් පමණය. අන්ක්ටාඩ් කාර්ය මණ්ඩලය 394 දෙනෙකි.

Secretary-General : Mr. Rubens Ricupero (Brazil)
Headquarters : Palais des Nations, CH-1211 Geneva 10, Switzerland
Telephone : (41 22) 907 1234 ; Fax : (41 22) 907 0043
E-mail : ers@unctad.org.
Internet : www.unctad.org

## අන්තර්ජාතික වෙළෙඳ කේන්ද්‍රය (ITC)

ITC
ITC
International
Trade Centre
UNCTAD/WTO

අන්තර්ජාතික වෙළඳ කේන්ද්‍රය අන්තර්ජාතික වෙළෙඳ සංවර්ධනයේ මෙහෙයුම් සහ ව්‍යවසායකත්ව පාර්ශවයන් සඳහා අන්ක්ටාඩ් සහ ලෝක වෙළෙඳ සංවිධානය

විසින් ස්ථාපනය කර ඇති තාක්‍ෂණ සහයෝගිතා ආයතනයයි. වෙළෙඳ ප්‍රවර්ධනයෙහි තාක්‍ෂණ සහයෝගිතාව සඳහා වන එක්සත් ජාතීන්ගේ කේන්ද්‍රීය ආයතනය වන වෙළෙඳ කේන්ද්‍රය සංවර්ධනය වන රටවල් සහ සංක්‍රාන්ති ආර්ථිකයන් සහිත රටවල් සමඟ එක්ව ඔවුන්ගේ අපනයන ප්‍රසාරණයට සහ ආනයන මෙහෙයුම් වැඩිදියුණුවට ඉවහල් වන ඵලදායි වෙළෙඳ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

වෙළෙඳ කේන්ද්‍රය ලෝක වෙළෙඳ සංවිධානයේ සහ අන්ක්ටාඩ් මඟින් ක්‍රියාත්මක එක්සත් ජාතීන්ගේ ඒකාබද්ධ අතුරු අවයවයකි. මූලස්ථානයේ කාර්යයන් සඳහා එක්සත් ජාතීන් සහ WTO වෙතින් අරමුදල් සැපයෙයි. තාක්‍ෂණික සහයෝගිතා වැඩසටහන්වලට අරමුදල් ලැබෙන්නේ UNDP වෙතින් සහ ස්වේච්ඡා දීමනාවලිනි. වාර්ෂික අයවැය ඩොලර් මිලියන 33ක් පමණ වෙයි. වෙළෙඳ කේන්ද්‍ර කාර්ය මණ්ඩලය 180කි.

Executive Director : Mr. J. Dénis Bélisle (Canada)
Headquarters : Palais des Nations, CH-1211 Geneva 10, Switzerland
Telephone : (41 22) 730 01 11; Fax : (41 22) 733 44 39
E-mail : itcreg@intracen.org
Internet : www.intracen.org

## මත්ද්‍රව්‍ය පාලන සහ අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය (UNODC)

UNITED NATIONS
Office on Drugs and Crime

මත්ද්‍රව්‍ය පාලනය, අපරාධ නිවාරණය සහ අන්තර්ජාතික ත්‍රස්තවාදය හා අදාළ අන්තර් සම්බන්ධිත ගැටලු සමනය කිරීමට එක්සත් ජාතීනට ඇති හැකියාව පුළුල් කරනු වස් 1997 දී මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ කාර්යාලය පිහිටුවනු ලැබීය. කලින් මෙය මත්ද්‍රව්‍ය පාලන සහ අපරාධ නිවාරණ කාර්යාලය (ODCCP) ලෙස හැඳින්විණ.

* එක්සත් ජාතීන්ගේ අන්තර්ජාතික මත්ද්‍රව්‍ය පාලන වැඩසටහන (UNDCP); සහ

* අපරාධ නිවාරණය සඳහා අන්තර්ජාතික කේන්ද්‍රය (CICP) එක් වී එය නිර්මාණය වී ඇත.

UNDCP එක්සත් ජාතීන්ගේ සියලු මත්ද්‍රව්‍ය පාලන ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය සහ මෙහෙයවීම භාර කේන්ද්‍රීය ආයතනයයි. මේ ක්ෂේත්‍රයේ විශේෂ දැනුම්

භාණ්ඩාගාරයක් ලෙස සේවය කරන එය මත්ද්‍රව්‍ය පාලනය සඳහා සාමාජික රාජ්‍යයනට තාක්‍ෂණික උපදෙස් සපයයි. එය ජාතික කලාපීය හා ගෝලීය මට්ටම්වලින් සිය මෙහෙවර ඉටු කරන්නේ ක්ෂේත්‍ර කාර්යාල පද්ධතියක් මගිනි.

CICP අපරාධ නිවාරණ සහ අපරාධ යුක්ති විනිශ්චය ක්ෂේත්‍රයේ ක්‍රියාකාරකම් භාර මධ්‍යම ආයතනයයි. පාර ජාතික සංවිධානාත්මක අපරාධ, නීති විරෝධී මිනිස් වෙළෙඳාම, මූල්‍ය අපරාධ සහ ත්‍රස්තවාදය මර්දනය කෙරෙහි එය විශේෂ අවධානය යොමු කරයි.

2000-2001 වසර සඳහා අයවැය ඩොලර් මිලියන 166.2ක් වූ අතර ඉන් මිලියන 154.9ක් UNDCP සඳහා ද, මිලියන 11.3ක් CICP සඳහා ද වෙන්විය. UNDCP සම්පත්වලින් සියයට 90ක් ද, CICP සම්පත්වලින් සියයට 49ක් ද ලැබුණේ ස්වේච්ඡා ප්‍රදානවලිනි. ඉතිරිය එක්සත් ජාතීන්ගේ නිත්‍ය අයවැයෙනි.

Executive Director : Mr. Antonio Maria Costa (Italy)
Headquarters : Vienna International Centre, Wagramerstrasse 5.
P. O. Box 500, A-1400 Vienna, Austria
Telephone : (43 1) 26060 0; Fax : (43 1) 26060 5866
E-mail : odccp@odccp.org
Internet : www.odccp.org

## එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන (UNEP)

UNEP
United Nations
Environment Programme

එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන 1972 දී ස්ථාපනය කෙරිණ. අනාගත පරම්පරාවන්ගේ වුවමනාවන් කැප කරන්නේ නැතිව සිය ජීවන තත්ත්වය වැඩිදියුණු කරගැනීම සඳහා ජාතීන්ට සහ ජනතාවන්ට ඉඩ සැලසීමෙන් පරිසරය රැක ගැනීම සඳහා නායකත්වය දීමත් හවුල්කාරිත්වය දිරි ගැන්වීමත් එහි මෙහෙවර වන්නේය.

පරිසර ක්ෂේත්‍රයේ එක්සත් ජාතීන්ගේ ප්‍රධාන ආයතනය වන පරිසර වැඩසටහන ලෝක පරිසර න්‍යාය පත්‍රය සකසයි. එක්සත් ජාතීන්ගේ පද්ධතිය තුළ ධරණීය සංවර්ධනයේ පාරිසරික පැතිමානය ක්‍රියාත්මක කිරීමට රුකුල් දෙයි. ලෝක පරිසරය පිළිබඳ ප්‍රමාණික උපදේශකයකු ලෙස සේවය කරයි.

රටවල් 58කින් සැදුම්ලත්, වාර්ෂිකව රැස්වන පාලන මණ්ඩලයක් විසින් වැඩ සටහන පාලනය කරනු ලැබේ. වැඩසටහන් සඳහා අරමුදල් සැපයෙන්නේ ආණ්ඩුවල ස්වේච්ඡා, ප්‍රදාන භාර අරමුදල් වෙතින් ලැබෙන දීමනා සහ එක්සත් ජාතීන්ගේ නිත්‍ය අයවැයෙන් කෙරෙන කුඩා ප්‍රතිපාදනයක් එක්වී සැදුම්ලත් පරිසර අරමුදල වෙතිනි. අරමුදලේ 2000-2001 අයවැය ඩොලර් මිලියන 120ක් විය. පරිසර වැඩ සටහනේ කාර්ය මණ්ඩලය 680කි.

Executive Director : Mr. Klaus Toepfer (Germany)
Headquarters : United Nations Avenue, Gigiri, Nairobi, Kenya
Tele. : (254 2) 621 234, 520 602; Fax : (254 2) 226 886 or 226 895
E-mail : cpiinfo@unep.org
Internet : www.unep.org

## එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP)

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ භාර ප්‍රධාන ආයතනයයි. ලොවපුරා විහිදුනු කාර්යාල ජාලයක් සහිත, වාර්ෂිකව ඩොලර් බිලියන 2.3ක මූල්‍ය සම්පත් කළමනාකරණයෙහි නිරත එය එක්සත් ජාතීන්ගේ පද්ධතිය තුළ විශාලතම සංවර්ධන ආධාර සපයන්නා බවට පත්ව සිටී.

නිවැරදි ප්‍රතිපත්ති උපදෙස් සපයන සංවර්ධන වැඩසටහන සාධාරණ ආර්ථික වෘද්ධියට ඉවහල් වන ආයතනික හා මානව ශක්‍යතා ගොඩනැගීමට උපකාරී වේ. ගෝලීයකරණය විසින් ජනිත කර ඇති ඉඩ ප්‍රස්ථා සහ අභියෝග හමුවේ ආධාර සම්පත් වලින් හැකි උපරිම ප්‍රයෝජන ගනු පිණිස එය රාජ්‍ය පෞද්ගලික දෙඅංශයේ හවුල්කරුවන් සමඟ වැඩ කරයි. සමාජයේ සෑම මට්ටමකම වගකීම සහිත රාජ්‍ය පාලනය ප්‍රවර්ධනය කිරීමටත් ධරනීය සංවර්ධනයට අතිශයින් වැදගත් ක්‍රියාකාරකම් සඳහා සන්ධාන ගොඩ නැගීමටත් එය කැප වී සිටී.

* ස්ත්‍රීන් සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල (UNIFEM),

* එක්සත් ජාතීන්ගේ ස්වේච්ඡා සේවක වැඩසටහන (UNV),

* එක්සත් ජාතීන්ගේ ප්‍රාග්ධන සංවර්ධන අරමුදල (UNCDF).



8-CM 4360

ඇතුළු විශේෂ අරමුදල් සහ වැඩසටහන් UNDP ය විසින් පාලනය කෙරේ.

සංවර්ධන වැඩසටහන පාලනය වන්නේ සංවර්ධිත සහ සංවර්ධනය වන රටවල් දෙ වර්ගයම නියෝජනය කැරෙන 36 සාමාජික විධායක මණ්ඩලයක් මගිනි. වාර්ෂික මානව සංවර්ධන වාර්තාව එහි ප්‍රධාන පෙළේ ප්‍රකාශනයකි.

Administrator : Mr. Mark Malloch Brown (United Kingdom)
Headquarters : 1 UN Plaza, New York, NY 10017, USA
Tele. : (1212) 906 5000; Fax : (1212) 906 5001
E-mail : mark.malloch.brown@undp.org
Internet : www.undp.org

## ස්ත්‍රීන් සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල (UNIFEM)

UNIFEM
United Nations
Development Fund for
Women

ස්ත්‍රීන් සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල ස්ත්‍රීන් බලගැන්වීම සහ පුම්තිරි සාමානාත්මතාව වෙනුවෙන් පෙනී සිටී. සංවර්ධන සැලසුම් සම්පාදනයෙහි සහ ක්‍රියාත්මක කිරීමෙහි සියලු මට්ටම්වල ස්ත්‍රී සහභාගිත්වය සහතික කිරීමට එය කැපවී ඇත. ජාතික කලාපීය සහ ගෝලීය න්‍යාය පත්‍රයන්හි ඇතුලත් සියලු වැදගත් කරුණු අරභයා ස්ත්‍රීන්ගේ අවශ්‍යතා සහ අදහස් උදහස් සම්බන්ධීකරණ විපර්යකාරකයකු ලෙස එය එක්සත් ජාතීන්ගේ පද්ධතිය තුල ක්‍රියා කරයි.

සංවර්ධන අරමුදල 1976 දී බිහි වූ දා සිට සංවර්ධනය වන ලෝකයේ ස්ත්‍රීන් දේශපාලන ආර්ථික හා සාමාජයීය වශයෙන් බල ගැන්වීමේ ව්‍යාපෘතිවලට හා වැඩ සටහන්වලට ආධාර කර ඇත. එකී ව්‍යාපෘති ස්ත්‍රීන්ගේ සේවා තත්ත්වයන් වැඩි දියුණු කරන්නා වූ පහලම තලයේ ව්‍යාවසායයන්ගේ සිට පොදු අධ්‍යාපන වැඩසටහන් සහ පුම්තිරිභාවයට සංවේදී නව නීති සම්පාදනය දක්වා පරාසයක විහිදෙයි.

UNIFEM සහ UNDP අතර ස්වතන්ත්‍ර සමාගමයක් පවතී. එය සියලු කලාපවල නියෝජිතයන්ගෙන් සැදුම්ලත් උපදේශාත්මක කමිටුවකට සහ UNDP විධායක මණ්ඩලයට වාර්තා කරයි. කලාපීය වැඩසටහන් උපදේශකවරු 12 දෙනෙක් කලාපීය සහ රාජ්‍ය මට්ටම්වලින් UNIFEM නියෝජනය කරති. අරමුදලේ වාර්ෂික අයවැය ඩොලර් මිලියන 20ක් පමණ වේ.

Director : Ms. Noeleen Heyzer (Singapore)
Headquarters : 304 East 45th Street, 6th floor, New York, NY 10017, USA
Tele. : (1 212) 906 6400 ; Fax : (1 212) 906 6705
E-mail : unifem@undp.org
Internet : www.unifem.undp.org

## එක්සත් ජාතීන්ගේ ස්වේච්ඡා සේවකයෝ (UNV)

එක්සත් ජාතීන්ගේ අතුරු ආයතනයක් ලෙස 1970 දී මහා මණ්ඩලය එක්සත් ජාතීන්ගේ ස්වේච්ඡා සේවකයන් ස්ථාපනය කළේ සංවර්ධන සහයෝගීතාව පිළිබඳ ක්‍රියාකාරී වැඩ සටහනක් වශයෙනි. ස්වේච්ඡා සේවය පදනම් කොටගත් මේ වැඩසටහන එක්සත් ජාතීන්ගේ පවුල ඇතුළත සේම පරිමාණය අතින් අන්තර්ජාතික ව්‍යාපෘතියක් ලෙස ද සුවිශේෂ වැදගත්කමක් හිමිකර ගනී. එය මධ්‍ය මට්ටමේ වෘත්තීය පළපුරුද්ද සහිත ස්ත්‍රීන් සහ පුරුෂයන් ආංශික සහ ප්‍රජාමූල සංවර්ධන ව්‍යාපෘතිවල, මානුෂවාදී ආධාර සේවාවන්හි සහ මානව අයිතිවාසිකම් හා ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය කිරීමේ වැඩ සටහන්වල යොදවයි. UNDP-UNFPA විධායක මණ්ඩලය වෙත වාර්තා කරන ස්වේච්ඡා සේවකයෝ ලොව පුරා UNDP කාර්යාල මගින් සේවය කරති.

සෑම වසරකම ජාතීන් 140කට පමණ අයත් එක්සත් ජාතීන්ගේ ස්වේච්ඡා විශේෂඥයෝ, ක්ෂේත්‍ර සේවකයෝ සහ ජාතික ස්වේච්ඡා සේවකයෝ, කෙටි කාලීන ව්‍යාපාර කර්මාන්ත උපදේශකයෝ, සියරට එන විදේශික උපදේශකවරු 4,000ක් පමණ රටවල් 140කට වැඩි ගණනක සේවයෙහි නිරතව සිටිති. ඔවුන්ගෙන් තුනෙන් දෙකක් සංවර්ධනය වන රටවල වැසියන් වන අතර ඉතිරි පිරිස කාර්මික රටවලට අයත්ය. 1971 සිට 20,000කට වැඩි පිරිසක් එක්සත් ජාතීන්ගේ ස්වේච්ඡා සේවකයන් ලෙස වැඩ කර ඇත.

උපාධි සුදුසුකම් සහ වසර කිහිපයක වැඩ පළපුරුද්ද බඳවා ගැනීමේ මූලික කොන්දේසි වෙයි. කොන්ත්‍රාත් කාලය සාමාන්‍යයෙන් වසර දෙකකි. මානුෂවාදී සේවා

මැතිවරණ සහ වෙනත් දූත මෙහෙවරවල කෙටි කාලීන සේවා ඔවුනට පැවරේ. ස්වෙච්ඡා සේවකයනට ප්‍රමාණවත් මාසික ජීවන දීමනාවක් ලැබෙයි. අරමුදල් සැපයෙන්නේ UNDP හවුල්කාර එක්සත් ජාතීන්ගේ ආයතන සහ ආධාර සපයන රටවල් විශේෂ ස්වේච්ඡා අරමුදලට කරන ප්‍රදාන වෙතිනි.

2001 අන්තර්ජාතික ස්වේච්ඡා සේවක වසරේ වගකීම් භාර කේන්ද්‍රීය ආයතනය ලෙස මහා මණ්ඩලය විසින් එක්සත් ජාතීන්ගේ ස්වේච්ඡා සේවකයන් නම්කර තිබිණි.

Executive Co-ordinator : Dr. Sharon Capeling-Alakija (Canada)
Headquarters : Postfach 260 111, D-53153 Bonn, Germany
Tele. : (49 228) 815 2000 ; Fax : (49 228) 815 2001
E-mail : enquiry@unv.org
Internet : www.unv.org

## එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA)

මහා මණ්ඩලයේ මුල පිරිමෙන් 1969 දී ක්‍රියාත්මකභාවයට පැමිණි එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල සංවර්ධනය වන රටවලට සහ සංක්‍රාන්ති ආර්ථිකයන් සහිත රටවලට ජනගහන උදව් සපයන, අන්තර්ජාතික අරමුදල්වලින් පෝෂිත විශාලතම මූලාශ්‍රය වන්නේය. ප්‍රජනක සෞඛ්‍යය සහ පෞද්ගලික තේරීම මත පවුල් සැලසුම් සේවා වැඩි දියුණු කිරීම පිණිස රටවල්වල ඉල්ලීම් අනුව උදව් කරන එය ධරණීය සංවර්ධනය අරමුණු කරගත් ප්‍රයත්නයන්ට උපකාරී වන ජනගහන ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වෙයි. ජනගහන අරමුදල මහා මණ්ඩලයේ අතුරු ආයතනයකි. UNDP විධායක මණ්ඩලයම එහි පාලනය භාරව සිටී.

ජනගහන අරමුදලට මුළුමනින්ම අරමුදල් සැපයෙන්නේ වසරකට ඩොලර් මිලියන 250ක් තරම් වන ස්වෙච්ඡා ප්‍රදානවලිනි. ගැටවර වියේ ප්‍රජනක සෞඛ්‍ය ගැටළු කළමනාකරණය, මාතෘ මරණ සංඛ්‍යාව අඩු කිරීම, HIV/ඒඩ්ස් පාලනය ආවරණය වන පරිදි පවුල් සැලසුම් කිරීම හා ලිංගික සෞඛ්‍යය ඇතුලු ප්‍රජනක සෞඛ්‍ය සහ හදිසි ආධාර සැපයීම සඳහා එහි අරමුදල්වලින් තුනෙන් දෙකක් වැය කෙරේ.

තොරතුරු සම්පාදනය, ප්‍රතිපත්ති හැඩගැස්වීමට බලපෑම් කිරීම සහ ජනගහන වැඩසටහන් සැකසීමේ ජාතික ශක්‍යතා ගොඩනැගීම මගින් සංවර්ධනය සහ ජනගහන ගතිකයන් අතර තුලනයක් ඇති කරනු පිණිස ජනගහන හා සංවර්ධන උපාය මාර්ග සඳහා අරමුදල්වලින් තුනෙන් එකකට ආසන්න ප්‍රමාණයක් යෙදවෙයි. ජනගහන ක්‍රියාකාරකම් සඳහා සම්පත් සොයාගැනීම සහ දේශපාලන අභිලාෂය වර්ධනය කිරීම අරමුණු කොටගත් දැනුවත් කිරීම් සඳහා ඉතිරිය වැය කරනු ලැබේ. ජනගහන අරමුදලේ කාර්ය මණ්ඩලය 905කි.

Executive Director : Ms. Thoraya Obaid (Saudi Arabia)
Headquarters : 220 East 42nd Street, New York, NY 10017, USA
Tele. : (1 212) 297 5000; Fax : (1 212) 370 0201
E-mail : hq@unfpa.org
Internet : www.unfpa.org




* Automous organizations working with the United Nations and each other through the coordinating machinery of the Economic and Social Council.

**Report only to the General Assembly.

# NATIONS system

THE UNITED NATIONS

## ECONOMIC AND SOCIAL COUNCIL

### FUNCTIONAL COMMISSIONS

Commission for Social Development
Commission on Human Rights
Commission on Narcotic Drugs
Commission on Crime Prevention and Criminal Justice
Commission on Science and Technology for Development
Commision on Sustainable Development
Commission on the Status of Women
Commissio on Population and Development
Statistical Commisin

### REGIONAL COMMISSIONS

Economic Commission for Africa (ECA)
Economic Commission for Europe (ECE)
Economic Commission for Latin America and the Caribbean (ECLAC)
Economic and Social Commission for Asia and the Pacific (ESCAP)
Economic and Social Commission for Western Asia (ESCWA)

United Nations Forum on Forests

Sessional and Standing Committees
Expert, ad hoc and related bodies

### RELATED ORGANIZATIONS

**IAEA**
International Atomic Energy Agency

**WTO (trade)**
World Trade Organization

**WTO (tourism)**
World Tourism Organization

**CTBTO Prep.com**
PrepCom for the Nuclear-Test-Ban-Treaty Organization

**OPCW**
Organization for the Prohibition of Chemical Weapons

## TRUSTEESHIP COUNCIL

### SPECIALIZED AGENCIES*

**ILO**
International Labour Organization

**FAO**
Food and Agrivulture Organization of the United Nations

**UNESCO**
United Nations Educational, Scientific and Cultural Organization

**WHO**
World Health Organization

**WORLD BANK GROUP**

- **IBRD** International Bank for Reconstruction and Development
- **IDA** International Development Association
- **IFC** International Finance Corporation
- **MIGA** Multilateral Investment Guarantee Agency
- **ICSID** International Centre for Settlement of Investment Disputes

**IMF**
International Monetary Fund

**ICAO**
International Civil Aviation Organization

**IMO**
International Maritime Organization

**ITU**
International Telecommunication Union

**UPU**
Universal Postal Union

**WMO**
World Meteorological Organization

**WIPO**
World Intellectual Property Organization

**IFAD**
International Fund for Agricultural Development

**UNIDO**
United Nations Industrial Development Organization

## SECRETARIAT

**OSG**
Office of the Secretary-General

**OIOS**
Office of Internal Oversight Services

**OLA**
Office of Legal Affairs

**DPA**
Department of Political Affairs

**DDA**
Department for Disarmament Affairs

**DPKO**
Department of Peacekeeping Operations

**OCHA**
Office for the Coordiantion of Humanitarian Affairs

**DESA**
Department of Economic and Social Affairs

**DGAACS**
Department of General Assembly Affairs and Conference Services

**DPI**
Department of Public Information

**DM**
Department of Management

**OIP**
Office of the Iarq Programme

**UNSECOORD**
Office of the United Nations Security Coordinator

**ODCCP**
Office for Drug Control and Crime Prevention

**UNOG**
UN Office at Geneva

**UNOV**
UN Office at Nienna

**UNON**
UN Office at Nairobi

# සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහා කොමසාරිස් කාර්යාලය (UNHCR)

මහා මණ්ඩලය විසින් 1950 දී ස්ථාපිත සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලයට ලොව පුරා සරණාගතයනට රැකවරණය සැලසීමේ සහ සරණාගතයන්ගේ ගැටළු විසඳීමේ අන්තර්ජාතික ක්‍රියාකාරකම්වලට නායකත්වයදීම හා ඒවා සම්බන්ධීකරණය පිළිබඳ වගකීම පැවරී තිබේ. ආරම්භ කළ දා සිට මිලියන 50ක් පමණ සරණාගතයනට උපකාරී වූ මේ ආයතනය 1954 දී සහ 1981 දී දෙවරක් නොබෙල් සාම ත්‍යාගය දිනා ගත්තේය.

සරණාගතයන් පිළිබඳ කොමසාරිස් කාර්යාලයේ වඩාත්ම වැදගත් වගකීම, ''අන්තර් ජාතික රැකවරණය'' නමින් හැඳින්වෙයි. සරණාගතයනට වෙනත් රටක දේශපාලන රැකවරණ පැතීමට ඇති හැකියාව ඇතුලු ඔවුන්ගේ මූලික මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම සහතික කිරීමත් යම් රටකට ගියවිට තමාට වද හිංසා විඳීමට සිදුවේයැයි බියවීමට සරණාගතයකුට හේතු තිබේ නම් ඔහු හෝ ඇය කැමැත්තෙන් තොරව එකී රටට ආපසු නොයවන බවට වගබලා ගැනීමත් ඉන් අදහස් වෙයි. සරණාගතයන් පිළිබඳ අන්තර්ජාතික ගිවිසුම පිළිපැදීමට පෙළඹවීම, ආණ්ඩු අන්තර් ජාතික නීතිය පිළිපදින්නේ දැයි නිරීක්ෂණය කිරීම සහ පලායමින් සිටින සිවිල් ජනයාට ආහාර, ජලය, නවාතැන් සහ වෛද්‍ය පහසුකම් වැනි ද්‍රව්‍යමය ආධාර සම්පාදනය UNHCR සෙසු කාර්යයන් අතර වෙයි.

අද, රටවල් 121ක පිහිටි කාර්යාල 281ක සේවය කරන 5,000කට වැඩි කාර්ය මණ්ඩලයක් සහිත ආයතනය සරණාගතයන්, සියරට යන්නවුන් සහ තමන්ගේම රට ඇතුලත අවතැන් වූවන් ඇතුළු මිලියන 21.6ක ජනතාවක් රැකබලා ගනී. රාජ්‍ය නොවන සංවිධාන 544ක් එහි ක්‍රියාකාරී හවුල්කරුවන් ලෙස සේවය කරයි.

මහා කොමසාරිස්වරයාගේ වැඩසටහන් අනුමත කොට අධීක්ෂණය කරන්නේ සාමාජික රටවල් 57කින් සැදුම්ලත් UNHCR විධායක කමිටුවයි. ප්‍රධාන වශයෙන් ආණ්ඩුවලින් ලැබෙන ස්වේච්ඡා ප්‍රදාන, පෞද්ගලික රටවැසියන් සහ සංවිධාන වැනි සෙසු කණ්ඩායම් වෙතින් ලැබෙන පරිත්‍යාග මගින් වැඩසටහන්වලට මුදල් සැපයේ.

එක්සත් ජාතීන්ගේ නිත්‍ය අයවැයෙන් සීමිත පිහිටාධාරයක් - මුලු ගණනින් සියයට 2ටත් අඩු ප්‍රමාණයක් - ආයතනයට ලැබෙන අතර එය පරිපාලන වියදම් පියවා ගැනීම පිණිස මුළුමනින් වැය කෙරේ. 2000 අයවැය ඩොලර් මිලියන 965.2කි.

සරණාගතයනට සහ වෙනත් අවතැන් වූ පුද්ගලයනට අදාල ප්‍රතිපත්ති හා ගැටලු පිළිබඳ පරිපූර්ණ විශ්ලේෂණයක් වන ලෝක සරණාගතයන්ගේ තත්ත්වය (The State of the World's Refugees) නමැති වාර්තාව සෑම දෙවසරකට වරක් නිකුත් කරනු ලැබේ.

High Commissioner : Mr. Ruud Lubbers (The Nertherlands)
Headquarters : 94 Rue Montbrillant, Geneva, Switzerland
Tele. : (41 220 739 85 02 ; Fax : (41 22) 739 73 14
E-mail : hqpiOO@unhcr.ch
Internet : www.unhcr.ch

## එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF)

1945 දී ආරම්භ කරන ලද එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල ලෝකය ළමයින් උදෙසා වඩා යහපත් තැනක් බවට පත් කිරීමට ආණ්ඩුවලට, ප්‍රජා කණ්ඩායම්වලට සහ පවුල්වලට උපකාරී වෙයි. මුළුමනින්ම ළමයින් සහ ස්ත්‍රීන් වෙනුවෙන් කැපවූ එක්සත් ජාතීන්ගේ එකම සංවිධානය වන UNICEF ළමයින්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීම භාරව සිටී. වයස 18න් පහළ සෑම කෙනෙක්ම ළමයකු ලෙස සැලකේ. ලෝකයේ රටවල් සියල්ලම පාහේ සපථ කර ඇති ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය විසින් එහි ක්‍රියාකාරිත්වය මෙහෙයවනු ලැබේ.

UNICEF රටවල් පළාත් සහ භූමි ප්‍රදේශ 161ක ක්‍රියාත්මකව සිටී. එහි ක්‍රියාකාරකම් එය මුහුණ පා සිටින අභියෝග තරම්ම විවිධය. ළමයින් සඳහා ජීවිතයේ හොඳම ආරම්භය සහතික කෙරෙන සාත්තුව හා උත්තේජනය දිරි ගැන්වීම, ළමා අවධියේ රෝගාබාධ සහ මරණ වලක්වා ගැනීමට උදව් දීම, ගර්භනීභාවයේ සහ දරු ප්‍රසූතියේ සුරක්ෂිතතාව තහවුරු කිරීම, වෙනස්කම් පිටුදැකීම, පිරිමි ළමයින් සේම ගැහැණු ළමයින්ද පාසල් යැවෙන බව සහතික කිරීමට ප්‍රජා කණ්ඩායම් සමඟ සහයෝගයෙන් ක්‍රියා කිරීම, ගැටවර වියේ පසුවන අයට ඔවුන්ගේ පැවැත්මට අවශ්‍ය නිපුණතා අත්කර ගැනීමට උදව්වීම සහ ඔවුන් ප්‍රජා ක්‍රියාකාරකම්වලට සහභාගි කරවීම ඊට අයත්ය. අර්බුද අවස්ථාවල දී සුරක්ෂිතතාව පිළිබඳ හැඟීම තහවුරු කිරීමෙන්, පාසල් නැවත විවෘත කිරීමෙන් සහ ළමයින් සඳහා ආරක්ෂා සහිත ස්ථාන පිහිටුවීමෙන් UNICEF ක්ෂණික ප්‍රතිචාර දක්වයි.

ප්‍රතිපත්ති තීරණය, වැඩසටහන් සමාලෝචනය සහ අයවැය අනුමත කිරීම ආදිය භාරවී ඇති 36 සාමාජික විධායක මණ්ඩලයක් විසින් UNICEF පාලනය කෙරේ. 1999 දී එහි කාර්ය මණ්ඩලය 5,600ක් වූ අතර ඔවුන්ගෙන් සියයට 86ක් ක්ෂේත්‍ර සේවයේ නිරතව සිටියහ. UNICEF සිය අරමුදල් සඳහා ආණ්ඩුවල සහ ආණ්ඩු නොවන මූලාශ්‍රවල ස්වේච්ඡා ප්‍රදාන මත මුළුමනින් රැඳී සිටී. 1999 දී ඩොලර් බිලියන 1.1ක් වූ එහි මුලු ආදායමින් සියයට 36ක් ලැබුණේ රාජ්‍ය නොවන සහ පෞද්ගලික අංශයේ මූලාශ්‍ර වෙතිනි. එය සෞඛ්‍යය, අධ්‍යාපනය, පෝෂණය සහ ජලය සහ සනීපාරක්ෂාව සම්බන්ධ වැඩසටහන් සඳහා සිය අයවැයෙන් සියයට 91ක් වෙන් කරයි.

"ලෝකයේ ළමයින්ගේ තත්ත්වය" (The State of the World's Children) සහ "ජාතීන්ගේ ප්‍රගතිය" (The Progress of Nations) එහි ප්‍රකාශන අතර ප්‍රධාන තැනක් ගනී.

UNICEF 1965 දී නොබෙල් සාම ත්‍යාගයෙන් පිදුම් ලැබීය.

Executive Director : Ms. Carol Bellamy (USA)
Headquarters : UNICEF House, United Nations, New York, NY 10017, USA
Tele. : (1 212) 326 7000 ; Fax : (1 212) 888 7465
E-mail : webmaster@unicef.org
Internet : www.unicef.org

## ලෝක ආහාර වැඩසටහන (WFP)

එක්සත් ජාතීන්ගේ පද්ධතියට අයත් ආහාර ආධාර හස්තය වන ලෝක ආහාර වැඩසටහන ලොව විශාලතම අන්තර්ජාතික ආහාර ආධාර සංවිධානයයි. එය වාර්ෂිකව බෙදාහරින ආහාර ආධාර තොගය මෙට්‍රික් ටොන් මිලියන තුනක් පමණ වෙයි. 1963 දී ස්ථාපිත ආහාර වැඩසටහනේ කාර්ය භාරය ලෝකයේ සාගින්න සහ දිළිඳුකම පිටු දැකීමට දායකවීමෙන් සංවර්ධනය වන රටවල දිළිඳු ජනයාට උදව්වීමයි. එය ආර්ථික හා සාමාජයීය සංවර්ධනය නැංවීම පිණිස ආහාර ආධාර උපයෝගී කොට ගනී. ආහාර වැඩසටහන ආපදා අවස්ථාවල දී යුද්ධයෙන් සහ ස්වභාවික හා මිනිසා විසින් ඇතිකරන ලද විපත්වලින් පීඩාවට පත්වූවනට ජීවිතය පවත්වා ගැනීම සඳහා කඩිනම් සහනාධාර සපයයි. එහි සම්පත්වලින් සියයට 80ක්ම ආපදා සහනාධාර සඳහා වැය කෙරේ.

ආහාර වැඩසටහනේ කාර්ය මණ්ඩලය 5,000 ඉක්මවයි. අඩකටත් වැඩි පිරිස තාවකාලික පදනමක් මත සේවයේ නිරතව සිටිති. 1999 දී රටවල් 82ක මිලියන 89ක් ජනතාවට ටොන් මිලියන 3.4ක ආහාර ආධාර සපයනු ලැබීය. ඒවායේ මුළු වටිනාකම ඩොලර් බිලියන 1.5ක් විය.

WFP ආහාර සැපයුම්වලින් විශාල කොටසක් ආධාර සපයන රටවල් වෙතින් ද්‍රව්‍ය වශයෙන් ලැබෙන අතර බහු පාර්ශ්වික සහ ද්වි පාර්ශ්වික මුදල් මූලාශ්‍ර භාවිත කරමින් ඩොලර් මිලියන 300කට අධික ආහාර මිලට ගනු ලැබේ. එය එක්සත් ජාතීන්ගේ අන් කවර හෝ ආයතනයකට වඩා සංවර්ධනය වන රටවලින් භාණ්ඩ හා සේවා මිලට ගනී. 1999 දී පමණක් එවැනි මිල දී ගැනීම්වල වටිනාකම ඩොලර් මිලියන 122ක් විය.

ලෝක ආහාර වැඩසටහන පාලනය වන්නේ සාමාජිකයන් 42කින් සමන්විත ආහාර ආධාර ප්‍රතිපත්ති සහ වැඩසටහන් කමිටුව විසිනි. ඔවුන්ගෙන් අඩක් ආර්ථික හා සාමාජයිය මණ්ඩලය සහ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය විසින් පත්කරනු ලැබේ. කමිටුව වසරකට දෙවරක් රැස්වෙයි.

Executive Director : Mr. James T. Morris (USA);
Headquarters : *Via* Cesare Giulio Viola, 68/70, 00148 Rome, Italy
Tele. : (39 06) 65 13-1; Fax : (39 06) 6590 - 632/637
E-mail : wpinfo@wfp.org
Internet : www.wfp.org

## මැත පෙරදිග පලස්තීන සරණාගතයන් සඳහා එක්සත් ජාතීන්ගේ සහන සේවා සහ වැඩ ආයතනය (UNRWA)

පලස්තීන සරණාගතයන් සඳහා සහන සේවා පවත්වාගෙන යනු පිණිස මහා මණ්ඩලය විසින් 1949 දී මැත පෙරදිග පලස්තීන සරණාගතයන් සඳහා එක්සත් ජාතීන්ගේ සහන සේවා සහ වැඩ ආයතනය ස්ථාපිත කරනු ලැබීය. පලස්තීන සරණාගතයන් පිළිබඳ ගැටලුවට විසඳුමක් නොලැබීම නිසා එහි නිල කාලය වරින්වර අලුත් කරනු ලැබේ.

සහන සේවා ආයතනය ආරම්භයේ දී 1948 අරාබි ඊශ්‍රායල් යුද්ධයේ ප්‍රතිඵලයක් ලෙස සිය ගේදොර සහ ජීවනෝපාය අහිමි වූ පලස්තීන සරණාගතයන් 7,50,000ක් පමණ දෙනාට ආපදා සහනාධාර සැපයීය. වසර 2000 වනවිට එය මිලියන 3.7කට වැඩි ලියාපදිංචි පලස්තීන සරණාගතයනට අත්‍යවශ්‍ය සෞඛ්‍ය අධ්‍යාපන සහන සහ සමාජ සේවා සපයමින් සිටියේය. මේ සංඛ්‍යාවෙන් මිලියන 1.2ක් පමණ පිරිස ජෝර්දානයේ, ලෙබනනයේ, සිරියානු අරාබි ජනරජයේ, ගාසා තීරයේ සහ බටහිර ඉවුරේ පිහිටුවා ඇති ආයතනයේ සේවය ලබන සරණාගත කඳවුරුවල ජීවත් වූහ.

ගාසා හි සහ ජෝර්දානයේ අම්මාන් නුවර පිහිටි සිය මූලස්ථානවල අධීක්ෂණය සහ සහාය ඇතිව ආයතනය ක්‍රියාත්මක වෙයි. කෙලින්ම මහා මණ්ඩලයට වාර්තා කරන කොමසාරිස් ජෙනරාල්වරයාට බෙල්ජියම, ඊජිප්තුව, ප්‍රංශය, ජපානය, ජෝර්දානය, ලෙබනන්, සිරියාව, තුර්කිය, එක්සත් රාජධානිය, එක්සත් ජනපදය යන රටවලින් සැදුම්ලත් උපදේශක කොමිසමක සහාය ලැබෙයි.

ආයතනයේ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය වැඩි වශයෙන් පලස්තීන සරණාගතයන්ගෙන් සැදුම්ලත් 22,000ට වැඩි පිරිසකින් සමන්විතය. අන්තර්ජාතික කාර්ය මණ්ඩල තනතුරු 98 සඳහා වියදම් එක්සත් ජාතීන් විසින් දරනු ලැබේ. එහි සාමාන්‍ය සහ හදිසි මෙහෙයුම් සඳහා අරමුදල් ලැබෙන්නේ මුළුමනින් පාහේ ස්වේච්ඡා ප්‍රදානවලිනි. ප්‍රදානවලින් ඉතා වැඩි කොටස මුදලින් ද සියයට 7ක් පමණ දිළිඳු සරණාගතයන් අතර බෙදාහැරීම පිණිස ආහාර සහ වෙනත් ද්‍රව්‍යමය පරිත්‍යාග වශයෙන් ද ලැබේ. 2000 වසරේ නිත්‍ය අයවැය ඩොලර් මිලියන 360ක් විය. ඉන් සියයට 74කට වැඩි කොටස අධ්‍යාපනය, සෞඛ්‍යය සහ සහන සහ සමාජ සේවා සඳහා වැය කරනු ලැබීය.

Commissioner-General : Mr. Peter Hansen (Denmark)
Headquarters (Gaza) : Gamal Abdul Nasser Street, Gaza City
Tele. : (972 7) 677 7333; Fax : (972 7) 677 7555
Headquarters (Amman, Jordan):
Bayader Wadi Seer, P. O. Box 140 157, Amman 11814, Jordan
Tele. : (962 6) 582 6171/6; Fax : (962 6) 582 6177
Internet : www.unrwa.org

# මානව අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය (OHCHR)

එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් ක්‍රියාකාරිත්වය පිළිබඳ ප්‍රධාන වගකීම භාර නිලධාරියා ලෙස මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් පදවිය මහා මණ්ඩලය විසින් 1993 දී ස්ථාපනය කරනු ලැබීය. සියලු සිවිල්, සංස්කෘතික, ආර්ථික, දේශපාලන සහ සාමාජයීය අයිතිවාසිකම් සියලු දෙනා විසින් භුක්තිවිඳිනු ලැබීම ආරක්ෂා කිරීමත්, ප්‍රවර්ධනය කිරීමත් මහ කොමසාරිස්වරයාට භාරවී තිබේ. මේ කාර්යභාරය ඉටු කරනු ලබන්නේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය විසිනි.

මහ කොමසාරිස් කාර්යාලය එක්සත් ජාතීන්ගේ සියලු මානව හිමිකම් ක්‍රියාකාරකම් පිළිබඳව කේන්ද්‍රීය ආයතනය වන්නේය. එය මහා මණ්ඩලය සහ සෙසු ප්‍රතිපත්ති සම්පාදන මණ්ඩලවල ඉල්ලීම පරිදි පර්යේෂණ සිදුකරන අතර වාර්තා පිළියෙළ කරයි. එය මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය හා සුරැකීම පිණිස රාජ්‍ය නොවන සංවිධාන සමග සහයෝගයෙන් වැඩ කරයි. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් ආයතනවල ලේකම් කාර්යාලය ලෙස සේවය කිරීම ද එහි කාර්යභාරයට අයත්ය.

200ක පමණ කාර්ය මණ්ඩලයකින් සමන්විත මහ කොමසාරිස් කාර්යාලය ප්‍රධාන ශාඛා තුනක් යටතේ සංවිධාන වී තිබේ.

* **පර්යේෂණ සහ සංවර්ධනයට ඇති අයිතිය පිළිබඳ ශාඛාව.**- මානව හිමිකම් ගැටලු පිළිබඳව පර්යේෂණ හා විශ්ලේෂණ සිදුකරයි. සංවර්ධනයට ඇති අයිතිය සාක්ෂාත් කර ගැනීම සඳහා වන උපායමාර්ගයක් සංවර්ධනය කොට අධීක්ෂණය කරයි.

* **ක්‍රියාකාරකම් සහ වැඩසටහන් ශාඛාව.**- රටවල්වලට තාක්ෂණික පහසුකම් සැලසීමේ විස්තීර්ණ වැඩසටහනක් ක්‍රියාත්මක කරයි. විශේෂ විමර්ශකයන් ක්‍රියාකාරී කණ්ඩායම් වැනි මානව හිමිකම් කඩකිරීමේ චෝදනා පිළිබඳ තතු සෙවීමේ ආයතනවලට සහය වෙයි. මානව හිමිකම් ක්ෂේත්‍ර වැඩසටහන් සඳහා උදව්වෙමින් පුහුණු පහසුකම් සලසයි.

*** ආධාරක සේවා ශාඛාව.-** මානව හිමිකම් කොමිසම සහ ගිවිසුම් පිළිබඳ මණ්ඩල වැනි එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් ආයතනවලට උපකාරක සේවා සලසයි.

High Commissioner : Ms. Louise Arbour (Canada)
Headquarters : Palais Wilson, 1211 Geneva 10, Switzerland
Tele. : (41 22) 917 31 34; Fax : (41 22) 917 02 45
E-mail : Secrt.hchr@unog.ch
Internet : www.unhchr.ch

## 14. එක්සත් ජාතීන්ගේ ජනාවාස කේන්ද්‍රය (Habitat)

එක්සත් ජාතීන්ගේ ජනාවාස කේන්ද්‍රය (Habitat) දැනුවත් කිරීම, උපදෙස්දීම, ප්‍රතිපත්ති සම්පාදනය, ධාරිතා ගොඩනැගීම, දැනුම නිර්මාණය සහ ආණ්ඩු හා සිවිල් සමාජය අතර හවුල්කාරිත්වය ශක්තිමත් කිරීම මගින් ධරණීය ජනාවාස සංවර්ධනය සාක්ෂාත් කර ගැනීමට ක්‍රියා කරයි.

1978 දී ස්ථාපිත ජනාවාස කේන්ද්‍රය, එක්සත් ජාතීන්ගේ සංවිධාන පවුල ඇතුළත ජනාවාස සංවර්ධන ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය භාර ප්‍රමුඛ ආයතනය වන්නේය. එහි අවධානය යොමුවී ඇති ප්‍රමුඛතා ක්ෂෙත්‍ර දෙකකි.

* සියලු දෙනාට ප්‍රමාණවත් නිවාස පහසුකම්, සහ

* ධරණීය නාගරික සංවර්ධනය.

Habitat ආයතනය ආණ්ඩු, පළාත් පාලන ආයතන, රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික අංශය සමග හවුලේ වැඩ කරමින් ඒවාට ආධාර උපකාර කරයි. එහි තාක්ෂණික වැඩසටහන් සහ ව්‍යාපෘති නාගරික පරිසරය, නාගරික දිළිඳුකම අඩු කිරීම, විපත්වලින් පසු යළි ඉදිකිරීම් සහ ජල කළමනාකරණය ඇතුළු ක්ෂේත්‍ර ගණනාවක විහිදී ඇත. මේ වැඩසටහන් බොහොමයක් ක්‍රියාත්මක වන්නේ සෙසු ද්විපාර්ශ්වික ආධාර ආයතන සමග හවුල් කාරිත්වයෙනි.

ජනාවාස ක්ෂේත්‍රයේ ප්‍රමුඛ ප්‍රකාශනයක් වන ජනාවාස පිළිබඳ ලෝක වාර්තාව (Global Report on Huma Settlements) ලොවපුරා ජනාවාස පිළිබඳ සම්පූර්ණ සමාලෝචනයකි.

සෑම දෙවසරකට වරක් රැස්වන සාමාජිකයන් 58 දෙනෙකුගෙන් යුත් ජනාවාස කොමිසම විසින් Habitat පාලනය කෙරේ. කාර්ය මණ්ඩලය 240කි. 1998 - 1999 ද්විවාර්ෂික අයවැය කාලය තුළ එහි මුළු වියදම ඩොලර් මිලියන 160ක් විය.

Executive Director : Ms. Anna Kajumulo Tibaijuka (Tanzania)
Headquarters : United Nations Avenue, Gigiri, Nairobi, Kenya
Tele. : (254 2) 621 234; Fax : (254 2) 624 266/7
E-mail : habitat@unchs.org
Internet : www.unchs.org

## එක්සත් ජාතීන්ගේ ව්‍යාපෘති සේවා කාර්යාලය (UNOPS)

සංවර්ධන වන රටවලට සහ සංක්‍රාන්ති ආර්ථිකයන් සහිත රටවලට සාමය, සමාජ ස්ථාවරභාවය, ආර්ථික වෘද්ධිය සහ ධරණීය සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම සඳහා උදව්වනු පිණිස ව්‍යාපෘති සම්පත් කළමනාකරණය එක්සත් ජාතීන්ගේ ව්‍යාපෘති සේවා කාර්යාලයට පැවරී තිබේ.

ව්‍යාපෘති සේවා කාර්යාලය සමස්ත ව්‍යාපෘති කළමනාකරණයේ සිට තනි යෙදවුම් සම්පාදනය දක්වා පුළුල් පරාසයක විහිදෙන සේවාවන් අන්තර්ජාතික ප්‍රජාව වෙත සපයයි. තම සේවාදායකයන්ගේ ඉල්ලීම්වලට නම්‍යශීලි ලෙස ප්‍රතිචාර දක්වන එය ඔවුන්ගේ විශේෂ අවශ්‍යතාවනට අනුරූපව කළමනාකරණ සේවා සැලසුම්කොට අඩු වියදමින් වැඩි ප්‍රතිඵල අත්කර ගැනීමේ ක්‍රම භාවිත කරයි. එසේම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට විවිධ වූ හවුල්කරුවන් සහභාගි කර ගනී.

ව්‍යාපෘති සේවා කාර්යාලය එක්සත් ජාතීන්ගේ බොහෝ සංවිධාන, සංවර්ධනය වන සහ ආධාර සපයන රටවල ආණ්ඩු, පෞද්ගලික අංශය සහ දේශීය සහ අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන සමග හවුල්කාරිත්වයෙන් වැඩ කරයි. ඊට මුළුමනින්ම අරමුදල් ලැබෙන්නේ සපයන සේවා වෙනුවෙන් අය කෙරෙන ගාස්තුවලිනි. එහි කාර්ය මණ්ඩලය ව්‍යාපෘති සේවකයන් ඇතුළුව 1,100කි.

Executive Director : Mr. Reinhart Helmike (Germany)
Headquarters : No. 405, Lexington Avenue, New York, NY 10174, USA
Tele. : (1 212) 457 4000 ; Fax : (1 212) 457 4001
E-mail : Unops.newyork@unops.org
Internet : www.unops.org

# එක්සත් ජාතීන්ගේ විශ්වවිද්‍යාලය (UNU)

එක්සත් ජාතීන්ගේ විශ්වවිද්‍යාලය සාමය හා ප්‍රගතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ අරමුණු සාක්ෂාත් කරගැනීමට දායක වනු පිණිස පර්යේෂණ, පශ්චාත් උපාධි පුහුණුව සහ දැනුම ප්‍රචලිත කිරීම යන කාර්යයන්හි නිරත අන්තර්ජාතික විද්වතුන්ගේ ප්‍රජාවකි. විශ්වවිද්‍යාලයේ ප්‍රඥප්තිය 1973 දී සම්මත කෙරුණු අතර එහි කාර්යයන් 1975 දී ආරම්භ විය.

විශ්වවිද්‍යාලය යටතේ ලොවපුරා ක්‍රියාත්මක පර්යේෂණ සහ අභ්‍යාස මධ්‍යස්ථාන සහ වැඩසටහන් ගණන 13කි.

එක්සත් ජාතීන්ගේ විශ්වවිද්‍යාලයට අරමුදල් සම්පාදනය මුළුමනින්ම සිදුවන්නේ ආණ්ඩු, විවිධ ආයතන සහ පදනම් සහ පරිත්‍යාගශීලීන් වෙතින් ස්වේච්ඡාවෙන් ලැබෙන මුදල් ප්‍රදානවලිනි. එක්සත් ජාතීන්ගේ අයවැයෙන් ඊට අරමුදල් නොලැබේ. මෙහෙයුම් වියදම් සඳහා මූලික වාර්ෂික ආදායම ලැබෙනුයේ එහි පරිත්‍යාග අරමුදලෙන් උපදින ආයෝජන ආදායමිනි. 2000 වසරේ විශ්වවිද්‍යාලයේ අයවැය ඩොලර් මිලියන 35.9ක් විය. කාර්ය මණ්ඩලය 211කි.

විශ්වවිද්‍යාලය පාලනය වන්නේ වාර්ෂිකව රැස්වන සූවිසි පුද්ගල මණ්ඩලයක් විසිනි.

| | |
|---|---|
| Rector | : Prof. Hans van Ginkel (The Netherlands) |
| Headquarters | : 53-70 Jingumae 5-Chome, Shibuka-Ku, Tokyo 150-8925, Japan |
| Tele. | : (81-3) 3499-2811; Fax : (81-3) 3499-2828 |
| E-mail | : mbox@hq.unu.edu |
| Internet | : www.unu.edu |

## කාන්තාභිවෘද්ධිය සඳහා අන්තර්ජාතික පර්යේෂණ සහ පුහුණු ආයතනය (INSTRAW)

ස්ත්‍රීන් පිළිබඳ ප්‍රථම ලෝක සම්මේලනයේ නිර්දේශය පරිදි කාන්තාභිවෘද්ධිය සඳහා අන්තර්ජාතික මට්ටමේ පර්යේෂණ සහ පුහුණු වැඩසටහන් ප්‍රවර්ධනය සහ සිදුකිරීම පිළිබඳ වගකීම ඊට පැවරී තිබේ. ඒ හැර සංවර්ධන ක්‍රියාදාමයෙහි ස්ත්‍රීන්ගේ සක්‍රීය සහ සමාන සහභාගිත්වය පුළුල් කිරීම, පුම්තිරිභාවයට අදාළ ගැටලු ගැන අවබෝධය නැංවීම, පුම්තිරි සමානාත්මතාව අත්කර ගැනීම සඳහා ලෝක ව්‍යාප්ත ජාලයක් නිර්මාණය කිරීම සෙසු කාර්යයන් අතර වෙයි.

එක්සත් ජාතීන්ගේ ස්වතන්ත්‍ර මණ්ඩලයක් වන INSTRAW පාලනය වන්නේ ආර්ථික හා සාමාජයීය මණ්ඩලය විසින් පත්කරන ලද 11 පුද්ගල භාරකාර මණ්ඩලයක් මඟිනි. ඊට අරමුදල් සම්පාදනය කෙරෙන්නේ තනිකරම සමාජික රාජ්‍ය, අන්තර් ආණ්ඩු ආයතන, රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික මූලාශ්‍ර සපයන ස්වේච්ඡා ප්‍රදානවලිනි.

ආයතනයේ 1998-1999 දෙවාර්ෂිකයේ වියදම ඩොලර් මිලියන 4.01ක් විය.

| | |
|---|---|
| Director | : Ms. Savitri Butchey (Guyana) |
| Headquarters | : Cesar Nicolas Penson 02-A, Santo Domingo, Dominican Republic |
| Tele. | : (1 809) 685-2111; Fax : (1 809) 685-2117 |
| E-mail | : instraw.hq.sd@codetel.net.do |
| Internet | : www.un-instraw-gaii.org |

## එක්සත් ජාතීන්ගේ අන්තර් කලාපීය අපරාධ සහ යුක්ති විනිශ්චය පර්යේෂණ ආයතනය (UNICRI)

1968 දී පිහිටුවන ලද එක්සත් ජාතීන්ගේ අන්තර් කලාපීය අපරාධ සහ යුක්ති විනිශ්චය පර්යේෂණ ආයතනය පර්යේෂණ පුහුණු සහ තොරතුරු සම්පාදන කාර්යයන්හි නිරත වෙයි.

එහි ක්‍රියාකාරකම් :

* සංවිධානාත්මක අපරාධ පිළිබඳ විශ්වාසදායක දැනුම් සහ තොරතුරු පදනමක් ගොඩනගනු පිණිස අදාළ රටවල සහයෝගය ඇති පර්යේෂණ පැවැත්වීමට අනුබල දෙයි, උපකාරී වෙයි. සමාජ ආර්ථික සංවර්ධනයට සහ මානව අයිතිවාසිකම් සුරැකීමට ඉවහල්වන පරිදි අපරාධ නිවාරණය හා පාලනය සඳහා උපායමාර්ග හඳුනාගනී. ප්‍රතිපත්ති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම සඳහා උපකාරී වන ප්‍රායෝගික ක්‍රම සැලසුම් කරයි.

* අන්තර් කලාපීය සහ ජාතික මට්ටම්වල පුහුණු කටයුතු සැලසුම් කොට ක්‍රියාත්මක කරයි.

* අපරාධ විද්‍යාව පිළිබඳ අන්තර්ජාතික ප්‍රලේඛන කේන්ද්‍රය මගින් තොරතුරු හුවමාරුව ප්‍රවර්ධනය කරයි.

සාමාජික රාජ්‍යයන්, රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන සහ විද්වත් ආයතන වෙතින් ලැබෙන ස්වේච්ඡා ප්‍රදානවලින් ආයතනයට අරමුදල් සැපයේ.

Director : Mr. Alberto Bradanini (Italy)
Headquarters : Viale Maestri del Lavoro 10, 10127 Turin, Italy
Tele. : (39 011) 653 7111; Fax : (39 011) 631 3368
E-mail : unicri@unicri.it
Internet : www.unicri.it

## එක්සත් ජාතීන්ගේ අභ්‍යාස හා පර්යේෂණ ආයතනය (UNITAR)

UNITAR

එක්සත් ජාතීන්ගේ ස්වතන්ත්‍ර ආයතනයක් ලෙස 1965 දී ස්ථාපිත එක්සත් ජාතීන්ගේ අභ්‍යාස හා පර්යේෂණ ආයතනයට පැවරී ඇති කාර්යය වන්නේ පුහුණු කිරීම් හා පර්යේෂණ මගින් එක්සත් ජාතීන්ගේ ඵලදායකත්වය නැංවීමය. අභ්‍යාස හා පර්යේෂණ ආයතනය 21 වැනි සියවසේ අභියෝගවලට මුහුණදීම සඳහා රටවලට සහාය වනු පිණිස පුහුණු පහසුකම් සලසයි. නිර්මාණාත්මක අභ්‍යාස සහ ධාරිතා වර්ධන ප්‍රවේශයන් හඳුනාගැනීම පිණිස පර්යේෂණ සිදු කරයි. රටවල්වල අවශ්‍යතා සපුරාලීම සඳහා අභ්‍යාස සහ ශක්‍යතා වර්ධන වැඩසටහන් සංවර්ධනයෙහි සහ සංවිධානයෙහිලා එක්සත් ජාතීන්ගේ සෙසු ආයතන, රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන සමග හවුල්කාරිත්වය ගොඩනගයි.

UNITAR පාලනය වන්නේ භාරකාර මණ්ඩලයක් විසිනි. අරමුදල් සම්පාදනය මුළුමනින්ම ආණ්ඩු, අන්තර් ආණ්ඩු සංවිධාන, පදනම් සහ වෙනත් රාජ්‍ය නොවන මූලාශ්‍ර වෙතින් ලැබෙන ස්වේච්ඡා ප්‍රදානවලිනි. එහි දෙවාර්ෂික අයවැය ඩොලර් මිලියන 12.5ක් පමණ වෙයි. UNITAR ක්‍රියාකාරකම් එහි ජිනීවා මූලස්ථානය මෙන්ම නිව්යෝක් කාර්යාලය විසින් ද මෙහෙයවනු ලැබේ. කාර්ය මණ්ඩලය 45කි.


Executive Director : Mr. Marcel Boisard (Swizerland)
Headquarters : International Environment House, Chemin des Anémones 11-13
1219 Châtelaine-Geneva, Switzerland
Tele. : (41 22) 917 1234; Fax : (41 22) 917 8047
E-mail : info@unitar.org
Internet : www.unitar.org

## එක්සත් ජාතීන්ගේ සමාජ සංවර්ධන පර්යේෂණ ආයතනය (UNRISD)

එක්සත් ජාතීන්ගේ ස්වතන්ත්‍ර ආයතනයක් ලෙස 1963 දී ස්ථාපිත එක්සත් ජාතීන්ගේ සමාජ සංවර්ධන පර්යේෂණ ආයතනය සංවර්ධනයට බලපාන ගැටලුවල සාමාජයීය පැතිමාන පිළිබඳ පර්යේෂණයෙහි නිරත වී සිටී. එය ආර්ථික සාමාජයීය හා පාරිසරික පරිවර්තනය අරමුණු කොටගත් සංවර්ධන ප්‍රතිපත්ති හා ක්‍රියාදාමයන් විවිධ සමාජ කණ්ඩායම්වලට බලපාන්නේ කෙසේදැයි වඩා හොඳ අවබෝධයක් ලබාගැනීම සඳහා ආණ්ඩු, සංවර්ධන ආයතන, පාලන මට්ටමේ සංවිධාන ආදියට සහ විද්වතුනට සහාය වෙයි.

ආයතනය සිය ක්‍රියාකාරකම් සඳහා අරමුදල් සපයා ගැනීමේ දී තනිකරම ස්වේච්ඡා ප්‍රදාන කෙරෙහි විශ්වාසය තබයි. 1999 දී ඩෙන්මාක්, පින්ලන්තය, මෙක්සිකෝව, නෙදර්ලන්තය, නෝර්වේ. ස්වීඩන්. ස්විට්සර්ලන්තය, එක්සත් රාජධානිය යන රටවලින් ඩොලර් මිලියන දෙකක දායකත්වයක් ලැබිණ. විශේෂිත යෝජනා ක්‍රම සඳහා අතිරේක අරමුදල් වෙනත් විවිධ මණ්ඩල, ද්වි පාර්ශ්වික මූලාශ්‍ර සහ එක්සත් ජාතීන්ගේ ආයතන වෙතින් සපයා ගන්නා ලදී. 11 පුද්ගල මණ්ඩලයක් අයවැය සහ පර්යේෂණ වැඩටසහන් අනුමත කරයි.

| | |
|---|---|
| Director | : Mr. Thandika Mkandawire (Sweden) |
| Headquarters | : Palais des Nations, CH-1211 Geneva 10, Switzerland |
| Tele. | : (41 22) 917 3020; Fax : (4122) 917 0650 |
| E-mail | : info@unrisd.org |
| Internet | : www.unrisd.org |

## එක්සත් ජාතීන්ගේ නිරායුධකරණ පර්යේෂණ ආයතනය (UNIDIR)

1980 දී ස්ථාපිත එක්සත් ජාතීන්ගේ නිරායුධකරණ පර්යේෂණ ආයතනය නිරායුධකරණය සහ ආශ්‍රිත අන්තර්ජාතික ආරක්ෂණ ගැටලු පිළිබඳ ස්වාධීන පර්යේෂණ සිදු කරයි. අප්‍රිකාවේ සාම සාධනය, බටහිර අප්‍රිකාවේ සාමය ගොඩනැගීම හා සුළු අවි ගැටලු ලතින් ඇමෙරිකාවේ සුළු අවි, සුළු අවි පිළිබඳ සම්මන්ත්‍රණ

මාලාව, මධ්‍යම ආසියාවේ සුළු අවි, න්‍යෂ්ටික උපක්‍රමික අවි, පිපිරෙන අමුද්‍රව්‍ය, අවි පාලනය පිළිබඳ අත්පොත්, ආයතනයේ වත්මන් පර්යේෂණ විෂය ක්ෂේත්‍රයේ මාතෘකා අතර වෙයි.

ඊට ඇත්තේ කුඩා ස්ථිර කාර්ය මණ්ඩලයකි. ආයතනය සිය පර්යේෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී ව්‍යාපෘති ආශ්‍රිත කෙටි කාලීන කොන්ත්‍රාත් මත විශාල ලෙස රඳා පවතී. රාජ්‍ය සහ පෞද්ගලික සංවිධාන වෙතින් ලැබෙන ස්වේච්ඡා ප්‍රදානයන්ගෙන් අරමුදල් සපයා ගනී. අයවැය ඩොලර් මිලියන 1.1 ක් පමණය.

Director : Dr. Patricia Lewis (United Kingdom)
Headquarters : Palais des Nations, CH 1211 Geneva 10, Switzerland
Tele. : (41 22) 917 3186 or 917 4263, Fax : (41 22) 917 0176
E-mail : plewis@unog.ch
Internet : www.unog.ch/unidir

# විශේෂිත ආයතන හා සෙසු සංවිධාන

## අන්තර්ජාතික කම්කරු සංවිධානය (ILO)

අන්තර්ජාතික කම්කරු සංවිධානය සමාජ සාධාරණත්වය සහ අන්තර්ජාතිකව පිළිගත් මානව සහ කම්කරු අයිතිවාසිකම් ප්‍රවර්ධනයට කැප වූ විශේෂිත ආයතනයයි. 1919 දී ස්ථාපිත එය 1946 දී එක්සත් ජාතීන්ගේ ප්‍රථම විශේෂිත ආයතනය බවට පත් විය.

කම්කරු සංවිධානය සේවා සහ ජීවන තත්වයන් වැඩි දියුණු කිරීමට ඉවහල් වන අන්තර්ජාතික ප්‍රතිපත්ති සහ වැඩසටහන් සම්පාදනය කරයි. මේ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ දී ජාතික බලධාරීන්ට ගුරූපදේශ ලෙස යොදා ගත හැකි අන්තර්ජාතික කම්කරු ප්‍රමිතීන් නිර්මාණය කරයි. එකී ප්‍රතිපත්තිවල ඵලදායීබව සහතික කිරීම සඳහා ආණ්ඩුවලට උදව් වනු පිණිස පුළුල් තාක්ෂණික සහයෝගිතා වැඩසටහනක් ක්‍රියාත්මක කරයි. මේ ප්‍රයත්නයන් සඵල කර ගැනීම සඳහා පුහුණු, අධ්‍යාපන සහ පර්යේෂණ, වැඩසටහන් හි නිරත වෙයි.

සිය ප්‍රතිපත්ති සම්පාදනයේ දී ආණ්ඩුවල නියෝජිතයන්ට සමාන හඬක් සේව්‍ය සේවක නියෝජිතයනට ද ලැබෙන බැවින් කම්කරු සංවිධානය ලෝක සංවිධාන අතර අද්විතීය තත්ත්වයක් හිමිකර ගනී. මණ්ඩල තුනකින් එය නිර්මාණය වී ඇත.

* අන්තර්ජාතික කම්කරු සමුළුව සෑම වසරකම සාමාජික රටවල ආණ්ඩු, සේව්‍ය සේවක දූත කණ්ඩායම් එකට මුණ ගස්වයි. අන්තර්ජාතික කම්කරු ප්‍රමිතීන් නියම කරන එය සමස්ත ලෝකයටම වැදගත් සාමාජයීය හා කම්කරු ගැටලු සාකච්ඡා කෙරෙන වේදිකාවක් නිර්මාණය කරයි ;

* පාලක මණ්ඩලය වසරකට දෙවරක් රැස්වෙයි. ILO මෙහෙයුම් හසුරුවයි. වැඩසටහන සහ අයවැය පිළියෙළ කරයි. ILO ප්‍රමිතීන් පිළිනොපදින අවස්ථා විභාග කරයි ;

* අන්තර්ජාතික කම්කරු කාර්යාලය සංවිධානයේ ස්ථිර ලේකම් කාර්යාලයයි.

ඉතාලියේ ටියුරින්හි පිහිටි අන්තර්ජාතික අභ්‍යාස කේන්ද්‍රය අධ්‍යයන සහ පුහුණු ඉඩ ප්‍රස්ථා සලසයි. සංවිධානයේ අන්තර්ජාතික කම්කරු අධ්‍යයන ආයතනයේ ක්‍රියාකාරකම් අතර පර්යේෂණ ජාල, සමාජ ප්‍රතිපත්ති සංවාද, මණ්ඩප, පාඨමාලා හා සම්මන්ත්‍රණ, බාහිර ශිෂ්‍යත්ව සහ සීමාවාසික වැඩසටහන් සහ ප්‍රකාශන ප්‍රධාන තැනක් ගනී.

සංවිධානය 50 වසරක් සම්පූර්ණ කළ 1969 දී නොබෙල් සාම ත්‍යාගයෙන් පිදුම් ලැබීය.

ILO කාර්ය මණ්ඩලය මූලස්ථානයේ සහ ලොව පුරා ක්ෂේත්‍ර කාර්යාල 40ක සේවයේ නිරත 2,250 දෙනෙකුගෙන් සමන්විතයි. 2000-2001 එහි අයවැය ඩොලර් මිලියන 467ක් පමණ විය.

| | |
|---|---|
| Director-General | : Mr. Juan Somavia (Chile) |
| Headquarters | : 4, route des Morillons, CH-1211 Geneva 22, Switzerland |
| Tele. | : (41 22) 799 61 11; Fax : (41 22) 798 86 85 |
| E-mail | : webinfo@hql.ilo.ch |
| Internet | : www.ilo.org |

# එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය (FAO)

එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය එක්සත් ජාතීන්ගේ පද්ධතිය තුළ ඇති ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ ප්‍රමුඛ ආයතනයයි. කෘෂිකාර්මික සංවර්ධනය නගා සිටුවීම, පෝෂණ මට්ටම නැංවීම, සහ ආහාර සුරක්ෂිතතාව ළඟාකර ගැනීම මගින් දිළිඳුකම හා සාගින්න පිටුදැකීමට එය ක්‍රියා කරයි. සියලු දෙනාට සියලු කල්හිම ක්‍රියාශීලී සහ සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීම සඳහා ප්‍රමාණවත් ආහාර ලබා ගැනීමේ හැකියාව ආහාර සුරක්ෂිතතාව යන්නෙන් අදහස් කෙරේ. ක්විබෙක් නගරයේ පැවැති සමුළුවකදී 1945 ඔක්තෝබර් 16 වැනිදා ආහාර සහ කෘෂිකර්ම සංවිධානය ස්ථාපනය කරනු ලැබීය. මේ දිනය දැන් වාර්ෂිකව ලෝක ආහාර දිනය ලෙස සමරනු ලැබේ.

ආහාර සහ කෘෂිකර්ම සංවිධානය ආණ්ඩුවලට සංවර්ධන උදව් සලසයි, ප්‍රතිපත්ති සහ සැලසුම් සම්පාදන උපදෙස් සපයයි. තොරතුරු විශ්ලේෂණය කරයි. බෙදා හරියි. ආහාර සහ කෘෂිකර්ම ගැටලු පිළිබඳ අන්තර්ජාතික විවාද මණ්ඩපයක් ලෙස ක්‍රියා කරයි. විශේෂ වැඩසටහන් මගින් හදිසි ආහාර අර්බුදවලට මුහුණදීමට හැකිවන පරිදි සාමාජික රටවලට උදව් සැපයේ. එමෙන්ම ආපදා සහනාධාර ද සපයයි. සාමාන්‍යයෙන් ඕනෑම අවස්ථාවක සංවිධානය ක්‍රියාත්මක කරන ක්ෂේත්‍ර ව්‍යාපෘති සංඛ්‍යාව 1800 ක් පමණ වෙයි. FAO ආධාර ව්‍යාපෘති සඳහා ආණ්ඩුවලින් සහ ආධාර ආයතනවලින් වසරකට ඩොලර් මිලියන 300ක ට වැඩි මුදලක් ලැබේ.

FAO පාලනය වන්නේ දෙවසරකට වරක් රැස්වන සාමාජික ජාතීන්ගේ සමුළුව විසිනි. සමුළු සැසිවාර අතර පාලක මණ්ඩලය ලෙස සේවය කරන 49 පුද්ගල මණ්ඩලයක් සමුළුවේ දී තෝරා ගැනේ.

2000-2001 අයවැය ඩොලර් මිලයන 650 කි. 4034 ක කාර්ය මණ්ඩලයක් මූලස්ථානයේ සහ ලොව පුරා ක්ෂේත්‍රයේ සේවය කරයි.

Director-General : Dr. Jacques Diouf (Senegal)
Headquarters : Viale delle Terme di Caracalla, 00100 Rome, Italy
Tele. : (39 06) 57051; Fax : (39 06) 5705 3152
E-mail : gii-registry@fao.org
Internet : www.fao.org

# එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය (UNESCO)

මනුෂ්‍ය වර්ගයාගේ බුද්ධිමය සහ සදාචාරමය ඒකාබද්ධතාව මත සදාතනික ලෝක සාමය ගොඩනැගීම පිණිස 1946 දී යුනෙස්කෝව පිහිටුවනු ලැබීය. අධ්‍යාපනය, ස්වාභාවික විද්‍යා, සමාජ සහ මානව විද්‍යා, සංස්කෘතික සහ සන්නිවේදනය, එය ක්‍රියාකාරී වන ක්ෂේත්‍ර වෙති.

යුනෙස්කෝ වැඩසටහන් සාම සංස්කෘතියක් ගොඩනැගීම සහ මානව හා ධරණීය සංවර්ධනය ඉලක්කකොට ගනී. ඒවායින් සාක්ෂාත් කරගැනීමට අපේක්ෂිත පරමාර්ථ; සැමට අධ්‍යාපනය, අන්තර්ජාතික විද්‍යාත්මක වැඩසටහන් මගින් පාරිසරික පර්යේෂණ ප්‍රවර්ධනය, සංස්කෘතික අනන්‍යතා ප්‍රකාශනයට සහායවීම, ලෝකයේ ස්වාභාවික සහ සංස්කෘතික උරුමය ආරක්ෂා කිරීම හා වැඩි වර්ධනය, නිදහස් තොරතුරු ප්‍රවාහය හා පුවත්පත් නිදහස ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය වන රටවල සන්නිවේදන ශක්‍යතා ශක්තිමත් කිරීම.

ජාතික කොමිෂන් සභා 178ක් සහ යුනෙස්කෝ සංගම්, කේන්ද්‍ර සහ සමාජ 5000 ක් පමණ යුනෙස්කෝවේ ක්‍රියාකාරිත්වයට උපස්ථම්භක වෙයි. එය 588ක ට වැඩි රාජ්‍ය නොවන සංවිධාන සහ පදනම් සමග මෙන්ම අන්තර් ජාතික හා කලාපීය ජාලයන් සමඟ ද සහයෝගයෙන් ක්‍රියා කරයි.

යුනෙස්කෝ පාලක මණ්ඩලය-මහ සමුළුව-සියලු සාමාජික රාජ්‍යයන්ගෙන් සෑදී ඇති අතර එය දෙවසරකට වරක් රැස්වෙයි. සමුළුව විසින් තෝරාගනු ලබන 58 සාමාජික විධායක මණ්ඩලය සමුළුව විසින් අනුමත වැඩසටහන් අධීක්ෂණය පිළිබඳ වගකීම භාරව සිටී.

යුනෙස්කෝ කාර්යමණ්ඩලය 2000 කි. 2000 - 2001 නිත්‍ය අයවැය ඩොලර් මිලියන 544 ක් විය.

Director-General : Mr. Koichiro Matsuura (Japan)
Headquarters : 7 Place de Fontenoy, 75352 Paris 07-SP, France
Tele. : (33 1) 4568-1000; Fax : (33 1) 4567-1690
E-mail : info@unesco.org
Internet : www.unesco.org

# ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO)

1948 දී ස්ථාපිත ලෝක සෞඛ්‍ය සංවිධානය ජාතීන්ගේ සෞඛ්‍යය සඳහා තාක්‍ෂණික සහයෝගිතාව ප්‍රවර්ධනය කරමින් රෝග පාලනයට සහ තුරන් කිරීමට වැඩසටහන් ක්‍රියාත්මක කරයි. ජීවන තත්වය වැඩි දියුණු කිරීමට වෙහෙසෙයි. සියලුම දෙනාට හැකි ඉහළම සෞඛ්‍ය මට්ටම අත්කරදීම එහි මුඛ්‍ය පරමාර්ථය වන්නේය.

එහි උපාය මාර්ගික දිශාවන් මෙසේ ය :–

* විශේෂයෙන් දිළිඳු සහ අවධානයට ලක් නොවූ ජනතාවන් අතර අධික මරණ අනුපාතය සහ අබල දුබලතා අඩු කිරීම ;
* සෞඛ්‍ය සම්පන්න ජීවන රටා ප්‍රවර්ධනය සහ පාරිසරික, ආර්ථික, සමාජයීය, චර්යාමය, හේතු නිසා උද්ගතවන සෞඛ්‍ය අවදානම් අඩු කිරීම ;
* වඩා සාධාරණ සහ ඵලදායී, ජනතාවන්ගේ නීත්‍යානුකූල ඉල්ලීම්වලට සංවේදී සහ මූල්‍යමය වශයෙන් යුක්ති සහගත සෞඛ්‍ය ක්‍රම සංවර්ධනය ;
* යෝග්‍ය සෞඛ්‍ය ප්‍රතිපත්ති සහ ආයතනික පරිසරය සංවර්ධනය, සහ සමාජයීය, ආර්ථික පාරිසරික සහ සංවර්ධන ප්‍රතිපත්තිවල සෞඛ්‍ය පැතිමානයට නිසි අවධානය දැක්වීම.

සෞඛ්‍ය සංවිධානයේ පාලක මණ්ඩලය සාමාජික රාජ්‍ය 191 කින් සැදුම්ලත් ලෝක සෞඛ්‍ය මන්ත්‍රණ සභාවයි. එය අවුරුදු පතා රැස්වෙයි. එහි තීරණ සහ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවෙන්නේ ආණ්ඩු විසින් පත් කරන ලද සෞඛ්‍ය විශේෂඥයන් තිස් දෙදෙනෙකුගෙන් සමන්විත විධායක මණ්ඩලය විසිනි. එය වසරකට දෙවරක් රැස්වෙයි.

කොංගෝවේ බ්‍රසාවිල්, (තාවකාලිකව සිම්බාබ්වේහි හරාරේ වෙත ගෙන ගොස් ඇත.) එක්සත් ජනපදයේ වොෂින්ටන් ඩී. සී. ඊජිප්තුවේ කයිරෝ, ඩෙන්මාර්කයේ කෝපන්හේගන්, ඉන්දියාවේ නවදිල්ලි, පිලිපීනයේ මැනිලා යන නගරවල WHO කලාපීය කාර්යාල ඇත. සෞඛ්‍ය සංවිධානයේ කාර්යමණ්ඩලය 3800 ක් පමණ වේ. 2000-2001 සඳහා එහි නිත්‍ය අයවැය ඩොලර් මිලයන 842 කි.

Director-General : Dr. Lee Jong-wook (Republic of Korea)
Headquarters : 20 Avenue Appia, CH 1211 Geneva 27, Switzerland
Telephone : (41 22) 791 2111, Fax : (41 22) 791 3111
E-mail : inf@who.int
Internet : www.who.int

## ලෝක බැංකු කණ්ඩායම (World Bank Group)

ලෝක බැංකුව ආයතන 5 ක කණ්ඩායමකි. ප්‍රතිසම්පාදනය හා සංවර්ධනය සඳහා අන්තර්ජාතික බැංකුව (ස්ථාපනය 1945), අන්තර්ජාතික මූල්‍ය සමායතනය (1956), අන්තර්ජාතික සංවර්ධන සංගමය (1960), බහු පාර්ශ්වික ආයෝජන සුරැකුම් ආයතනය (1988), සහ අන්තර්ජාතික ආයෝජන ආරවුල් සමථ කේන්ද්‍රය (1966).

සියලු ආයතනවල පොදු අරමුණ දිළිඳු ජාතීන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීමෙන් ලොව පුරා දරිද්‍රතාව අඩු කිරීමයි. ආර්ථික වෘද්ධිය සහ සංවර්ධනය ඉහළ නැංවීමෙන් ජනතාවගේ ජීවන මට්ටම් වැඩි දියුණු කිරීම ඒවායේ ඉලක්කයයි. බැංකුවේ පාලන ආයතනය සියලු සාමාජික රාජ්‍යයන් නියෝජනය වන පාලක මණ්ඩලයයි. (Board of Governors) දෛනික මෙහෙයුම්, විධායක අධ්‍යක්ෂ මණ්ඩලය නමින් හැඳින්වෙන ඊට කුඩා කණ්ඩායමකට පවරා තිබේ. බැංකුවේ සභාපතිවරයා මණ්ඩලයේ මුලසුන හොබවයි.

11,000 ක පමණ කාර්ය මණ්ඩලයකින් සමන්විත ලෝක බැංකු කණ්ඩායමේ වාර්ෂික පරිපාලන අයවැය ඩොලර් මිලියන 1.4 කි.

President : Mr. James D. Wolfensohn (USA)
Headquarters : 1818 H Street NW, Washington, D. C. 20433, USA
Telephone : (1 202) 477 1234; Fax : (1 202) 477 6391
E-mail : feedback@worldbank.org
Internet : www.worldbank.org

### ප්‍රතිසම්පාදනය හා සංවර්ධනය සඳහා අන්තර්ජාතික බැංකුව (IBRD)

IBRD ව්‍යවස්ථාව 1944 වර්ෂයේ පැවැති බ්‍රිටන් වුඩ්ස් සමුළුවේදී සම්පාදනය කෙරුණු අතර බැංකුවේ මෙහෙයුම් 1946 දී ආරම්භ විය. බැංකුව මධ්‍ය ආදායම් රටවලට සහ ණයට විශ්වාසී වඩා දිළිඳු රටවලට ණය සහ සංවර්ධන ආධාර සපයයි. එක් එක් සාමාජික රටේ සාපේක්ෂ ආර්ථික ශක්තිය මත පදනම් වූ ප්‍රාග්ධන දායකත්වයට අනුපාතිකව සාමාජික රටවල ඡන්දය දීමේ බලය තීරණය වී ඇත.

බැංකුව සිය අරමුදල්වලින් සියයට 90 ක් සපයා ගන්නේ අන්තර්ජාතික ප්‍රාග්ධන වෙළෙඳ පොළෙහි තිළිණපත් අලෙවි කිරීමෙනි. එහි 56 වසරක ඉතිහාසයේ කොටස් හිමියන් විසින් බැංකුව වෙත ගෙවා ඇත්තේ ප්‍රාග්ධනයෙන් ඩොලර් බිලියන 11 ක් නමුදු එකී ප්‍රමාණය ඩොලර් බිලියන 280ක ට වැඩි ණය බවට උත්තෝලනය කොට තිබේ.

1999 මුදල් වර්ෂයේ දී බැංකුව සැපයීමට එකඟවී තිබූ ණය ප්‍රමාණය ඩොලර් බිලියන 29 කි. ආයතන ගොඩ නැගීම, යහපත් රාජ්‍ය විචාරය, ආර්ථික ප්‍රතිපත්ති සහ සමාජ ආරක්ෂණය ඇතුළත් ගැළපුම් ණය ඩොලර් බිලියන 15.3 ක් විය. ඉන් අඩකටත් වැඩි ප්‍රමාණය සමාජ අංශවලට දැඩි අවධානය යොමු කරමින් දිළිඳුකම පිටුදැකීම අරමුණු කොට තිබිණි. අධ්‍යාපනය, සෞඛ්‍යය, පෝෂණය, හා සමාජ ආරක්ෂණය ඇතුළත් මානව සංවර්ධනය සඳහා ආධාර ඩොලර් බිලියන 7.3 ක් නැතහොත් ණය ප්‍රමාණයෙන් සියයට 25 ක් විය. විදුලිබලය, තෙල් සහ ගෑස් කර්මාන්ත සහ පතල් කැනීම්, ප්‍රවාහනය, නාගරික සංවර්ධනය, ජලය හා සනීපාරක්ෂාව සහ මූල්‍ය අංශය යන ක්ෂේත්‍රවල ණය ආයෝජනය කෙරිණ.

### අන්තර්ජාතික සංවර්ධන සංගමය (IDA)

IBRD ණය සඳහා පොළී, ණය සේවා ආදිය ගෙවීමට අසමත් ලෝකයේ දිළිඳුතම රටවලට අතිශය සහනදායී කොන්දේසි මත සංවර්ධන සංගමය මූල්‍ය පහසුකම් සලසයි. IBRD සංගමයේ පරිපාලන වගකීම භාරව සිටී.

IDA ණය ප්‍රධාන වශයෙන් සැපයෙනුයේ වාර්ෂික ප්‍රතිශීර්ෂ ආදායම ඩොලර් 895 ට අඩු රටවලටය. මේ ණය අවුරුදු 35 සිට 40 දක්වා කාලයකට සැපයේ. පරිපාලන වියදම් ආවරණය සඳහා අය කෙරෙන කුඩා ගාස්තුවක් මිස පොළියක් නැත. දස වසරක අනුග්‍රහ කාලය ඉකුත් වනතෙක් මුල් ණය ආපසු ගෙවීම ආරම්භ නොවේ. IDA සම්පත්වලින් වැඩි කොටස ලැබෙන්නේ ආධාර සපයන රටවලින් ලැබෙන දීමනාවලිනි. එකී මුදල් වැඩි වශයෙන් ලැබෙන්නේ වඩා ධනවත් IDA සාමාජිකයන්ගෙන් වුව ද දැනට IBRD ණය පහසුකම් ලැබෙන රටවල් ද ආධාර සපයන රටවල් අතර වෙයි. IDA අරමුදල් ප්‍රතිපූර්ණය කරන ලෙස සෑම තුන් වසරකට වරක් ආධාර සපයන්නන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. සංවර්ධන සංගමය ස්ථාපනය කිරීමෙන් පසු ප්‍රතිපූර්ණය කිරීම් 12 ක් සිදු කර ඇත.

IDA ණය සාමාන්‍යයෙන් වසරකට ඩොලර් බිලියන 5 ත් 6 ත් අතර වෙයි. ප්‍රාථමික අධ්‍යාපනය, මූලික සෞඛ්‍ය සේවා, පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව වැනි ජනතාවගේ මූලික අවශ්‍යතා සපුරාලන සංවර්ධන යෝජනා ක්‍රමවලට විශේෂ ප්‍රමුඛත්වය හිමිවෙයි. පරිසර සංරක්ෂණය, පෞද්ගලික ව්‍යාපාර සඳහා පහසුකම් වැඩි දියුණු කිරීම, යටිතල පහසුකම් ඉදිකිරීම, සහ රටවල ආර්ථික නිදහස්කරණය අරමුණු කොටගත් ප්‍රතිසංස්කරණ පිළිබඳ යෝජනා ක්‍රමවලටද අරමුදල් සැපයේ.

## අන්තර්ජාතික මූල්‍ය සමායතනය (IFC)

සංවර්ධනය වන ලෝකයේ පෞද්ගලික අංශයේ යෝජනා ක්‍රම සඳහා ණය සහ කොටස් ප්‍රාග්ධන පහසුකම් සලසන විශාලතම බහුපාර්ශ්වික මූලාශ්‍රය මූල්‍ය සමායතනයයි. එය පෞද්ගලික ආයෝජකයන් සමඟ හවුල්කාරිත්වයෙන් යුතුව සංවර්ධනය වන රටවල පෞද්ගලික අංශයේ ව්‍යාවසායයන් සහ යෝජනා ක්‍රම සඳහා මූල්‍ය පහසුකම් සේම උපදෙස් ද සපයයි. එසේම දේශීය මෙන්ම විදේශීය පෞද්ගලික ඉතුරුම් සහ ආයෝජන ප්‍රවාහය උත්තේජනය කරන කොන්දේසි නිර්මාණය සඳහා සිය උපදේශක සේවාව මගින් ආණ්ඩුවලට උදව් වෙයි.

සාමාජික රටවල ඵලදායී ව්‍යාවසාය සහ කාර්යක්ෂම ප්‍රාග්ධන වෙළෙඳපොළ වර්ධනය දිරි ගැන්වීමෙන් ආර්ථික සංවර්ධනයට මග සැලසීම එහි ඉලක්කය වී තිබේ. මූල්‍ය සමායතනය ආයෝජනයට සහභාගී වන්නේ වෙළෙඳපොළ ආයෝජකයන්ගේ කාර්යභාරය ඌණ පූරණය කිරීමට විශේෂ දායකත්වයක් සැපයීමට ඊට හැකි අවස්ථාවල පමණි. එය සංවර්ධනය වන ලෝකයේ ආයෝජනය ලාභදායී බව සනාථ කිරීම මගින් එකී රටවල පෞද්ගලික ආයෝජන උත්තේජනය හා සංචලනය කිරීමෙහිලා පූර්වගාමී කාර්යභාරයක් ද ඉටු කරයි.

ලෝක බැංකු කණ්ඩායම තුළ වෙනම ආයතනයක් වන අන්තර්ජාතික මූල්‍ය සමායතනයේ අරමුදල් IBRD අරමුදල් සමඟ කිසිදු සම්බන්ධයක් නැත. 1999 පිස්කල් වර්ෂයේදී IFC අධ්‍යක්ෂ මණ්ඩලය ඩොලර් බිලයන 5.3ක අගයක් සහිත නව ව්‍යාපෘති 255 ක් අනුමත කළේය.

## බහුපාර්ශ්වික ආයෝජන සුරැකුම් ආයතනය (MIGA)

දේපළ පවරා ගැනීම, යුද්ධ සහ සිවිල් කෝලාහල වැනි වාණිජ නොවන (එනම් දේශපාලන) අවදානම් නිසා සිදුවිය හැකි අලාභ ආවරණය කරනු පිණිස විදේශීය පෞද්ගලික ආයෝජකයනට රක්ෂණ (ඇප) සහතික සැපයීමෙන් සංවර්ධනය වන රටවල විදේශ ආයෝජන දිරි ගැන්වීමට ආයෝජන සුරැකුම් ආයතනය උදව් දෙයි. ආයෝජන ඉඩ ප්‍රස්ථා පිළිබඳ තොරතුරු ප්‍රචලිත කිරීමට රටවලට සහායවීම සඳහා තාක්ෂණික සේවා සැපයීමද එහි කාර්යයකි.

ආයෝජන සුරැකුම් ආයතනයේ සාමාජික රටවල් 151ක් විසින් ගෙවා නිමි ප්‍රාග්ධනය ඩොලර් බිලියනය ඉක්මවයි. එහි පාලක මණ්ඩලය 1999 දී ඩොලර් මිලියන 850 ක පමණ ප්‍රාග්ධන වැඩි කිරීමක් අනුමත කළේය. ලෝක බැංකුව තවත් ඩොලර් මිලියන 150 ක් කාරක ප්‍රාග්ධනය ලෙස ඊට පවරා දී ඇත.

සංවර්ධනය වන රටවල් වෙත ප්‍රාග්ධන ප්‍රවාහය ප්‍රවර්ධනය කිරීමට ආයතනය සමත් වී තිබේ. මේ දක්වා ආයතනයේ ඇප සහතික මගින් සංවර්ධනය වන සහ

සංක්‍රාන්ති ආර්ථිකයන් සහිත රටවල් 69 ක ඩොලර් බිලියන 33 ක ඇස්තමේන්තුගත ඍජු විදේශීය ආයෝජන පහසු කර ඇත.

## අන්තර්ජාතික ආයෝජන ආරවුල් සමථ කේන්ද්‍රය (ICSID)

ආයෝජන ආරවුල් සමථ කේන්ද්‍රය ආණ්ඩු සහ විදේශීය පෞද්ගලික ආයෝජකයන් අතර ආයෝජන ආරවුල් - සමගි කිරීමෙන් හෝ බේරුම් කිරීමෙන් - සමථයකට පත් කිරීමට පහසුකම් සලසයි. රටවල් 131 ක් විසින් සපථ කර ඇති රාජ්‍යයන් සහ සෙසු රාජ්‍යයන්හි වැසියන් අතර ආයෝජන ආරවුල් සමථය පිළිබඳ සම්මුතිය (1966) යටතේ එය පිහිටුවනු ලැබීය. සමථ මණ්ඩලයට යොමුවීම ස්වේච්ඡාවෙන් සිදුවුවද බේරුම් කිරීම පිළිගැනීමට කැමැත්ත ප්‍රකාශ කිරීමෙන් පසුව කිසිදු පාර්ශ්වයකට ඒක පාර්ශ්විකව සිය කැමැත්ත ඉවත් කරගත නොහැකිය.

කේන්ද්‍රය බැංකුවට සමීප සබඳතා ඇති ස්වතන්ත්‍ර සංවිධානයක් වන අතර එහි සියලු සාමාජිකයෝ බැංකුවේ ද සාමාජිකයෝ වෙති. ලෝක බැංකු සභාපතිවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් එහි පරිපාලන මණ්ඩලය සෑදී ඇත්තේ සම්මුතිය සනාථ කර සපථ කර ඇති සෑම රටකම නියෝජිතයා බැගින් එක්වීමෙනි.

## අන්තර්ජාතික මූල්‍ය අරමුදල (IMF)

1944 බ්‍රිටන්වුඩ්ස් සමුළුවේදී ස්ථාපනය කරන ලද අන්තර්ජාතික මූල්‍ය අරමුදල-

* අන්තර්ජාතික මූල්‍ය සහයෝගිතාව පහසු කරයි.

* විනිමය අනුපාත ස්ථායිතාව සහ ක්‍රමානුකූල විනිමය ගනුදෙනු ප්‍රවර්ධනය කරයි.

* බහු පාර්ශ්වික ගෙවීම් ක්‍රමයක් ස්ථාපනයට සහ විදේශ විනිමය සීමාකරණය අහෝසි කිරීමට සහාය වෙයි.

* සාමාජික රටවල ගෙවුම් ශේෂයේ වැරදි ගැලපීම් නිවැරදි කිරීම සඳහා තාවකාලික මූල්‍ය සම්පත් සැපයීමෙන් ඔවුනට සහාය වෙයි.

මූල්‍ය අරමුදල සිය ගිණුම්වලදී SDR යන කෙටි නාමයෙන් හැඳින්වෙන ඒකකයක් භාවිත කරයි. දැන් මුළු ගණන SDR බිලියන 210 ක් හෙවත් ඩොලර් බිලියන 300 ක්

වන අරමුදලේ මූල්‍ය සම්පත් ගොඩනැගී ඇත්තේ ප්‍රධාන වශයෙන් සාමාජික රටවල් 182 ක දායක මුදල් (පංගු) වලිනි. සාමාජික රටවල ආර්ථිකයේ සාපේක්ෂ විශාලත්වය පදනම් කොටගත් සූත්‍රයක් අනුව පංගු තීරණය කෙරේ. විශේෂ හැරගැනීමේ අයිතිවාසිකම් (SDR) ස්වරූපයෙන් සිය සාමාජිකයන් උදෙසා අන්තර්ජාතික මූල්‍ය සංචිත නිර්මාණය කිරීමටත් ප්‍රතිපාදනය කිරීමටත් මූල්‍ය අරමුදලට බලය ඇත.

අරමුදලේ ප්‍රධානතම මූල්‍ය කාර්යභාරය ගෙවුම්ශේෂ දුෂ්කරතාවන්ට මුහුණපා සිටින සාමාජිකයනට තාවකාලික ණය සැපයීමයි. අරමුදලෙන් ණය ගැනීමට හිලව් වශයෙන් එකී දුෂ්කරතා පිටුපස ඇති ගැටලු නිරාකරණය සඳහා ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට සාමාජිකයෝ එකඟ වෙති. සාමාජිකයනට අරමුදලෙන් ගත හැකි ණය ප්‍රමාණය ඔවුන්ගේ පංගුවලට අනුපාතිකව සීමා වෙයි.

මූල්‍ය අරමුදල අඩු ආදායම් සාමාජික රටවලට සහනදායී උදව් සලසයි. අරමුදල පාලනය වන්නේ සියලු රටවල් නියෝජනය වන සහ වාර්ෂිකව රැස්වන පාලක මණ්ඩලය නම් වූ ආයතනය විසිනි. සුවිසි සාමාජික විධායක මණ්ඩලය විසින් එදිනෙදා වැඩ මෙහෙයවනු ලැබේ. අතුරු කමිටුවක් ඊට උපදෙස් දෙයි.

රටවල් 123ක ට අයත් 2700 ක් පමණ කාර්ය මණ්ඩලයකින් යුත් මූල්‍ය අරමුදලේ ප්‍රධානියා කළමනාකරණ අධ්‍යක්ෂවරයායි. විධායක මණ්ඩලය ඔහු තෝරා ගනී. එහි වාර්ෂික පරිපාලන අයවැය ඩොලර් මිලියන 650 ක් පමණ වෙයි. මූල්‍ය අරමුදල වසරකට දෙවරක් ලෝක ආර්ථික විපරම (World Economic Out-look) සහ වාර්ෂිකව අන්තර්ජාතික ප්‍රාග්ධන වෙළෙඳ පොළ වාර්තාව (International Capital Markets Report) ප්‍රකාශයට පත් කරයි.

Managing Director : Mr. Rodrigo de Ratoy Figaredo (Spain)
Headquarters : 700 19th Street NW, Washington, D. C. 20431, USA
Telephone : (1 202) 623 7000; Fax : (1 202) 623 4661
E-mail : publicaffairs@imf.org
Internet : www.imf.int

## අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානය (ICAO)

අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානය එක් රටක සිට තවත් රටකට පියාසර කිරීම වඩා සුරක්ෂිත හා පහසු කරයි. 1944 දී ස්ථාපිත එය ගුවන් ප්‍රවාහනයේ

සුරක්ෂිතබව, පහසුව, කාර්යක්ෂමතාව සහ විධිමත්බව සඳහා අවශ්‍ය අන්තර්ජාතික ප්‍රමිතීන් හා රෙගුලාසි නියම කරයි. සාමාජික රාජ්‍ය 185 අතර සිවිල් ගුවන් සේවාවට අදාළ සියලු ක්ෂේත්‍රවල සහයෝගිතා මාධ්‍යය ලෙස සේවය කරයි.

ICAO පාලක මණ්ඩලය ලෙස ක්‍රියා කරන්නේ සියලු ගිවිසුම්කාර රාජ්‍යයන්ගේ දූත පිරිස්වලින් සමන්විත මන්ත්‍රණ සභාවක් සහ මන්ත්‍රණ සභාව විසින් තෝරා ගනු ලබන ජාතීන් 33 ක නියෝජිතයන්ගෙන් සැදුම්ලත් මණ්ඩලයකිනි. මණ්ත්‍රණ සභාව අඩුම වශයෙන් වසර තුනකට වරක් රැස්වෙයි. ICAO ප්‍රතිපත්ති තීරණය කරන එය මණ්ඩලයට සුවිශේෂයෙන් යොමුකර නැති ඕනෑම කරුණක් විභාග කරයි. විධායක ආයතනය වන මණ්ඩලය මන්ත්‍රණ සභාවේ නියෝග ක්‍රියාත්මක කරයි.

ICAO කාර්ය මණ්ඩලය 793 කි. 2000 වසරේ අයවැය ඩොලර් මිලියන 52.6 ක් විය.

President of the Council : Dr. Assad Kotaite (Lebanon)
Secretary General : Mr. R. C. Costa Pereira (Brazil)
Headquarters : 999 University Street, Montreal, Quebéc H3C 5H7, Canada.
Telephone : (1) (514) 954 8129; Fax : (1) (514) 954 6077
E-mail : icaohq@icao.org
Internet : www.icao. int

## අන්තර්ජාතික නාවික ප්‍රවාහන සංවිධානය (IMO)

**IMO**

1959 දී සිය ක්‍රියාකාරිත්වය ආරම්භ කළ අන්තර් ජාතික නාවික ප්‍රවාහන සංවිධානය අන්තර්ජාතික වෙළෙඳාමෙහි නිරත නැව් සේවාවන්හි සුරක්ෂිතතාව වැඩි දියුණු කිරීම සහ නැව්වලින් සිදුවන සමුද්‍ර දූෂණය වැළැක්වීම පිළිබඳ වගකීම භාරව සිටී. අන්තර්ජාතික නාවික ප්‍රවාහනයට අදාළ තාක්ෂණික කරුණු සම්බන්ධ රෙගුලාසි සහ පුරුදු සැකසීමේදී සහයෝගයෙන් ක්‍රියා කිරීම සඳහා වූ යන්ත්‍රණයක් ආණ්ඩුවලට සපයා දෙයි. සමුද්‍ර ප්‍රවාහනයේ ඉහළම ප්‍රායෝගික ප්‍රමිතීන් සහ නාවික ගමනාගමනයේ කාර්යක්ෂමතාව පවත්වා ගැනීම පහසු කරයි. නැව් නිසා සිදුවන දූෂණය පාලනය කිරීමෙන් සහ වළක්වා ගැනීමෙන් සමුද්‍ර පරිසරය ආරක්ෂා කිරීමට උදව් දෙයි.

දැනට සම්මුති සහ ගිවිසුම් 40ක් පමණ ද, චර්යා පද්ධති සහ නිර්දේශ 800ක් පමණ ද සම්පාදනය කොට ලෝක පරිමාණව ක්‍රියාත්මකභාවයට පත්කොට ඇත.

සංවිධානය විසින් 1983 දී ස්වීඩනයේ මැල්මෝහි පිහිටුවන ලද ලෝක නාවික ප්‍රවාහන විශ්වවිද්‍යාලය ජ්‍යෙෂ්ඨ මට්ටමින් නැව් සේවාවට සම්බන්ධ පරිපාලකයන්ට, දැනුවත් කරන්නන්ට සහ සෙසු අයට උසස් පුහුණුව සපයයි. අන්තර්ජාතික නාවික ප්‍රවාහන නීතිය පිළිබඳව නීතිඥයන් පුහුණු කිරීම පිණිස 1989 දී මෝල්ටාවේ වැලෙටාහි අන්තර්ජාතික නාවික ප්‍රවාහන නීති ආයතනය ස්ථාපනය කෙරිණි. 1989 දී ඉතාලියේ ට්‍රියෙස්ටේ නගරයේ පිහිටුවන ලද IMO අන්තර්ජාතික නාවික ප්‍රවාහන ඇකඩමිය නාවික ප්‍රවාහනයේ විවිධ අංශවල විශේෂිත කෙටි කාලීන පාඨමාලා මෙහෙයවයි.

සියලු සාමාජික රාජ්‍යයන්ගෙන් සැදුම්ලත් සෑම දෙවසරකට වරක් රැස්වන මන්ත්‍රණ සභාවක් මගින් IMO පාලනය කෙරේ. මන්ත්‍රණ සභාව තෝරාගන්නා සාමාජිකයන් 32කින් යුත් මණ්ඩලය සංවිධානයේ විධායක ආයතනය වන අතර එය වසරකට දෙවරක් රැස්වෙයි.

2000-2001 IMO අයවැය ඩොලර් මිලියන 56.3 ක් විය. එහි කාර්ය මණ්ඩලය 300ක් පමණ වෙයි.

Secretary-General : Mr. Etthimios E. Mitropolous (Greece)
Headquarters : 4 Albert Embankment, London SE1 7SR, England
Telephone : (44 207) 735 76 11; Fax : (44 207) 587 32 10
E-mail : info@imo.org
Internet : www.imo.org

## අන්තර්ජාතික විදුලි සන්දේශ සේවා සංගමය (ITU)

අන්තර්ජාතික විදුලි සන්දේශ සේවා සංගමය ආණ්ඩුවලට සහ පෞද්ගලික අංශයට ලෝක විදුලි සන්දේශ සේවා ජාලයන් සහ සේවාවන් සම්බන්ධීකරණයට ඉවහල් වන්නා වූ සංවිධානයකි. අන්තර්ජාතික ටෙලිග්‍රාෆ් සංගමය නමින් 1865 පැරිසියේ දී

ස්ථාපිත එය 1934 දී වත්මන් නාමය ගත් අතර 1947 දී එක්සත් ජාතීන්ගේ විශේෂිත ආයතනයක් බවට පත්විය.

විදුලි සන්දේශ සේවා සංගමයේ කාර්යභාරය පහත සඳහන් සේවා ආවරණය කරයි :

* *තාක්ෂණික ක්ෂේත්‍රය* : විදුලි සංදේශ සේවාවල කාර්යක්ෂමතාව නැංවීමත් එකී සේවා ලබාගැනීම ජනතාවට පහසු කිරීමත් අරමුණු කොටගෙන විදුලි සන්දේශ සේවා පහසුකම් හා ඒවායේ කාර්යක්ෂම ක්‍රියාකාරීත්වය සංවර්ධනයට දායකවීම;

* *ප්‍රතිපත්ති ක්ෂේත්‍රය* : ලෝක තොරතුරු ආර්ථිකයෙහි සහ සමාජයෙහි විදුලි සන්දේශ සේවාවන්ට අදාළ ගැටලු අරභයා පුළුල් ප්‍රවේශයක් සකසා ගැනීමට දිරිගැන්වීම ;

* *සංවර්ධන ක්ෂේත්‍රය* : සංවර්ධනය වන රටවලට විදුලි සන්දේශ සේවා ක්ෂේත්‍රයේ තාක්ෂණික ආධාර ප්‍රවර්ධනය හා සැලසීම. විදුලි සන්දේශ සේවා සංවර්ධනයට අවශ්‍ය මනාව හා මුල්‍ය සම්පත් සංචලනයට දිරිදීම සහ නව තාක්ෂණ විද්‍යාවන්හි ප්‍රතිලාභ ලොව සෑම තැනකම ජනතාව වෙත ව්‍යාප්ත කිරීම.

ITU සාමාජික රාජ්‍ය 189කින් සහ (විද්‍යාත්මක හා කාර්මික සමාගම්, රාජ්‍ය සහ පෞද්ගලික ක්‍රියාකරුවන්, ගුවන්විදුලි ආයතන, කලාපීය සහ අන්තර්ජාතික සංවිධාන) ආංශීය සාමාජිකයන් 600කින් පමණ සමන්විත වෙයි. එහි පාලක මණ්ඩලය සෑම අවුරුදු 4කට වරක්ම රැස්වන පූර්ණ බලැති සමුළුවයි. මේ සමුළුව විසින් තෝරාගනු ලබන 46 සාමාජික ITU මණ්ඩලය අවුරුදු පතා හමු වෙයි.

විදුලි සංදේශ සේවා සංගමයේ කාර්ය මණ්ඩලය 740කි. 2000 -2001 දෙවාර්ෂිකයේ එහි අයවැය ඩොලර් බිලියන 43ක් විය.

Secretary - General : Mr. Yoshio Utsumi (Japan)
Headquarters : Place des Nations : CH 1211 Geneva 20, Switzerland
Telephone : (41 22) 730 5111, Fax : (4122) 733 7256
E- Mail : itumail@itu.int
Internet: www.itu.int

# විශ්ව තැපැල් සංගමය (UPU)

විශ්ව තැපැල් සංගමය අන්තර්ජාතික තැපැල් සේවා හසුරුවන්නා වූ විශේෂිත ආයතනයයි. 1874 බර්න් සම්මුතියෙන් ස්ථාපිත එය 1948 දී එක්සත් ජාතීන්ගේ විශේෂිත ආයතනයක් බවට පත්විය.

විශ්ව තැපැල් සංගමය තැපැල් සේවා අඛණ්ඩව සංවර්ධනය කිරීමෙහි ලා පුරෝගාමී කාර්යභාරයක් ඉටු කරයි. සාමාජික රටවල් 189 කින් සැදුම්ලත් එය තැපැල් සේවා අතර සහයෝගිතාව සඳහා මූලික මෙවලම වන්නේය. උපදෙස්දීම, මැදිහත්වීම සහ තාක්ෂණික ආධාර සැපයීම, එහි කාර්යයන් අතර වෙයි. විශ්ව තැපැල් සේවාව වැඩි වර්ධනය කිරීම, නවීනතම තැපැල් නිෂ්පාදන හා සේවා හඳුන්වා දීමෙන් තැපැල් ලිපි සංඛ්‍යාව වර්ධනය කිරීම, පාරිභෝගිකයාගේ පාර්ශවයෙන් බලා තැපැල් සේවාවන්හි ගුණාත්මක තත්ත්වය නැංවීම එහි ප්‍රධාන පරමාර්ථ අතර කැපී පෙනෙයි. මෙසේ කිරීමෙන් විශ්ව තැපැල් සංගමය ලෝකයේ සියලු ජනතාවන් අතර සන්නිවේදනය සංවර්ධනය කිරීමේ හා ඉහළ මට්ටමකට ගෙන ඒමේ සිය මෙහෙවර සාක්ෂාත් කර ගනී.

තැපැල් සංගමයේ උත්තරීතර අධිකාරිය වන්නේ විශ්ව තැපැල් කොන්ග්‍රසයයි. සෑම අවුරුදු 5කට වරක්ම රැස්වන එය තැපැල් සේවාවට අදාළ උපායමාර්ගික කරුණු විභාග කරමින් පොදු වැඩසටහන් හා ක්‍රියාකාරකම් නියම කරයි. සංගමයේ 23 වැනි කොංග්‍රසය 2004 දී කෝට් ඩි අයිවෝරි රාජ්‍යයේ අබිජාන් නගරයේ දී පැවැත්වේ.

2000 වසරේ දී UPU අයවැය ඩොලර් මිලියන 22.5ක් විය. එහි කාර්ය මණ්ඩලය 151කි.

Director-General : Mr. Thomas E. Leavey (USA)
Headquarters : Weltpoststrasse 4, Case Postale 3000, Berne 15, Switzerland
Telephone : (41 31) 350 31 11; Fax : (41 31) 350 31 10
E- mail : info@upu.int
Internet : www.upu.int

# ලෝක කාලගුණ විද්‍යා සංගමය (WMO)

1951 සිට එක්සත් ජාතීන්ගේ විශේෂිත ආයතනයක් ලෙස ක්‍රියා කරන ලෝක කාලගුණ විද්‍යා සංවිධානය වායුගෝලීය පරිසරය, පෘථිවියේ මිරිදිය සම්පත් සහ දේශගුණික කරුණු පිළිබඳ විශ්වාසදායක විද්‍යාත්මක තොරතුරු සම්පාදනය කරයි. වාරික, කාලගුණ අනාවැකි ඇතුළු කාලගුණ අනාවැකි සේවා සංවර්ධනය කරන එය ලෝක කාලගුණික තත්ත්වයන් හඳුනා ගැනීම සඳහා අන්තර්ජාතික සහයෝගිතාව තුළින් දායක වෙමින් කාලගුණික තොරතුරු ඉක්මනින් හුවමාරු කර ගැනීමටත් ජල විද්‍යා කාර්යයන් ප්‍රවර්ධනයටත් පහසුකම් සලසයි.

කාලගුණ විද්‍යා සංවිධානය දේශගුණය, වායුගෝලය, ව්‍යවහාරික කාලගුණ විද්‍යාව සහ ජල සම්පත් වැනි විෂයයන් අළලා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

ඝර්ම කලාපීය චණ්ඩ කුණාටු, එල්-නිනෝ, ගංවතුර, නියඟ සහ වෙනත් ස්වභාවික විපත් වැනි කටුක කාලගුණික තත්ත්වයන් ගැන කල්තබා අන්තරාය ඇඟවීමෙන් සහ ඊට මුහුණ දීමට සූදානම් කිරීමෙන් ජීවිත සහ දේපළ රැක ගැනීමටත් පරිසරය සහ දේශගුණය පිළිබඳ අපේ අවබෝධය වැඩිදියුණු කිරීමටත් පදනම සැපයෙන්නේ මේ වැඩ සටහන් මගිනි. කාලගුණ විද්‍යා සංවිධානය, ඕසෝන් ස්ථරය වියැකීයාම, පෘථිවිය උණුසුම්වීම සහ ජල සම්පත් සිඳීයාම වැනි ප්‍රධාන පෙළේ ගැටලු පිළිබඳව අවධානය යොමු කරවයි.

තමන්ගේම කාලගුණ විද්‍යා සහ ජල විද්‍යා සේවා පවත්වාගෙන යන රාජ්‍යයන් 179ක් සහ භූමි ප්‍රදේශ 6ක් ඇතුළු සාමාජිකයන් 185කින් WMO නිර්මාණය වී ඇත. එහි පාලක මණ්ඩලය සෑම හතර වසරකට වරක් රැස්වන ලෝක කාලගුණ විද්‍යා කොන්ග්‍රසයයි. 36 සාමාජික විධායක මණ්ඩලය අවුරුදු පතා රැස්වෙයි.

WMO කාර්ය මණ්ඩලය 246කි. 2000- 2003 අයවැය ඩොලර් මිලියන 152ක් විය.

Secretary - General : Dr. Michel Jarraud (France)
Headquaters : 7 bis, Avenue de la Paix, CH- 1211 Geneva 2, Switzerland
Telephone : (44 22) 730 8111 ; Fax : (44 22) 730 8181
E- mail : ipa@gateway. wmo.ch
Internet : www. wmo.ch

# ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO)

1970 දී ස්ථාපිත ලෝක බුද්ධිමය දේපළ සංවිධානය 1974 දී එක්සත් ජාතීන්ගේ විශේෂිත ආයතනයක් බවට පත්විය. සාමාජික රාජ්‍යයන් 175ක් සමග සහයෝගයෙන් ක්‍රියා කරමින් ලොව පුරා බුද්ධිමය දේපළ ක්ෂේත්‍රයේ ආරක්ෂාව සැලසීම පිණිස පිහිටුවා ඇති සංගම් අතර පරිපාලන සහයෝගිතාව සහතික කිරීම එහි පාරමාර්ථ වන්නේය.

මෙතෙක් ස්ථාපනය කර ඇති ප්‍රධාන සංගම් මෙසේය :

* පැරිස් සංගමය, නිල නාමය : කාර්මික දේපළ ආරක්ෂාව සඳහා අන්තර්ජාතික සංගමය ;

* බර්න් සංගමය, නිල නාමය : සාහිත්‍ය හා කලා නිර්මාණ ආරක්ෂාව සඳහා අන්තර්ජාතික සංගමය

බුද්ධිමය දේපළ ප්‍රධාන කොටස් දෙකකින් සමන්විතය.

කාර්මික දේපළ : නව නිර්මාණ වෙළෙඳ සලකුණු, කාර්මික සැලසුම් සහ ආරම්භක අභිදාන ඊට අයත්ය.

*ප්‍රකාශන අයිතිය* : සාහිත්‍යය, සංගීත, චිත්‍ර සහ වෙනත් කලා, චිත්‍රපට, ඡායාරූප සහ ප්‍රසාංගික නිර්මාණ ඊට අයත්ය. බුද්ධිමය දේපළ සංවිධානය අන්තර්ජාතික ගිවිසුම් 21ක පරිපාලනය භාරව සිටී. ඉන් 15ක් කාර්මික දේපළ ද ඉතිරි 6 ප්‍රකාශන අයිතිවාසිකම් ද අවාරණය කරයි.

WIPO පාලනය වන්නේ පාලක මණ්ඩල 3 ක් මගිනි. 1. මහා මන්ත්‍රණ සභාව : සෑම දෙවසරකටම වරක් රැස්වන එය පැරිස් සහ/හෝ බර්න් සංගමයේ සාමාජිකයන් වන WIPO සාමාජික රාජ්‍යයන්ගෙන් නිර්මාණය වී තිබේ. 2. සමුළුව : සෑම දෙවසරකට වරක් රැස්වන එය සියලු සාමාජික රාජ්‍යයන් එක්වී සෑදී ඇත. 3. සම්බන්ධීකරණ කමිටුව : සාමාජිකයන් 72කින් යුත් එය සෑම වසරකම රැස්වෙයි.

WIPO වැඩසටහන් සහ අයවැය එහි පාලක මණ්ඩලය විසින් ද්වි වාර්ෂිකව තීරණය කරනු ලැබේ. එහි 2000- 2001 අයවැය ඩොලර් මිලියන 248ක් විය. කාර්ය මණ්ඩලය 765කි.

Secretary - General : Dr. Kamal Idris (Sudan)
Headquarters : 34 Chemin des Colombettes 1211 Geneva 20, Switzerland
Telephone : (41 22) 338 91 11 ; Fax (41 22) 733 28
E- mail : PUBLICINF.mail@wipo.int
Internet : www. wipo.int

## කෘෂිකාර්මික සංවර්ධනය සඳහා අන්තර්ජාතික අරමුදල (IFAD)

1974 ලෝක ආහාර සමුළුවේ තීරණයක් අනුව 1977 දී ස්ථාපිත කෘෂිකාර්මික සංවර්ධනය සඳහා අන්තර්ජාතික අරමුදල සංවර්ධනය වන රටවල සාගින්න සහ ග්‍රාමීය දිළිඳු බව පිටුදැකීම කාර්යභාරය කොටගත් බහුපාර්ශ්වික මූල්‍ය ආයතනයකි.

අරමුදල, දිළිඳුතම ග්‍රාමීය ජන කණ්ඩායම්වල අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කරමින් සංවර්ධනය වන රටවල දිළිඳු ජනයා සඳහා ආහාර නිෂ්පාදනය සහ ඔවුන්ගේ පෝෂණ තත්ත්වය නැංවීම පිණිස සම්පත් මෙහෙයවයි. අන්ත දරිද්‍රතාව සමග සැමවිටම බැඳී ඇති නිදන්ගත සාගින්න සහ මන්දපෝෂණය සියයට 75ක්ම දක්නට ලැබෙන්නේ ග්‍රාමීය ප්‍රදේශවල ය.

ණය සහ ප්‍රදාන මගින් සෘජු මූල්‍ය පහසුකම් සලසන අරමුදල සිය ව්‍යාපෘති සහ වැඩසටහන් සඳහා අතිරේක සම්පත් සම්පාදනය කොට දෙයි. ණය සැපයීමේ කොන්දේසි සහ නියමයන් අදාළ රටේ ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය අනුව වෙනස් වෙයි. කෘෂිකාර්මික සංවර්ධනය සඳහා අරමුදල ලෝක බැංකුව, කලාපීය සංවර්ධන බැංකු වෙනත් කලාපීය මූල්‍ය ආයතන සහ එක්සත් ජාතීන්ගේ ආයතන ඇතුළු තවත් බොහෝ සංවිධාන සමග එක්ව වැඩ කරයි. මේ ආයතනවලින් බොහොමයකින් IFAD ව්‍යාපෘති සඳහා හවුලේ මූල්‍ය පහසුකම් සැපයේ.

IFAD සඳහා අරමුදල් ලැබෙන්නේ ආණ්ඩුවල ස්වේච්ඡා ප්‍රදාන, විශේෂ පරිත්‍යාග, ණය ආපසු ගෙවීම් සහ ආයෝජන ආදායම්වලිනි. නව ව්‍යාපෘති සහ ප්‍රදාන සඳහා වසරකට වෙන් කෙරෙන මුදල ඩොලර් මිලියන 450ක් පමණ වෙයි. අරමුදලේ කාර්ය මණ්ඩලය 266 කි.

අරමුදල පාලනය කරන පාලක මණ්ඩලය සියලු සාමාජික රාජ්‍යයන්ගෙන් නිර්මාණය වී තිබේ. එය අවුරුදු පතා රැස්වෙයි. සාමාජිකයන් 18 දෙනකුගෙන් සහ විකල්ප සාමාජිකයන් 18 දෙනකුගෙන් සමන්විත විධායක මණ්ඩලය අරමුදලේ මෙහෙයුම් අධීක්ෂණය සහ ණය හා ප්‍රදාන අනුමත කිරීම පිළිබඳ වගකීම භාරව සිටී.

President : Mr. Lennart Bage (Sweden)
Headquarters : *Via* del Serafico 107, 00 142 Rome, Italy
Tele. : (39 06) 54 591, Fax : (39 06) 504 3463
E-mail : ifad@ifad.org
Internet: www.ifad. org

## එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය (UNIDO)

එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානයේ කාර්යය කාර්මික සංවර්ධනය හා සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීමයි. එය 1966 දී මහා මණ්ඩලය විසින් ස්ථාපනය කරන ලදුව 1985 දී එක්සත් ජාතීන්ගේ විශේෂිත ආයතනයක් බවට පත්විය. (UNIDO) (යුනිඩෝව) සංවර්ධනය වන රටවල සහ සංක්‍රාන්ති ආර්ථිකයන් සහිත රටවල ධරණීය කාර්මික සංවර්ධනය සඳහා නිශ්චිත විසඳුම් සැපයීමෙන් ජනතාවන්ගේ ජීවන තත්ත්වය නැංවීමටත් ලෝක සමෘද්ධිය ප්‍රවර්ධනයටත් ක්‍රියා කරයි. අභියෝගවලට මුහුණ දී මේ දී සහ කාර්මික ගෝලීයකරණයේ ප්‍රතිලාභ ව්‍යාප්ත කිරීමේ දී එය කාර්මික ශක්‍යතා ගොඩනැගීම පිණිස ආණ්ඩු, ව්‍යාපාරික සංගම් සහ පෞද්ගලික කර්මාන්ත අංශය සමග සහයෝගයෙන් වැඩ කරයි.

යුනිඩෝවේ කාර්යයන්ට සහාය වනු පිණිස වියානාහි මූලස්ථාන කාර්යාලයේත් ආයෝජන ප්‍රවර්ධන සේවා කාර්යාල පද්ධතියේ සහ ක්ෂේත්‍ර කාර්යාලවලත්, ඉංජිනේරුවන්, ආර්ථික විද්‍යාඥයන් සහ තාක්ෂණ සහ පරිසර විශේෂඥයන් වැනි විද්වත් වෘත්තිකයෝ සේවයේ යෙදී සිටිති. යුනිඩෝ කලාපීය සහ නේවාසික නියෝජිතයෝ ක්ෂේත්‍ර කාර්යාලවල ප්‍රධානීහු වෙති.

දෙවසරකට වරක් පැවැත්වෙන මහා සමුළුවේ දී හමුවන යුනිඩෝවේ සාමාජික රාජ්‍ය 168 එහි අයවැය සහ වැඩසටහන් අනුමත කරයි. වැඩසටහන් සහ අයවැය සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධ නිර්දේශ කරනු ලබන්නේ සාමාජික රාජ්‍ය 53කින් සැදුම්ලත් කාර්මික සංවර්ධනය මණ්ඩලය විසිනි.

යුනිඩෝව 650ක පමණ මූලස්ථාන කාර්ය මණ්ඩලයකින් සමන්විත වන අතර 1999 දී පත්කරන ලද විශේෂඥයෝ 1,830ක් පමණ ලොවපුරා සේවය කරයි. 2000-2001 එහි අයවැය ඩොලර් මිලියන 133ක් විය. බහු පාර්ශ්වික සහ ද්විපාර්ශවික මූලාශ්‍ර මගින් අතිරේක අරමුදල් සම්පාදනය වැඩි වැඩියෙන් සිදුකෙරේ.

Director-General : Mr. Carlos Magariños (Argentina)
Headquarters : Vienna International Centre, A - 1400 Vienna, Austria
Tele. : (43 1) 26026/0; Fax : (43 1) 269 2669
E-mail : unido - pinfo@unido.org
Internet: www.unido.org

# අන්තර්ජාතික පරමාණුක බලශක්ති ආයතනය (IAEA)

අන්තර්ජාතික පරමාණුක බලශක්ති ආයතනය න්‍යෂ්ටික බලශක්තිය සාමකාමී අරමුණු සඳහා භාවිතය පිළිබඳ විද්‍යාත්මක හා තාක්ෂණික සහයෝගිතාව සඳහා වන මධ්‍යම අන්තර් ආණ්ඩු වේදිකාව ලෙසත් න්‍යෂ්ටික සුරැකුම් විධාන භාවිතය හා සිවිල් න්‍යෂ්ටික වැඩසටහන් විමර්ශන ක්‍රියාමාර්ග සඳහා වන අන්තර්ජාතික පරීක්ෂණ ආයතනය ලෙසත් සේවය කරයි. එක්සත් ජාතීන්ගේ අනුග්‍රහය යටතේ 1957 දී ස්වතන්ත්‍ර ආයතනයක් ලෙස එය ස්ථාපනය කරනු ලැබීය.

ආයතනය ස්වයංපෝෂිත න්‍යෂ්ටික විද්‍යා වැඩසටහන් සංවර්ධනය උදෙසා සිය සාමාජික රටවල් 131ට තාක්ෂණික ආධාර සපයයි. ආයතනයේ සේවාවන්ගෙන් අධික පමණ අවධානය යොමු වී ඇත්තේ ආහාර සහ කෘෂිකර්මය, සෞඛ්‍යය, කාර්මාන්ත සහ ජල විද්‍යාව සහ පරිසර දූෂණය, විශේෂයෙන් සමුද්‍ර දූෂණය වැනි ක්ෂේත්‍රවලට අදාළ වැඩසටහන් කෙරෙහිය.

න්‍යෂ්ටික අමුද්‍රව්‍ය යුද්ධමය අරමුණු සඳහා නොයෙදවන බව සහතික කරනු වස් සම්මත කොටගෙන ඇති අන්තර්ජාතික ගිවිසුම් අනුගමනය කරන්නේදැයි විමර්ශනය කිරීමට රාජ්‍යයන්ට ආයතනයේ උදව් ලැබේ. IAEA ආරක්ෂක විධිවිධාන වැඩසටහනෙන් ආවරණය වන ලොවපුරා බලාගාර සහ වෙනත් ස්ථාන දහසකට වැඩි ගණනක පරීක්ෂකවරු 200ක් පමණ සේවයේ නිරතව සිටිති.

IAEA පාලක මණ්ඩල වන්නේ සියලු සාමාජිකයන්ගෙන් සැදුම්ලත් වාර්ෂිකව රැස්වන මහ සමුළුව සහ සාමාජික රාජ්‍යයන් 35කගෙන් සැදුම්ලත් පාලක මණ්ඩලයයි.

පරමාණුක බලශක්ති ආයතනයේ කාර්ය මණ්ඩල 2,133කි. 2000 වසරේ නිත්‍ය අයවැය ඩොලර් මිලියන 224ක් වූ අතර අයවැයට බාහිර ප්‍රදාන වටිනාකම ඩොලර් මිලියන 80ක් විය.

Director General : Dr. Mohamed Elbaradei (Egypt)
Headquarters : Vienna International Centre, Wagramerstrasse 5
P. O. Box 100, A-1400 Vienna, Austria
Tele. : (43 1) 2600-0 ; Fax: (43 1) 2600-7
E- mail: official.mail@iaea. org
Internet : www.iaea.org

## න්‍යෂ්ටික අවි අත්හදා බැලීම් සපුරා තහනම් කිරීමේ ගිවිසුම් සංවිධානය පිළිබඳ ප්‍රාරම්භක කොමිසම (CTBTO)

න්‍යෂ්ටික අවි අත්හදා බැලීම් සපුරා තහනම් කිරීමේ ගිවිසුම් සංවිධානය පිළිබඳ ප්‍රාරම්භක කොමිසම 1996 නොවැම්බර් 19 වැනිදා නිව්යෝක් නුවර පැවැති පාර්ශවකාර සාමාජික රාජ්‍යයන්ගේ රැස්වීමක දී ස්ථාපනය කරනු ලැබීය. පාර්ශවකාර රාජ්‍යයන් විසින් අරමුදල් සැපයෙන සංවිධානයක් වන එය අවයව දෙකකින් සමන්විත වේ. සියලු පාර්ශ්වකාර රාජ්‍යයන්ගෙන් සැදුම්ලත් පූර්ණ මණ්ඩලය (මෙය ප්‍රාරම්භක කොමිසම ලෙස ද හැඳින්වේ.) සහ තාවකාලික තාක්ෂණික ලේකම් කාර්යාලය, ප්‍රාරම්භක කොමිසමේ ප්‍රධාන කාර්යය ගිවිසුමෙන් අනුදත් ලෝක විමර්ශන පද්ධතියක් ගොඩනැගීමයි. ගිවිසුම ක්‍රියාත්මක භාවයට පැමිණෙන වකවානුව වන විට මේ පද්ධතිය ප්‍රයෝජනයට ගැනීමට සැලසුම් කර ඇත. කොමිසමේ අතුරු මණ්ඩල තුනකි : ක්‍රියාකාරී කණ්ඩායම A, පරිපාලන සහ අයවැය විෂයය භාරව සිටී. ක්‍රියාකාරී කණ්ඩායම B, විමර්ශන කාර්යයන් භාරව සිටී. සහ උපදේශක කණ්ඩායම මූල්‍ය අයවැය සහ ආශ්‍රිත පරිපාලන කටයුතු භාරව සිටී.

Executive Secretary : Mr. Wolfgang Hoffmann (Germany)
Headquarters : Vienna International Centre, P. O. Box 1200, A - 1400
Vienna, Austria
Tele. : (431) 26030 6159 ; Fax : (431) 26030 55877
E-mail : info@ctbto.org
Internet : www.ctbto.org

## රසායනික අවි තහනම සඳහා සංවිධානය (OPCW)

රසායනික අවි තහනම සඳහා සංවිධානයේ ප්‍රධාන කාර්යය රසායනික අවි සංවර්ධනය, නිෂ්පාදනය, රැස්කොට තබා ගැනීම සහ පරිහරණය තහනම් කිරීමේ හා ඒවා විනාශ කිරීමේ සම්මුතිය ක්‍රියාවට නැංවීමයි. 1997 අප්‍රේල් 29 දා ක්‍රියාත්මකභාවයට පැමිණි සම්මුතිය සමූහ ඝාතක අවි විශේෂයක් මුලුමනින්ම තුරන් කිරීමට ඉවහල් වන ප්‍රථම අන්තර්ජාතික නිරායුධකරණ ගිවිසුමයි.

රසායනික අවි තහනම් සංවිධානයේ ප්‍රධාන ආයතනය වන්නේ සියලු සාමාජිකයන්ගෙන් සැදුම්ලත් වාර්ෂිකව රැස්වන, පාර්ශවකාර රාජ්‍යයන්ගෙන් සමුළුවයි. විධායක මණ්ඩලය සංවිධානයේ එදිනෙදා වැඩ අධීක්ෂණය කරයි. දෙවසරක කාලයක් සඳහා සාමාජික රාජ්‍යයන් අතරින් තෝරා ගන්නා ලද නියෝජිතයන් 41 දෙනකුගෙන් එය නිර්මාණය වී තිබේ. විමර්ශන සිදු කිරීම, රසායනික අවි පරිහරණය කරනු ලැබුවහොත් උපකාර සැලසීම සහ රසායන විද්‍යාව සාමකාමී අරමුණු සඳහා භාවිත කිරීමේ ලා අන්තර්ජාතික සහයෝගිතාව වර්ධනය කිරීම

ඇතුලු සම්මුතියෙන් නියම කර ඇති ක්‍රියාකාරකම් පිළිබඳ මූලික වගකීම තාක්ෂණික ලේකම් කාර්යාලයට පැවරී ඇත. විද්‍යාත්මක උපදේශක මණ්ඩලය සම්මුතියට අදාළ විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රවල විශේෂඥ උපදෙස් සපයයි.

OPCW කාර්ය මණ්ඩලය 500ක් පමණය. වාර්ෂික අයවැය ඩොලර් මිලියන 56කි.

Director - General : Mr. Rogelio Ptirter (Argentina)
Headquarters : Johan de Wittlaan 32, 2517 the Hague, The Netherlands
Tele. : (31 70) 416 3300; Fax : (31 70) 306 3535
E-mail : webmaster@opcw.org
Internet : www.opcw.org

## ලෝක සංචාරක කර්මාන්ත සංවිධානය (WTO)

1925 දක්වා දිවෙන ඉතිහාසයක් සහිත ලෝක සංචාරක කාර්මාන්ත සංවිධානය ගමන් බිමන් හා සංචාරක කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රමුඛ අන්තර්ජාතික සංවිධානයයි. එය සංචාරක කර්මාන්ත ප්‍රතිපත්ති පිළිබඳ ලෝක සංවාද මණ්ඩපයක් ලෙස ද, කර්මාන්තයේ විධික්‍රම පිළිබඳ ප්‍රායෝගික මූලාශ්‍රයක් ලෙස ද සේවය සලසයි. රටවල් සහ භූමි ප්‍රදේශ 138කින් මෙන්ම පළාත් පාලන ආයතන, සංචාරක ව්‍යාපාර සංගම් සහ ගුවන් සේවා, හෝටල කණ්ඩායම් හා ගමන් බිමන් සේවා ඇතුලු පෞද්ගලික අංශයේ සමාගම් නියෝජනය කරන අනුබද්ධ සාමාජිකයින් 350කින් එහි සාමාජිකත්වය සමන්විත වෙයි.

එක්සත් ජාතීන් විසින් සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය හා සංවර්ධනය පිළිබඳ වගකීම පවරනු ලැබ ඇති අන්තර් ආණ්ඩු ආයතනයක් වන ලෝක සංචාරක කර්මාන්ත සංවිධානය 1977 දී එක්සත් ජාතීන් සමග සහයෝගිතා ගිවිසුමකට එළඹියේය. සංචාරක ව්‍යාපාරය මගින් ආර්ථික වෘද්ධිය සහ රැකියා උත්පාදනය උත්තේජනය කිරීමත් සංචාරකයන්ගේ ආකර්ශනයට ලක් වූ පාරිසරික හා සංස්කෘතික උරුමය රැක ගැනීම දිරි ගැන්වීමත් ජාතීන් අතර අන්‍යෝන්‍ය අවබෝධය වැඩිදියුණු කිරීමත් එහි පරමාර්ථයෝ වෙති.

WTO උත්තරීතර ආයතනය පූර්ණ හා ආශ්‍රිත සාමාජිකයන්ගෙන් සැදුම්ලත් මහා මන්ත්‍රණ සභාවයි. අයවැය සහ වැඩසටහන අනුමත කිරීම හා සංචාරක ව්‍යාපාර අංශයේ ප්‍රධාන මාතෘකා විවාද කිරීම පිණිස එය සෑම දෙ වසරකටම වරක් රැස්වෙයි. සංවිධානයේ පාලක ආයතනය වන්නේ මන්ත්‍රණ සභාව විසින් තෝරා ගනු ලබන සාමාජිකයන් 26 දෙනෙකුගෙන් යුත් විධායක මණ්ඩලයයි. එය වසරකට දෙවරක් රැස්වෙයි. කලාපීය කොමිෂන් සභා 6කි. අප්‍රිකාව, අමෙරිකාව, නැගෙනහිර ආසියාව

සහ ශාන්තිකරය, යුරෝපය, මැද පෙරදිග, දකුණු ආසියාව යන කලාපවල සාමාජිකයන්ගෙන් සැදුම්ලත් ඒවා අඩුම වශයෙන් වසරකට වරක්වත් රැස්වෙයි.

WTO කාර්ය මණ්ඩලය 80කි. දෙවාර්ෂික අයවැය ඩොලර් මිලියන් 18ක් පමණ වෙයි.

Secretary - General Francesco Frangialli (France)
Headquarters : Capitnán Haya 42, 28020 Madrid, Spain
Tele. : (34) 91 567 81 00 ; Fax : (34) 91 571 37 33
E-mail :omt@world- tourism.org
Internet : www.world - tourism.org

## ලෝක වෙළෙඳ සංවිධානය (WTO)

තීරුබදු සහ වෙළෙඳාම පිළිබඳ පොදු සම්මුතියේ (GATT) අනුප්‍රාප්තිකයා ලෙස 1995 දී ස්ථාපිත ලෝක වෙළෙඳ සංවිධානය ජාතීන් අතර වෙළෙඳාමේ ලෝක නීති ගැන ක්‍රියාකරන එකම අන්තර්ජාතික සංවිධානය යි. එය විශේෂිත ආයතනයක් නොවන නමුදු සහයෝගිතා වැඩපිළිවෙළ සහ ක්‍රියාකාරකම් මගින් එක්සත් ජාතීන් සමග සම්බන්ධ වී සිටී.

නීතිමත පදනම් වූ ක්‍රමයක් ඇතුළත බාධා විරහිත වෙළෙඳ ප්‍රවාහයට උදව්දීම, ආණ්ඩු අතර වෙළෙඳ ආරවුල් අපක්ෂපාතීව සමථයකට පත් කිරීම සහ වෙළෙඳ සාකච්ඡා සංවිධානය එහි පරමාර්ථයෝ වෙති. අන්තර්ජාතික වාණිජ සහ වෙළෙඳ ප්‍රතිපත්ති පිළිබඳ නෛතික පසුබිම නිර්මාණය කරන WTO ගිවිසුම් 60ක් පමණ එහි ආත්මය ලෙස පවතී.

වෙනස්කම් නොකිරීම ( වඩාත්ම ප්‍රියතම ජාතික වගන්තිය) නිදහස් වෙළෙඳාම, තරගය දිරි ගැන්වීම සහ අඩුවෙන් සංවර්ධිත රටවල් සඳහා අතිරේක විධිවිධාන සැලසීම යන මූලධර්ම මත මේ ගිවිසුම පදනම් වී තිබේ. ආරක්ෂණවාදය අඩු කිරීම වෙළෙඳ සංවිධානයේ අවසාන අරමුණක් වන්නේය.

WTO ආරම්භ කිරීමෙන් පසු විදුලි සංදේශ සේවා, තොරතුරු තාක්ෂණ උපකරණ සහ මූල්‍ය සේවා වෙළෙඳ  පොළ විවෘත කිරීම සඳහා වූ සාර්ථක සාකාච්ඡාවලට වේදිකාවක් සපයා ඇත. 190කට වැඩි වෙළෙඳ ආරවුල් සමථයකට පත් කිරීමට සමත් වී ඇති එය 1986-1994 උරුගුවේ වෙළෙඳ සාකච්ඡා වටයේ දී එළඹගත් ගිවිසුම් ක්‍රියාත්මක කිරීම නොකඩවා අධීක්ෂණය කරයි.

WTO සාමාජික රටවල් ගණන 146කි. එහි පාලක මණ්ඩලය සෑම දෙවසරකට වරක් රැස්වන අමාත්‍ය සමුළුව යි. පොදු මණ්ඩලය එදිනෙදා වැඩ පිළිබඳ වගකීම දරයි.

වසර 2000 WTO අයවැය ඩොලර් මිලියන 77.1ක් විය. එහි කාර්ය මණ්ඩලය 500කි.

Director - General : Dr. Supachai Panitchpakdi (Thailand)
Headquarters : Centre William Rappard, 154 Rue de Lausanne,
CH - 121 Geneva 21, Switzerland
Tele. : (41 22) 739 51 11 ; Fax : (41 22) 731 42 06
E-Mail : enquiries@wto.org
Internet: www.wto.org

# එක්සත් ජාතීන්ගේ සාමාජික රාජ්‍යයන්

**(2002 දෙසැම්බර් වන විට)**

| *සාමාජික රාජ්‍යය* | *ඇතුළත් වූ දිනය* | | *තක්සේරු පරිමාණය (2000 ප්‍රතිශතය)* | *ජනගහනය 2000* |
|---|---|---|---|---|
| ඇෆ්ගනිස්ථානය | නොවැම්බර් 19 | 1946 | 0.003 | 18,797,000 |
| ඇල්බේනියාව | දෙසැම්බර් 14 | 1955 | 0.003 | 3,791,000 |
| ඇල්ජීරියාව | ඔක්තෝබර් 08 | 1962 | 0.086 | 29,800,000 |
| ඇන්ඩෝරා | ජූලි 28 | 1993 | 0.004 | 72,000 |
| ඇන්ටිගුවා සහ බාර්බුඩා | නොවැම්බර් 11 | 1981 | 0.002 | 67,000 |
| ඇන්ගෝලාව | දෙසැම්බර් 01 | 1976 | 0.010 | 12,092,000 |
| ආජන්ටිනාව | ඔක්තෝබර් 24 | 1945 | 1.103 | 36,125,000 |
| ආමීනියාව | මාර්තු 02 | 1992 | 0.006 | 3,536,000 |
| ඕස්ට්‍රේලියාව | නොවැම්බර් 01 | 1945 | 1.483 | 18,750,000 |
| ඕස්ට්‍රියාව | දෙසැම්බර් 14 | 1955 | 0.942 | 8,077,000 |
| අසබයිජානය | මාර්තු 02 | 1992 | 0.001 | 7,953,000 |
| බහාමාස් | සැප්තැම්බර් 18 | 1973 | 0.015 | 298,000 |
| බහරේන් | සැප්තැම්බර් 21 | 1971 | 0.017 | 642,000 |
| බංගලාදේශය | සැප්තැම්බර් 17 | 1914 | 0.010 | 124,774,000 |
| බාර්බඩෝස් | දෙසැම්බර් 09 | 1966 | 0.008 | 266,000 |
| බෙලාරුස් | ඔක්තෝබර් 24 | 1945 | 0.057 | 10,190,000 |
| බෙල්ජියම | දෙසැම්බර් 27 | 1945 | 1.104 | 10.213.000 |
| බෙලිසේ | සැප්තැම්බර් 25 | 1981 | 0.001 | 238,000 |
| බෙනින් | සැප්තැම්බර් 20 | 1960 | 0.002 | 6,044,000 |
| භූතානය | සැප්තැම්බර් 21 | 1971 | 0.001 | 2,004,000 |
| බොලීවියාව | නොවැම්බර් 14 | 1945 | 0.007 | 7,749.000 |
| බොස්නියා සහ හර්සගොවිනා | මැයි 22 | 1992 | 0.005 | 4,211,000 |
| බොට්ස්වානා | ඔක්තෝබර් 17 | 1966 | 0.010 | 1,571,000 |
| බ්‍රසීලය | ඔක්තෝබර් 24 | 1945 | 1.471 | 161,790,000 |
| බෲනෙයි දාරුස්ලාම් | සැප්තැම්බර් 21 | 1948 | 0.020 | 315,000 |
| බල්ගේරියාව | දෙසැම්බර් 14 | 1955 | 0.011 | 8,256,000 |
| බර්කිනා ෆාසෝ | සැප්තැම්බර් 20 | 1960 | 0.002 | 10,682,000 |
| බුරුන්ඩි | සැප්තැම්බර් 18 | 1962 | 0.001 | 6,300,000 |
| කාම්බෝජය | දෙසැම්බර් 14 | 1955 | 0.001 | 11,246,000 |
| කැමරූන් | සැප්තැම්බර් 20 | 1960 | 0.013 | 14,305,000 |
| කැනඩාව | නොවැම්බර් 09 | 1945 | 2.732 | 30,301,000 |
| කේප්වර්ඩේ | සැප්තැම්බර් 16 | 1975 | 0.001 | 417,000 |
| මධ්‍යම අප්‍රිකානු ජනරජය | සැප්තැම්බර් 20 | 1960 | 0.001 | 3,485,000 |
| චාඩ් | සැප්තැම්බර් 20 | 1960 | 0.001 | 7,270,000 |
| චිලී | ඔක්තෝබර් 24 | 1945 | 0.136 | 14,821,000 |
| චීනය | ඔක්තෝබර් 24 | 1945 | 0.995 | 1,255,698,000 |

| සාමාජික රාජ්‍යය | ඇතුළත් වූ දිනය | | තක්සේරු පරිමාණය (2000 ප්‍රතිශතය) | ජනගහනය 2000 |
|---|---|---|---|---|
| කොලොම්බියාව | නොවැම්බර් 05 | 1945 | 0.109 | 40,826,000 |
| කොමෝරෝස් | නොවැම්බර් 12 | 1975 | 0.001 | 658,000 |
| කොන්ගෝව | සැප්තැම්බර් 20 | 1960 | 0.003 | 2,785,000 |
| කෝස්ටාරිකා | නොවැම්බර් 02 | 1945 | 0.016 | 3,340,000 |
| කෝටේ ඩි අයිවෝර් | සැප්තැම්බර් 20 | 1960 | 0.009 | 14,292,000 |
| ක්‍රොඒෂියාව | මැයි 22 | 1992 | 0.030 | 4,572,000 |
| කියුබාව | ඔක්තෝබර් 24 | 1945 | 0.024 | 11,116,000 |
| සයිප්‍රස් | සැප්තැම්බර් 20 | 1960 | 0.034 | 749,000 |
| චෙක් ජනරජය | ජනවාරි 19 | 1993 | 0.107 | 10,294,000 |
| කොරියානු ප්‍රජාතන්ත්‍රවාදී මහජන සමූහාණ්ඩුව | සැප්තැම්බර් 17 | 1991 | 0.015 | 23,348,000 |
| කොංගෝ ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය | සැප්තැම්බර් 20 | 1960 | 0.007 | 46,812,000 |
| ඩෙන්මාර්ක් | ඔක්තෝබර් 24 | 1945 | 0.692 | 5,301,000 |
| ජිබුටි | සැප්තැම්බර් 20 | 1997 | 0.001 | 623,000 |
| ඩොමිනිකා | දෙසැම්බර් 18 | 1978 | 0.001 | 71,00 |
| ඩොමිනිකානු ජනරජය | ඔක්තෝබර් 24 | 1945 | 0.015 | 9,327,000 |
| ඉක්වදෝර් | දෙසැම්බර් 21 | 1945 | 0.020 | 12,174,000 |
| ඊජිප්තුව | ඔක්තෝබර් 24 | 1945 | 0.065 | 65,978,000 |
| එල් සැල්වදෝර් | ඔක්තෝබර් 24 | 1945 | 0.012 | 6,031,000 |
| එරිත්‍රියාව | මැයි 28 | 1993 | 0.001 | 3,577,000 |
| එස්තෝනියාව | සැප්තැම්බර් 17 | 1991 | 0.002 | 1,429,000 |
| ඉතියෝපියාව | නොවැම්බර් 13 | 1945 | 0.006 | 59,882,000 |
| මයික්‍රෝනීසියා ඒකාබද්ධ රාජ්‍යය | සැප්තැම්බර් 17 | 1991 | 0.004 | 114,000 |
| ෆිජී | ඔක්තෝබර් 13 | 1970 | 0.004 | 796,000 |
| ෆින්ලන්තය | දෙසැම්බර් 14 | 1955 | 0.543 | 5,154,000 |
| ප්‍රංශය | ඔක්තෝබර් 24 | 1945 | 6.545 | 58,846,000 |
| ගැබෝන් | සැප්තැම්බර් 20 | 1960 | 0.015 | 1,188,000 |
| ගැම්බියාව | සැප්තැම්බර් 21 | 1965 | 0.001 | 1,229,000 |
| ජෝජියාව | ජූලි 31 | 1992 | 0.007 | 5,059,000 |
| ජර්මනිය | සැප්තැම්බර් 18 | 1973 | 9.857 | 82,024,000 |
| ඝානා | මාර්තු 08 | 1957 | 0.007 | 19,162,000 |
| ග්‍රීසිය | ඔක්තෝබර් 25 | 1945 | 0.351 | 10,515,000 |
| ග්‍රෙනාඩාව | සැප්තැම්බර් 17 | 1974 | 0.001 | 93,000 |
| ගුවාතමාලාව | නොවැම්බර් 21 | 1945 | 0.018 | 10,799,000 |
| ගිනී | දෙසැම්බර් 12 | 1958 | 0.003 | 7,337,000 |
| ගිනිබිසව් | සැප්තැම්බර් 17 | 1974 | 0.001 | 1,161,000 |
| ගයනා | සැප්තැම්බර් 20 | 1966 | 0.001 | 850,000 |

| සාමාජික රාජ්‍යය | ඇතුළත් වූ දිනය | | තක්සේරු පරිමාණය (2000 ප්‍රතිශතය) | ජනගහනය 2000 |
|---|---|---|---|---|
| හයිති | ඔක්තෝබර් 24 | 1945 | 0.002 | 7,647,000 |
| හොන්දුරාසය | දෙසැම්බර් 17 | 1945 | 0.003 | 6,179,000 |
| හන්ගේරියාව | දෙසැම්බර් 14 | 1955 | 0.120 | 10,113,000 |
| අයිස්ලන්තය | නොවැම්බර් 19 | 1946 | 0.032 | 273,000 |
| ඉන්දියාව | ඔක්තෝබර් 30 | 1945 | 0.299 | 970,933,000 |
| ඉන්දුනීසියාව | සැප්තැම්බර් 28 | 1950 | 0.188 | 204,329,000 |
| ඉරාන ඉස්ලාමීය ජනරජය | ඔක්තෝබර් 24 | 1945 | 0.161 | 61,626,000 |
| ඉරාකය | දෙසැම්බර් 21 | 1945 | 0.032 | 21,800,000 |
| අයර්ලන්තය | දෙසැම්බර් 14 | 1955 | 0.224 | 3,705,000 |
| ඊශ්‍රායලය | මැයි 11 | 1945 | 0.350 | 5,963,000 |
| ඉතාලිය | දෙසැම්බර් 14 | 1955 | 5.437 | 57,588,000 |
| ජැමෙයිකාව | සැප්තැම්බර් 18 | 1962 | 0.006 | 2,576,000 |
| ජපානය | දෙසැම්බර් 18 | 1956 | 20.753 | 126,410,000 |
| ජෝර්දානය | දෙසැම්බර් 14 | 1955 | 0.006 | 6,304,000 |
| කසකස්තානය | මාර්තු 2 | 1992 | 0.048 | 15,049,000 |
| කෙන්යාව | දෙසැම්බර් 16 | 1963 | 0.007 | 29,008,000 |
| කිරිබාති | සැප්තැම්බර් 14 | 1999 | 0.001 | 81,000 |
| කුවේට් | මැයි 14 | 1963 | 0.128 | 2,027,000 |
| කිර්ගිස්තානය | මාර්තු 2 | 1992 | 0.006 | 4,699,000 |
| ලාඕස් මහජන ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය | දෙසැම්බර් 14 | 1955 | 0.001 | 5,163,000 |
| ලැත්වියාව | සැප්තැම්බර් 17 | 1991 | 0.017 | 2,449,000 |
| ලෙබනොන් | ඔක්තෝබර් 24 | 1945 | 0.016 | 3,191,000 |
| ලෙසෝතෝ | ඔක්තෝබර් 17 | 1966 | 0.002 | 2,062,000 |
| ලයිබීරියාව | නොවැම්බර් 02 | 1945 | 0.002 | 2,062,000 |
| ලිබියානු අරාබි ජමහිරියා | දෙසැම්බර් 14 | 1955 | 0.124 | 5,339,000 |
| ලීච්ටන්ස්ටයින් | සැප්තැම්බර් 18 | 1990 | 0.006 | 32,000 |
| ලිතුවේනියාව | සැප්තැම්බර් 17 | 1991 | 0.015 | 3,072,000 |
| ලක්සම්බර්ග් | ඔක්තෝබර් 24 | 1945 | 0.068 | 426,000 |
| මැඩගස්කර් | සැප්තැම්බර් 20 | 1960 | 0.003 | 15,057,000 |
| මලාවි | දෙසැම්බර් 01 | 1964 | 0.002 | 10,346,000 |
| මැලේසියාව | සැප්තැම්බර් 17 | 1957 | 0.183 | 22,179,000 |
| මාලදිවයින් | සැප්තැම්බර් 21 | 1965 | 0.001 | 271,000 |
| මාලි | සැප්තැම්බර් 28 | 1960 | 0.002 | 10,694,000 |
| මෝල්ටාව | දෙසැම්බර් 01 | 1964 | 0.014 | 377,000 |
| මාෂල් දූපත් | සැප්තැම්බර් 17 | 1991 | 0.001 | 63,000 |
| මොරිතානියාව | ඔක්තෝබර් 27 | 1961 | 0.001 | 2,529,000 |
| මුරුසිය | අප්‍රේල් 24 | 1968 | 0.009 | 1,159,000 |

| සාමාජික රාජ්‍යය | ඇතුළත් වූ දිනය | | තක්සේරු පරිමාණය (2000 ප්‍රතිශතය) | ජනගහනය 2000 |
|---|---|---|---|---|
| මෙක්සිකෝව | නොවැම්බර් 07 | 1945 | 0.995 | 95,831,000 |
| මොනාකෝ | මැයි 28 | 1993 | 0.004 | 33,000 |
| මොංගෝලියාව | ඔක්තෝබර් 27 | 1961 | 0.002 | 2,403,000 |
| මොරොක්කෝව | නොවැම්බර් 12 | 1956 | 0.041 | 27,775,000 |
| මොසැම්බික් | සැප්තැම්බර් 16 | 1975 | 0.001 | 16,916,000 |
| මියැන්මාර් | අප්‍රේල් 19 | 1948 | 0.008 | 44,497,000 |
| නැමීබියාව | අප්‍රේල් 23 | 1990 | 0.007 | 1,666,000 |
| නාඋරු | සැප්තැම්බර් 14 | 1999 | 0.001 | 11,000 |
| නේපාලය | දෙසැම්බර් 14 | 1955 | 0.004 | 21,843,000 |
| නෙදර්ලන්තය | දෙසැම්බර් 10 | 1945 | 1.632 | 15,707,000 |
| නවසීලන්තය | ඔක්තෝබර් 24 | 1945 | 0.221 | 3,790,000 |
| නිකරගුවා | ඔක්තෝබර් 24 | 1945 | 0.001 | 4,807,000 |
| නයිජර් | සැප්තැම්බර් 20 | 1960 | 0.002 | 10,078,000 |
| නයිජීරියාව | ඔක්තෝබර් 07 | 1960 | 0.032 | 106,409,000 |
| නෝර්වේ | නොවැම්බර් 27 | 1945 | 0.610 | 4,431,000 |
| ඕමානය | ඔක්තෝබර් 07 | 1971 | 0.051 | 2,287,000 |
| පාකිස්ථානය | සැප්තැම්බර් 30 | 1947 | 0.059 | 148,166,000 |
| පාලවු | දෙසැම්බර් 15 | 1994 | 0.001 | 19,000 |
| පැනමාව | නොවැම්බර් 13 | 1945 | 0.007 | 2,763,000 |
| පැපුවා නිව්ගිනි | ඔක්තෝබර් 10 | 1975 | 0.007 | 4,600,000 |
| පැරගුවේ | ඔක්තෝබර් 24 | 1945 | 0.014 | 5,208,000 |
| පීරූ | ඔක්තෝබර් 31 | 1945 | 0.099 | 24,800,000 |
| පිලිපීනය | ඔක්තෝබර් 24 | 1945 | 0.081 | 75,154,000 |
| පෝලන්තය | ඔක්තෝබර් 24 | 1945 | 0.196 | 38,671,000 |
| පෘතුගාලය | දෙසැම්බර් 14 | 1955 | 0.431 | 9,957,000 |
| කටාර් | සැප්තැම්බර් 21 | 1971 | 0.033 | 543,000 |
| කොරියානු ජනරජය | සැප්තැම්බර් 17 | 1991 | 1.006 | 46,429,000 |
| මොල්දාවා ජනරජය | මාර්තු 02 | 1992 | 0.010 | 3,652,000 |
| රුමේනියාව | දෙසැම්බර් 14 | 1955 | 0.056 | 22,502,000 |
| රුසියානු ෆෙඩරේෂනය | ඔක්තෝබර් 24 | 1945 | 1.077 | 147,739,000 |
| රුවන්ඩාව | සැප්තැම්බර් 18 | 1962 | 0.001 | 6,604,000 |
| සාන්ත කිට්ස් සහ නෙවිස් | සැප්තැම්බර් 23 | 1983 | 0.001 | 39,000 |
| ශාන්ත ලූෂියා | සැප්තැම්බර් 18 | 1979 | 0.001 | 151,000 |
| ශාන්ත වින්සන්ට් සහ ග්‍රෙනඩයින්ස් | සැප්තැම්බර් 16 | 1980 | 0.001 | 112,000 |
| සැමෝවා | දෙසැම්බර් 15 | 1976 | 0.001 | 168,000 |
| සැන්මරිනෝ | මාර්තු 02 | 1992 | 0.002 | 26,000 |
| සාඕ තෝමේ සහ ප්‍රින්සිපේ | සැප්තැම්බර් 16 | 1975 | 0.001 | 141,000 |

| *සාමාජික රාජ්‍යය* | *ඇතුළත් වූ දිනය* | | *තක්සේරු පරිමාණය (2000 ප්‍රතිශතය)* | *ජනගහනය 2000* |
|---|---|---|---|---|
| සවුදි අරාබිය | ඔක්තෝබර් 24 | 1945 | 0.562 | 20,181,000 |
| සෙනෙගාල් | සැප්තැම්බර් 28 | 1960 | 0.006 | 9,037,000 |
| සීෂෙල්ස් | සැප්තැම්බර් 21 | 1976 | 0.002 | 78,000 |
| සියරාලියොන් | සැප්තැම්බර් 27 | 1961 | 0.001 | 4,568,000 |
| සිංගප්පූරුව | සැප්තැම්බර් 21 | 1965 | 0.179 | 3,865,000 |
| ස්ලෝවැකියාව | ජනවාරි 19 | 1993 | 0.035 | 5,390,000 |
| ස්ලෝවීනියාව | මැයි 22 | 1992 | 0.061 | 1,993,000 |
| සොලමන් දූපත් | සැප්තැම්බර් 19 | 1978 | 0.001 | 417,000 |
| සෝමාලියාව | සැප්තැම්බර් 20 | 1960 | 0.001 | 9,237,000 |
| දකුණු අප්‍රිකාව | නොවැම්බර් 07 | 1945 | 0.366 | 39,357,000 |
| ස්පාඤ්ඤය | දෙසැම්බර් 14 | 1955 | 2.591 | 39,371,000 |
| ශ්‍රී ලංකාව | දෙසැම්බර් 14 | 1955 | 0.012 | 18,774,000 |
| සුඩානය | නොවැම්බර් 12 | 1956 | 0.007 | 28,292,000 |
| සුරිනෑමය | දෙසැම්බර් 04 | 1975 | 0.004 | 414,000 |
| ස්වාසිලන්තය | සැප්තැම්බර් 24 | 1968 | 0.002 | 952,000 |
| ස්වීඩනය | නොවැම්බර් 19 | 1946 | 1.079 | 8,854,000 |
| ස්විට්සර්ලන්තය | සැප්තැම්බර් 10 | 2002 | 1.215 | - |
| සිරියානු අරාබි ජනරජය | ඔක්තෝබර් 24 | 1945 | 0.064 | 15,597,000 |
| තජිකිස්තානය | මාර්තු 02 | 1992 | 0.004 | 6,103,000 |
| තායිලන්තය | දෙසැම්බර් 14 | 1946 | 0.170 | 61,201,000 |
| මැසිඩෝනියා පැරණි යුගොස්ලාවියා ජනරජය | අප්‍රේල් 08 | 1993 | 0.004 | 1,999,000 |
| ටෝගෝ | සැප්තැම්බර් 20 | 1960 | 0.001 | 4,397,000 |
| ටොංගා | සැප්තැම්බර් 14 | 1999 | 0.001 | 98,000 |
| ට්‍රිනිඩෑඩ් සහ ටොබාගෝ | සැප්තැම්බර් 18 | 1962 | 0.016 | 1,283,000 |
| ටියුනිසියාව | නොවැම්බර් 12 | 1956 | 0.028 | 9,332,000 |
| තුර්කිය | ඔක්තෝබර් 24 | 1945 | 0.440 | 63,451,000 |
| තුර්ක් මේනිස්තානය | මාර්තු 02 | 1992 | 0.006 | 4,858,000 |
| තුවාලු | සැප්තැම්බර් 05 | 2000 | - | 10,000 |
| ටිමෝර් ලෙස්ටේ | සැප්තැම්බර් 27 | 2002 | - | - |
| උගන්ඩාව | ඔක්තෝබර් 25 | 1962 | 0.004 | 21,029,000 |
| යුක්රේනය | ඔක්තෝබර් 24 | 1945 | 0.190 | 50,499,000 |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | දෙසැම්බර් 09 | 1971 | 0.178 | 2,724,000 |
| එක්සත් රාජධානිය | ඔක්තෝබර් 24 | 1945 | 5.092 | 58,649,000 |
| තන්සානියා එක්සත් ජනරජය | දෙසැම්බර් 14 | 1961 | 0.003 | 32,102,000 |
| ඇමරිකා එක්සත් ජනපදය | ඔක්තෝබර් 24 | 1945 | 25.000 | 270,561,000 |
| උරුගුවේ | දෙසැම්බර් 18 | 1945 | 0.048 | 3,289,000 |
| උස්බෙකිස්ථානය | මාර්තු 02 | 1992 | 0.025 | 24,050,000 |

| සාමාජික රාජ්‍යය | ඇතුළත් වූ දිනය | තක්සේරු පරිමාණය (2000 ප්‍රතිශතය) | ජනගහනය 2000 |
|---|---|---|---|
| වනුවාතු | සැප්තැම්බර් 15 1981 | 0.001 | 182,000 |
| වෙනසියුලාව | නොවැම්බර් 15 1945 | 0.160 | 23,436,000 |
| වියට්නාමය | සැප්තැම්බර් 20 1977 | 0.007 | 76,325,000 |
| යේමනය | සැප්තැම්බර් 30 1947 | 0.010 | 17,071,000 |
| යුගෝස්ලාවියාව | නොවැම්බර් 01 2000 | 0.026 | 10,615,000 |
| සැම්බියාව | දෙසැම්බර් 01 1964 | 0.002 | 8,781,000 |
| සිම්බාබ්වේ | අගෝස්තු 25 1980 | 0.009 | 12,684,000 |

## අතීත සහ වත්මන් සාම සාධක මෙහෙයුම්
**(2004 ජූලි වනවිට)**

*UNTSO
එක්සත් ජාතීන්ගේ යුධ විරාම නිරීක්ෂණ සංවිධානය. (ජෙරුසෙලම) 1948 ජූනි

*UNMOGIP
ඉන්දියාවේ සහ පාකිස්තානයේ එක්සත් ජාතීන්ගේ යුධ නිරීක්ෂණ කණ්ඩායම. 1949 ජනවාරි

UNEF I
එක්සත් ජාතීන්ගේ පළමුවැනි හදිසි බලකාය. (ඝාසා) 1956 නොවැම්බර් සිට 1967 ජූනි

UNOGIL
ලෙබනනයේ එක්සත් ජාතීන්ගේ නිරීක්ෂණ කණ්ඩායම 1958. ජූනි සිට දෙසැම්බර්

ONUC
කොංගෝවේ එක්සත් ජාතීන්ගේ මෙහෙයුම. 1960 ජූලි සිට 1964 ජූනි

UNSF
බටහිර නිව්ගිනිහි එක්සත් ජාතීන්ගේ ආරක්ෂක බලකාය. (බටහිර ඉරියාන්) 1962 ඔක්තෝබර් සිට 1963 අප්‍රේල්

UNYOM
එක්සත් ජාතීන්ගේ යේමන නිරීක්ෂණ දූත මෙහෙවර. 1963 ජූලි සිට 1964 සැප්තැම්බර්

UNFICYP
සයිප්‍රසයේ එක්සත් ජාතීන්ගේ සාම සාධක බලකාය. 1964 මාර්තු

DOMREP
මහ ලේකම්වරයාගේ නියෝජිතයාගේ ඩොමිනිකානු ජනරජයේ දූත මෙහෙවර. 1965 මැයි සිට 1966 ඔක්තෝබර්

UNIPOM
එක්සත් ජාතීන්ගේ ඉන්දියා - පාකිස්ථාන නිරීක්ෂණ දූත මෙහෙවර. 1965 සැප්තැම්බර් සිට 1966 මාර්තු

UNEF II
එක්සත් ජාතීන්ගේ දෙවැනි හදිසි බලකාය (සූවස් ඇල සහ පසුව සිනායි අර්ධද්වීපය) 1973 ඔක්තෝබර් සිට 1979 ජූලි දක්වා

*UNDOF
එක්සත් ජාතීන්ගේ කාර්ය වියුක්ත නිරීක්ෂණ බලකාය (සිරියානු ගෝලාන් කඳුකරය). 1974 ජුනි

*UNIFIL
ලෙබනොන් හි එක්සත් ජාතීන්ගේ අන්තර්කාලීන බලකාය. 1978 මාර්තු

UNGOMAP
ඇෆ්ගනිස්ථානයේ හා පාකිස්ථානයේ එක්සත් ජාතීන්ගේ සද් දූත මෙහෙවර. 1988 මැයි සිට 1990 මාර්තු

UNIIMOG
එක්සත් ජාතීන්ගේ ඉරාන-ඉරාක යුධ නිරීක්ෂණ කණ්ඩායම. 1988 අගෝස්තු සිට 1991 පෙබරවාරි

UNAVEM I
එක්සත් ජාතීන්ගේ ඇන්ගෝලා විමර්ශන දූත මෙහෙවර I. 1989 ජනවාරි සිට 1991 ජුනි

UNTAG
එක්සත් ජාතීන්ගේ සංක්‍රාන්ති සහාය කණ්ඩායම. (නැමීබියාව සහ ඇන්ගෝලාව) 1989 අප්‍රේල් සිට 1990 මාර්තු

ONUCA
මධ්‍යම ඇමරිකාවේ එක්සත් ජාතීන්ගේ නිරීක්ෂණ කණ්ඩායම. 1989 නොවැම්බර් සිට 1992 ජනවාරි

*UNIKOM
එක්සත් ජාතීන්ගේ ඉරාක-කුවේට් නිරීක්ෂණ දූත මෙහෙවර. 1991 අප්‍රේල්

UNAVEM II
එක්සත් ජාතීන්ගේ ඇංගෝලා විමර්ශන දූත මෙහෙවර II. 1991 ජූනි සිට 1995 පෙබරවාරි

ONSUSAL
එල් සැල්වදෝරයේ එක්සත් ජාතීන්ගේ නිරීක්ෂණ දූත මෙහෙවර. 1991 ජූලි සිට 1995 අප්‍රේල්

* MINURSO
බටහිර සහරාවේ ජනමත විචාරණය සඳහා එක්සත් ජාතීන්ගේ දූත මෙහෙවර. 1991 අප්‍රේල්

UNAMIC
කාම්බෝජයේ එක්සත් ජාතීන්ගේ ඉදිරි දූත මෙහෙවර. 1991 ඔක්තෝබර් සිට 1992 මාර්තු

UNPROFOR
එක්සත් ජාතීන්ගේ ආරක්ෂක බලකාය (පැරණි යුගෝස්ලාවියාව). 1992 මාර්තු සිට 1995 දෙසැම්බර්

UNTAC
කාම්බෝජයේ එක්සත් ජාතීන්ගේ අන්තර්කාලීන අධිකාරිය. 1992 මාර්තු සිට 1993 සැප්තැම්බර්

UNOSOM I
සෝමාලියාවේ එක්සත් ජාතීන්ගේ මෙහෙයුම I. 1992 අප්‍රේල් සිට 1992 මාර්තු

ONUMOZ
මොසැම්බික් හි එක්සත් ජාතීන්ගේ මෙහෙයුම. 1992 දෙසැම්බර් සිට 1994 දෙසැම්බර්

UNOSOM II
සෝමාලියාවේ එක්සත් ජාතීන්ගේ මෙහෙයුම. II 1993 මාර්තු සිට 1995 මාර්තු

UNOMUR
එක්සත් ජාතීන්ගේ උගන්ඩා-රුවන්ඩා නිරීක්ෂණ දූත මෙහෙවර. 1993 ජූනි සිට 1994 සැප්තැම්බර්

*UNOMIG
ජෝර්ජියාවේ එක්සත් ජාතීන්ගේ දූත මෙහෙවර. 1993 අගෝස්තු

UNOMIL
ලයිබීරියාවේ එක්සත් ජාතීන්ගේ නිරීක්ෂණ දූත මෙහෙවර. 1993 සැප්තැම්බර් සිට 1997 සැප්තැම්බර්

UNMIH
හයිති රාජ්‍යයේ එක්සත් ජාතීන්ගේ දූත මෙහෙවර. 1993 සැප්තැම්බර් සිට 1996 ජුනි

UNAMIR
රුවන්ඩාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ සහාය දූත මෙහෙවර. 1993 ඔක්තෝබර් සිට 1996 මාර්තු

UNASOG
එක්සත් ජාතීන්ගේ අවුසෝ තීරයේ නිරීක්ෂක කණ්ඩායම (චාඩ්/ලිබියා). 1994 මැයි-ජුනි

UNMOT
තජිකිස්ථානයේ එක්සත් ජාතීන්ගේ නිරීක්ෂණ දූත මෙහෙවර. 1994 දෙසැම්බර් සිට 2000 මැයි

UNAVEM III
එක්සත් ජාතීන්ගේ ඇංගෝලා විමර්ශන දූත මෙහෙවර III. 1995 පෙබරවාරි සිට 1997 ජුනි දක්වා

UNCRO
ක්‍රොඒෂියාව තුල විශ්වාසය තහවුරු කිරීමේ එක්සත් ජාතීන්ගේ මෙහෙයුම. 1995 මාර්තු සිට 1996 ජනවාරි

UNPREDEP
එක්සත් ජාතීන්ගේ නිවාරණීය කාර්ය නියුක්ත බලකාය (මැසිඩෝනියා පැරණි යුගොස්ලාවි ජනරජය). 1995 මාර්තු සිට 1999 පෙබරවාරි

UNMIBH
බොස්නියා හා හර්සෙගොවිනාහි එක්සත් ජාතීන්ගේ දූත මෙහෙවර. 1995 දෙසැම්බර් සිට 2002 දෙසැම්බර්

UNTAES
නැගෙනහිර ස්ලෝවීනියාව බරන්ජා සහ බටහිර සිර්මියම්
(ක්‍රොඒෂියාව) සඳහා එක්සත් ජාතීන්ගේ අන්තර්කාලීන පරිපාලනය (ක්‍රොඒෂියාව). 1996 ජනවාරි සිට 1998 ජනවාරි

UNMOP

ප්‍රිවලකාහි එක්සත් ජාතීන්ගේ නිරීක්ෂණ දූත මෙහෙවර. 1996 ජනවාරි සිට 2002 දෙසැම්බර්

UNSMIH

හයිති රාජ්‍යයේ එක්සත් ජාතීන්ගේ උපකාරක දූත මෙහෙවර. 1996 ජූලි සිට 1997 ජූලි

MINUGUA

ගුවාතමාලා හි එක්සත් ජාතීන්ගේ විමර්ශන දූත මෙහෙවර. 1997 ජනවාරි - මැයි

MONUA

ඇංගෝලාවේ එක්සත් ජාතීන්ගේ නිරීක්ෂණ දූත මෙහෙවර. 1997 අගෝස්තු - නොවැම්බර්

UNTMIH

හයිතිහි එක්සත් ජාතීන්ගේ සංක්‍රාන්ති මෙහෙවර. 1997 අගෝස්තු - නොවැම්බර්

MIPONUH

හයිති රාජ්‍යයේ එක්සත් ජාතීන්ගේ සිවිල් පොලිස් දූත මෙහෙවර. 1997 දෙසැම්බර් සිට 2000 මාර්තු

UNPSG

එක්සත් ජාතීන්ගේ පොලිස් උපකාරක කණ්ඩායම (ක්‍රොඒෂියාව).
1998 ජනවාරි - ඔක්තෝබර්

MINURCA

මධ්‍යම අප්‍රිකානු ජනරජයේ එක්සත් ජාතීන්ගේ දූත මෙහෙවර. 1998 අප්‍රේල් සිට 2000 ඔක්තෝබර්

UNOMSIL

සියෙරා ලියොන්හි එක්සත් ජාතීන්ගේ නිරීක්ෂණ දූත මෙහෙවර. 1998 ජූලි සිට 1999 ඔක්තෝබර්

*UNMIK

කොසෝවෝ හි එක්සත් ජාතීන්ගේ අන්තර්කාලීන පරිපාලන දූත මෙහෙවර. 1999 ජුනි

*UNAMSIL

සියෙරා ලියොන්හි එක්සත් ජාතීන්ගේ දූත මෙහෙවර. 1999 ඔක්තෝබර්

UNTAET
නැගෙනහිර තිමෝරයේ එක්සත් ජාතීන්ගේ අන්තර්කාලීන පරිපාලනය. 1999 ඔක්තෝබර් සිට 2002 මැයි

*MONUC
කොංගෝ ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ එක්සත් ජාතීන්ගේ නිරීක්ෂණ දූත මෙහෙවර. 1999 දෙසැම්බර්

*UNMEE
ඉතියෝපියාවේ සහ එරිත්‍රියාවේ එක්සත් ජාතීන්ගේ දූත මෙහෙවර. 2000 ජූලි

*UNMISET
නැගෙනහිර තිමෝරයේ එක්සත් ජාතීන්ගේ සහාය දූත මෙහෙවර 2002 මැයි

*UNMIL
ලයිබීරියාවේ එක්සත් ජාතීන්ගේ දූත මෙහෙවර, 2003 සැප්තැම්බර්

*MINUSTAH
හයිතිහි එක්සත් ජාතීන්ගේ ස්ථායිකරණ දූත මෙහෙවර 2004 අප්‍රේල්

*ONUB
බුරුන්ඩි හි එක්සත් ජාතීන්ගේ මෙහෙයුම - 2004 මැයි

***2004 ජූලි වන විට ක්‍රියාත්මකව පැවැති මෙහෙයුම්**

## එක්සත් ජාතීන්ගේ විශේෂ අන්තර්ජාතික දශක සහ වර්ෂ

| | |
|---|---|
| 1993-2002 | දෙවැනි අප්‍රිකානු කර්මාන්ත සංවර්ධන දශකය |
| 1993-2002 | ආබාධිත පුද්ගලයන් පිළිබඳ ආසියා ශාන්තිකර දශකය |
| 1993-2003 | වර්ගවාදය සහ වාර්ගික වෙනස්කම් පිටුදැකීමේ තුන්වැනි දශකය |
| 1994-2004 | ලෝක ආදිවාසී ජනයාගේ අන්තර්ජාතික දශකය |
| 1995-2004 | මානව අයිතිවාසිකම් අධ්‍යාපනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ දශකය |
| 1997-2006 | දිළිඳුකම පිටුදැකීමේ එක්සත් ජාතීන්ගේ දශකය |
| 2001-2010 | යටත්විජිතවාදය තුරන් කිරීමේ දෙවැනි අන්තර්ජාතික දශකය |
| 2001-2010 | ලෝකයේ ළමයින් උදෙසා සාම සංස්කෘතිය සහ අහිංසාව පිළිබඳ අන්තර්ජාතික දශකය |

| | |
|---|---|
| 2001 | අන්තර්ජාතික ස්වෙච්ඡා සේවක වර්ෂය |
| 2001 | ශිෂ්ඨාචාර අතර සංවාදය සඳහා එක්සත් ජාතීන්ගේ වර්ෂය |
| 2001 | වර්ගවාදය, වාර්ගික වෙනස්කම්, විජාතික භීතිකාව සහ ආශ්‍රිත අසහනශීලීතාව පිටුදැකීමේ අන්තර්ජාතික වර්ෂය |
| 2002 | කඳු පිළිබඳ අන්තර්ජාතික වර්ෂය |
| 2002 | පරිසර සංචාරක කර්මාන්තය පිළිබඳ අන්තර්ජාතික වර්ෂය |
| 2003 | අන්තර්ජාතික මිරිදිය වර්ෂය |
| 2004 | අන්තර්ජාතික සහල් වර්ෂය |
| 2004 | වහල්භාවයට එරෙහි අරගලය හා එය අහෝසිකිරීම සැමරීමේ අන්තර්ජාතික වර්ෂය |
| 2005 | සුළු ණය පිළිබඳ අන්තර්ජාතික වර්ෂය |

## වාර්ෂික දින සහ සති

| | |
|---|---|
| මාර්තු 08 | ස්ත්‍රී අයිතිවාසිකම් සහ අන්තර්ජාතික සාමය සඳහා එක්සත් ජාතීන්ගේ දිනය |
| මාර්තු 21 | වාර්ගික වෙනස්කම් පිටුදැකීමේ අන්තර්ජාතික දිනය |
| මාර්තු 21න් ආරම්භ වන | වර්ග වාදයට සහ වාර්ගික වෙනස්කමට එරෙහිව අරගල කරන ජනතාව සමඟ සහයෝගිතා සතිය |
| මාර්තු 22 | ලෝක ජල දිනය |
| මැයි 03 | පුවත්පත් නිදහස පිළිබඳ ලෝක දිනය |
| මැයි 15 | අන්තර්ජාතික පවුල් දිනය |
| මැයි 22 | අන්තර්ජාතික ජෛව විවිධත්ව දිනය |
| මැයි 25න් ආරම්භ වන | ස්වයංපාලනය රහිත භූමි ප්‍රදේශවල ජනයා සමග සහයෝගිතා සතිය |
| ජුනි 04 | ආක්‍රමණයට ගොදුරු වූ අහිංසක ළමයින්ගේ අන්තර් ජාතික දිනය |
| ජුනි 05 | ලෝක පරිසර දිනය |
| ජුනි 17 | කාන්තාරකරණය සහ නියඟය පිටුදැකීමේ ලෝක දිනය |
| ජුනි 20 | සරණාගතයන්ගේ ලෝක දිනය |
| ජුනි 26 | මත්ද්‍රව්‍ය භාවිතය සහ නීතිවිරෝධී ප්‍රවාහනය පිටුදැකීමේ අන්තර්ජාතික දිනය |
| ජුනි 26 | වද හිංසාවන්ට ගොදුරුවූවන් සඳහා අන්තර්ජාතික සහයෝගිතා දිනය |
| ජූලි පළමුවැනි සෙනසුරාදා | අන්තර්ජාතික සමුපකාර දිනය |
| ජූලි 11 | ලෝක ජනගහන දිනය |
| අගෝස්තු 09 | ලෝක ආදිවාසී ජනයාගේ අන්තර්ජාතික දිනය |

| | |
|---|---|
| අගෝස්තු 12 | අන්තර්ජාතික යොවුන් දිනය |
| සැප්තැම්බර් 16 | ඕසෝන් ස්ථරය රැක ගැනීමේ අන්තර්ජාතික දිනය |
| සැප්තැම්බර් 21 | අන්තර්ජාතික සාම දිනය |
| ඔක්තෝබර් 01 | අන්තර්ජාතික වැඩිහිටි දිනය |
| ඔක්තෝබර් පළමුවැනි සඳුදා | ලෝක ජනාවාස දිනය |
| ඔක්තෝබර් දෙවැනි බදාදා | ස්වාභාවික විපත් අඩු කිරීමේ අන්තර්ජාතික දිනය |
| ඔක්තෝබර් 4-10 | ලෝක අභ්‍යවකාශ සතිය |
| ඔක්තෝබර් 16 | ලෝක ආහාර දිනය |
| ඔක්තෝබර් 17 | දිළිඳුකම පිටුදැකීමේ අන්තර්ජාතික දිනය |
| ඔක්තෝබර් 24 | එක්සත් ජාතීන්ගේ දිනය |
| ඔක්තෝබර් 24-30 | නිරායුධකරණ සතිය |
| නොවැම්බර් 16 | අන්තර්ජාතික සහනශීලතා දිනය |
| නොවැම්බර් 20 | අප්‍රිකා කාර්මිකරණ දිනය |
| නොවැම්බර් 21 | ලෝක රූපවාහිනී දිනය |
| නොවැම්බර් 25 | ස්ත්‍රීනට එරෙහි ප්‍රචණ්ඩත්වය පිටුදැකීමේ අන්තර්ජාතික දිනය |
| නොවැම්බර් 29 | පලස්තීන ජනතාව සමඟ අන්තර්ජාතික සහයෝගිතා දිනය |
| දෙසැම්බර් 01 | ලෝක ඒඩ්ස් දිනය |
| දෙසැම්බර් 02 | වහල්භාවය අහෝසි කිරීම පිළිබඳ අන්තර්ජාතික දිනය |
| දෙසැම්බර් 03 | ආබාධිත පුද්ගලයන්ගේ අන්තර්ජාතික දිනය |
| දෙසැම්බර් 10 | මානව අයිතිවාසිකම් දිනය |
| දෙසැම්බර් 18 | සංක්‍රමණිකයන්ගේ අන්තර්ජාතික දිනය |

**වෙනත් අන්තර්ජාතික දින**
**(එක්සත් ජාතීන්ගේ පද්ධතිය ඇතුලත පිළිපදිනු ලබන වෙනත් අන්තර්ජාතික දින මීට ඇතුලත්ය)**

| | |
|---|---|
| පෙබරවාරි 21 | අන්තර්ජාතික මවු භාෂා දිනය |
| මාර්තු 23 | ලෝක කාලගුණ විද්‍යා දිනය |
| අප්‍රේල් 07 | ලෝක සෞඛ්‍ය දිනය |
| අප්‍රේල් 23 | පොත් සහ ප්‍රකාශන අයිතිවාසිකම් පිළිබඳ ලෝක දිනය |
| මැයි 17 | ලෝක විදුලි සන්දේශ සේවා දිනය |
| මැයි 31 | ලෝක දුම්කොල විරෝධී දිනය |
| අගෝස්තු 23 | වහල් වෙළෙඳාම සහ එය අහෝසි කිරීම සැමරීමේ අන්තර්ජාතික දිනය |
| සැප්තැම්බර් 08 | අන්තර්ජාතික සාක්ෂරතා දිනය |

| | |
|---|---|
| සැප්තැම්බර් අවසන් සතිය | ලෝක සමුද්‍ර ප්‍රවාහන දිනය |
| ඔක්තෝබර් 05 | ලෝක ගුරු දිනය |
| ඔක්තෝබර් 09 | ලෝක තැපැල් දිනය |
| ඔක්තෝබර් 10 | ලෝක මානසික සෞඛ්‍ය දිනය |
| ඔක්තෝබර් 24 | ලෝක සංවර්ධන සන්නිවේදන දිනය |
| නොවැම්බර් 20 (වෙනස් වෙයි) | විශ්ව ළමා දිනය |
| දෙසැම්බර් 05 | ආර්ථික හා සමාජයීය සංවර්ධනය සඳහා අන්තර්ජාතික ස්වේච්ඡා සේවක දිනය |
| දෙසැම්බර් 07 | අන්තර්ජාතික සිවිල් ගුවන් සේවා දිනය |